# 2 වැනි පරිච්ඡේදය

# ජාතික නිෂ්පාදිතය හා වියදම







## 2.1 සමස්ත නිරීක්ෂණ

2007 වසරේ වාර්තා වූ සියයට 6.8 ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව ශ්‍රී ලංකා ආර්ථිකය 2008 තුළ දී මූර්ත වශයෙන් සියයට 6.0 කින් ප්‍රසාරණය විය. මෙය සියයට 6.0 කින් හෝ ඊට වඩා වැඩි අනුපාතයකින් ආර්ථිකය වර්ධනය වූ සිව්වන වර්ෂය විය. 2008 වසරේ පළමු මාස 9 තුළ සියයට 6.5 ක කැපී පෙනෙන ආර්ථික වර්ධනයක් වාර්තා කළ ද, ප්‍රධාන වශයෙන් විදේශීය අංශයේ අයහපත් ප්‍රවණතා මත වසරේ සිව්වන කාර්තුව තුළ එම වර්ධනය සියයට 4.3 දක්වා පහළ වැටිණි.

ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනම වසරේ පළමු මාස 9 තුළ ආර්ථික වර්ධනයට දායක වී ඇති බව පෙනේ. ප්‍රධාන වශයෙන් යල කන්නය තුළ අත්කර ගත් වාර්තාගත ඉහළ වී අස්වැන්න හා තේ නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වීම හේතු කොටගෙන කෘෂිකාර්මික අංශය සියයට 8.5 ක සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. කර්මාන්ත අංශය එහි විශාලතම උප අංශය වන නිෂ්පාදන කර්මාන්තයන්හි සියයට 4.8 ක ප්‍රසාරණයක් සමඟ සියයට 6.2 කින් වර්ධනය විය. සේවා අංශය ද එහි වැඩිම දායකත්වයක් එක් කළ තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම් උප අංශයේ සියයට 5.6 ක වර්ධනයක් සහිතව 2008 වසරේ පළමු මාස 9 තුළ සියයට 6.3 කින් වර්ධනය විය.

වසරේ සිව්වන කාර්තුව තුළ විශේෂයෙන්ම තේ සහ සුළු අපනයන භෝග නිෂ්පාදනයන්හි වූ සංකෝචනයත් සමඟ කෘෂිකාර්මික අංශයේ වර්ධනය සියයට 4.0 දක්වා පහළ යමින් ආර්ථිකය මන්දගාමී විය. උප අංශ හතරෙහිම එනම්, පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලිබල, ගෑස් හා ජල සහ ඉදිකිරීම් අංශවල පසුබෑමත් සමඟ කාර්මික අංශයේ වර්ධනය සියයට 5.2 දක්වා අඩු වී ඇති බව පෙනේ. තොග වෙළෙඳ හා සිල්ලර වෙළෙඳ උප අංශය සියයට 2.0 දක්වා පහළ යාමත් සමඟ සිව් වන කාර්තුව තුළ සේවා අංශයේ වර්ධනය සියයට 3.8 දක්වා අඩු විය. මේ අඩු වීමට අපනයන උප අංශය සියයට 0.9 දක්වා සහ ආනයන අංශය සියයට 0.7 දක්වා සංකෝචනය වීම හේතු විය.

**2008 වසරේ සමස්ත වර්ධනයට ආර්ථිකයේ සියලුම අංශ හිතකර ලෙස දායක වී ඇත.** වාර්තාගත වී අස්වැන්න සහ ධීවර හා තේ නිෂ්පාදන සැලකිය යුතු ලෙස ඉහළ යාමත් සමඟ කෘෂිකාර්මික අංශය සියයට 7.5 ක ඉහළම ආංශික වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික හා සේවා අංශ පිළිවෙලින් සියයට 5.9 කින් හා සියයට 5.6 කින් වර්ධනය වුවද, 2007 වසරට සාපේක්ෂව මන්දගාමී විය. කර්මාන්තශාලා නිෂ්පාදන සහ ඉදිකිරීම් අංශ ද ඇතුළත්ව කර්මාන්ත අංශයේ සියලු උප අංශවල වර්ධනයන් අඩු වීම දක්නට ලැබිණි. ආර්ථිකයේ විශාලතම කොටස වන සේවා අංශයේ දායකත්වය 2007 වසරට සාපේක්ෂව ආන්තික අඩු වීමක් පෙන්වන ලදී. 2007 වසරට සාපේක්ෂව ඉහළ අනුපාතිකයකින් ප්‍රසාරණය වූ ආනයන වෙළෙඳාම සහ තැපැල් හා සංනිවේදන උප අංශ හැරෙන්නට, සැලකිය යුතු ලෙස සංකෝචනය වූ හෝටල් සහ ආපනශාලා උප අංශය ද ඇතුළත්ව සේවා අංශයේ බොහෝ උප අංශවල වර්ධනය මන්දගාමී විය.

**පරිභෝජනය හා ආයෝජනය සඳහා වූ ඉල්ලුම තුළින් වේගවත් වූ දේශීය ඉල්ලුම සියයට 7.1 කින් වර්ධනය විය.** සියයට 0.4 තරම් අඩු වේගයකින් වර්ධනය වූ

**2.1 සංඛ්‍යා සටහන** **කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(ආ) | 2007(අ) | 2008(ආ) | 2007(අ) | 2008(ආ) |
| **කෘෂිකාර්මික** | **3.4** | **7.5** | **6.1** | **15.1** | **11.9** | **12.1** |
| **1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය** | **2.3** | **7.3** | **3.8** | **13.2** | **10.8** | **10.9** |
| 1.1 තේ | - 1.8 | 4.3 | - 0.3 | 0.9 | 1.2 | 1.2 |
| 1.2 රබර් | 4.2 | 10.3 | 0.1 | 0.4 | 0.2 | 0.2 |
| 1.3 පොල් | 5.1 | 5.2 | 1.0 | 1.2 | 1.4 | 1.4 |
| 1.4 සුළු අපනයන බෝග | 5.1 | - 2.1 | 0.4 | - 0.2 | 0.5 | 0.4 |
| 1.5 වී | - 6.2 | 22.9 | - 1.7 | 6.1 | 1.6 | 1.8 |
| 1.6 පශු සම්පත් | 7.9 | 5.6 | 1.0 | 0.8 | 0.9 | 0.9 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 4.4 | 4.7 | 2.5 | 3.0 | 3.8 | 3.8 |
| 1.8 වතු සංවර්ධනය | 5.8 | 3.5 | 0.2 | 0.2 | 0.3 | 0.3 |
| 1.9 දැව සහ වන සම්පත් | 5.1 | 7.1 | 0.5 | 0.7 | 0.6 | 0.6 |
| 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 0.7 | 2.7 | 0.0 | 0.2 | 0.4 | 0.4 |
| **2 ධීවර කර්මාන්තය** | **15.6** | **9.9** | **2.3** | **1.8** | **1.1** | **1.1** |
| **කාර්මික** | **7.6** | **5.9** | **31.6** | **28.3** | **28.5** | **28.4** |
| **3 පතල් සහ කැනීම්** | **19.2** | **12.8** | **4.8** | **4.1** | **1.9** | **2.0** |
| **4 නිෂ්පාදන කර්මාන්ත** | **6.4** | **4.9** | **16.8** | **14.6** | **17.7** | **17.5** |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 2.4 | 5.3 | 0.2 | 0.6 | 0.6 | 0.6 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 6.7 | 5.0 | 15.7 | 13.3 | 15.9 | 15.8 |
| 4.3 ගෘහ කර්මාන්ත | 5.6 | 4.5 | 0.9 | 0.8 | 1.1 | 1.1 |
| **5 විදුලිය, ගෑස් සහ ජලය** | **4.6** | **2.7** | **1.7** | **1.1** | **2.5** | **2.4** |
| 5.1 විදුලිය | 4.6 | 3.9 | 1.5 | 1.4 | 2.2 | 2.1 |
| 5.2 ගෑස් | 2.9 | - 10.2 | 0.1 | - 0.3 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 7.1 | 3.6 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| **6 ඉදිකිරීම්** | **9.0** | **7.8** | **8.3** | **8.4** | **6.4** | **6.5** |
| **සේවා** | **7.1** | **5.6** | **62.3** | **56.6** | **59.6** | **59.5** |
| **7 තොග සහ සිල්ලර වෙළෙඳාම** | **6.1** | **4.7** | **22.3** | **19.4** | **24.5** | **24.2** |
| 7.1 ආනයන වෙළෙඳාම | 3.3 | 4.7 | 4.5 | 7.2 | 9.1 | 9.0 |
| 7.2 අපනයන වෙළෙඳාම | 8.8 | 0.9 | 5.9 | 0.7 | 4.7 | 4.4 |
| 7.3 දේශීය වෙළෙඳාම | 7.6 | 6.4 | 11.8 | 11.5 | 10.7 | 10.8 |
| **8 හෝටල් සහ ආපනශාලා** | **- 2.3** | **- 5.0** | **- 0.1** | **- 0.3** | **0.4** | **0.4** |
| **9 ප්‍රවාහනය සහ සන්නිවේදනය** | **10.5** | **8.1** | **19.2** | **17.5** | **12.8** | **13.1** |
| 9.1 ප්‍රවාහනය | 9.3 | 6.3 | 14.5 | 11.5 | 10.8 | 10.9 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 8.8 | 8.0 | 0.8 | 0.9 | 0.7 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 21.5 | 22.3 | 3.8 | 5.1 | 1.4 | 1.6 |
| **10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය** | **8.7** | **6.6** | **10.9** | **9.5** | **8.7** | **8.7** |
| **11 නිවාස අයිතිය** | **1.1** | **1.1** | **0.6** | **0.6** | **3.2** | **3.1** |
| **12 රාජ්‍ය සේවා** | **6.0** | **5.7** | **6.8** | **7.4** | **7.7** | **7.7** |
| **13 පෞද්ගලික සේවා** | **7.8** | **6.5** | **2.7** | **2.6** | **2.4** | **2.4** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **6.8** | **6.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | 15.3 | - 118.0 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **7.1** | **4.7** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අපනයන සමග සසඳන කල ආනයන සියයට 4.5 කින් වැඩි වීම මගින් ඉල්ලුමෙහි වූ අතිරික්තය පියවා ගත හැකි විය. ආර්ථිකයෙහි සමස්ත ඉල්ලුමෙහි වූ අඩු වර්ධනය ප්‍රධාන වශයෙන් බාහිර අංශයේ ඇති වූ අයහපත් ප්‍රවණතා නිසා ඇති විය. ලෝක ආර්ථිකයේ පසුබෑම මධ්‍යයේ විශේෂයෙන්ම වසරේ අග කාලය තුළ අපනයන අංශයේ උදාසීන බවක් වාර්තා විය.

**දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) එනම් විදේශීය ශුද්ධ සාධක ආදායම (වි.ශු.සා.ආ.) ට ගලපන ලද දළ දේශීය නිෂ්පාදිතය 2008 වසර තුළ දී සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කළේය.** සාධක ආදායම් ලැබීම්හි සියයට 93.8 ක සංකෝචනයත් සමග ශුද්ධ සාධක ආදායම් ගෙවීම්හි වූ සියයට 14.4 ක අඩු වර්ධන වේගය 2008 වසරේ ජාතික ආදායමට සෘණාත්මක බලපෑමක් එක් කරමින් වි.ශු.සා.ආ. සියයට 153.6 ක තරම් සැලකිය යුතු ප්‍රතිශතයකින් සංකෝචනය වීමට හේතු විය. මේ තත්ත්වය විශේෂයෙන්ම 2008 වසරෙහි වූ ලෝක ආර්ථිකයේ පොලී අනුපාතිකවල වූ අවාසිදායක අඩු වීම් හේතු කොට ගෙන පොලී ආදායම අඩු වීමෙන් සිදු වූවකි.

**පවත්නා වෙළෙඳපොළ මිල අනුව ගණනය කරන ලද ද.ජා.නි. 2007 හි රුපියල් බිලියන 3,579 සිට 2008 වසර තුළ රු. බිලියන 4,411 දක්වා සියයට 23.2 කින් වැඩි විය.** මෙය ආර්ථික කටයුතුවල මූර්ත ප්‍රසාරණය හා සමස්ත ආර්ථිකයේ මිල මට්ටම්වල ඉහළ යාම නිසා ඇති වූ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. සමස්ත මිල මට්ටම්වල වූ ඉහළ යාම 2008 දළ දේශීය නිෂ්පාදිත අවවධමනකය 2007 වසරේ සියයට 14.0 සිට 2008 වසර තුළ දී සියයට 16.3 දක්වා ඉහළ යාම තුළින් පෙන්නුම් කෙරේ.

**මධ්‍ය වාර්ෂික ජනගහනය 2008 දී 20,217,000 දක්වා සියයට 1.0 කින් වැඩි විය.** දළ දේශීය නිෂ්පාදිත ඒක පුද්ගල ආදායම රුපියල් 218,161 දක්වා සියයට 22.0 කින් වැඩි විය. මෙය ඒක පුද්ගල ආදායම 2007 දී ඇ.එ.ජ. ඩොලර් 1,634 සිට 2008 දී ඇ.එ.ජ. ඩොලර් 2,014 දක්වා සියයට 23.3 ක වැඩි වීමක් ලෙස දැක්වේ. ඉකුත් වර්ෂයේ වූ සියයට 6.1 ට සාපේක්ෂව 2008 වසරේ ආදායම් මට්ටම්වල මූර්ත වර්ධනය සියයට 4.9 කි.

**2008 වර්ෂය තුළ දේශීය ඉතුරුම් 2007 වසරේ වූ රුපියල් බිලියන 629 සිට රුපියල් බිලියන 623 දක්වා සියයට 0.9 කින් සංකෝචනය විය.** දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල ඉතුරුම් අනුපාතය 2007 වසරේ වූ සියයට 17.6 ට සාපේක්ෂව සියයට 14.1 ක් දක්වා අඩු විය. ඉහළ ගිය ජාත්‍යන්තර මිල ගණන් සමග වූ ඉහළ ආනයන ගෙවීම් අගයන් හා අපනයන ඉපැයීම්වල දක්නට ලැබුණු අඩු වීම දේශීය ඉතුරුම්වල මෙම පහළ යාමට හේතු වන්නට ඇත.

**2.1 රූප සටහන** — **වාර්ෂික වර්ධන අනුපාතික**




මේ අතර 2007 වසරට වඩා අඩු වේගයකින් වුවද පුද්ගලික පෝෂණ වර්ධනය වූ නමුත් ශුද්ධ විදේශීය සාධක ආදායම තවදුරටත් පිරිහීමට ලක් වූ නිසා ජාතික ඉතුරුම් දේශීය ඉතුරුම්වලටත් වඩා වැඩි වේගයකින් අඩු විය.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

### කෘෂිකාර්මික අංශය

**2007 වසරේ වූ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව කෘෂිකාර්මික අංශය 2008 වර්ෂය තුළ සියයට 7.5 ක් වූ ඉහළතම ආංශික වර්ධනයක් වාර්තා කළේය.** ධීවර නිෂ්පාදනයේ වූ වැඩි වීමත්, 2008 යල කන්නයේ වී නිෂ්පාදනයේ වූ වාර්තාගත වැඩි වීමත් දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනයේ ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන කෘෂිකාර්මික අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් තේ සහ පොල් නිෂ්පාදන දායක වූ අතර, රබර් නිෂ්පාදනය ද එම අංශයේ වර්ධනයට හිතකර ලෙස දායක විය. නමුත් වර්ෂයේ අවසාන කාර්තුව තුළ සියයට 8.1 කින් සංකෝචනය වූ තේ අපනයනය මගින් පිළිබිඹු වන පරිදි ලෝක ආර්ථික පසුබෑම අපනයන කෘෂිකාර්මික අංශයට අයහපත් ලෙස බලපාන ලදි.

### අපනයන කෘෂිකර්මය

**ශතවර්ෂයකට වැඩි ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය කිසියම් වර්ෂයක පළමු භාගයකදී වාර්තා කළ හොඳම ක්‍රියාකාරිත්වය සනිටුහන් කරමින් 2008 වර්ෂයේ පළමු භාගයේදී තේ නිෂ්පාදනය සියයට 19 කින් ඉහළ ගියේය.** පසුව, 2008 වර්ෂය අවසානය වන විට මෙම වර්ධනය සියයට 4.1 දක්වා මන්දගාමී වීමට තේ සඳහා ලෝක ඉල්ලුමේ පහළයාම බලපෑවේය. පළමු භාගයේ ඉහළ ගිය නිෂ්පාදනයට

**2.2 සංඛ්‍යා සටහන** — **කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

| අයිතමය | 2007(අ) | 2008(ආ) | වර්ධන වේගය(%) 2008/07 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 113.0 | 124.4 | 10.1 |
| 1. කෘෂිකර්මය | 114.0 | 125.7 | 10.2 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 111.0 | 122.9 | 10.7 |
| තේ | 106.3 | 110.6 | 4.1 |
| රබර් | 121.9 | 134.0 | 9.9 |
| පොල් | 103.3 | 104.8 | 1.4 |
| වී | 117.5 | 145.4 | 23.8 |
| අනෙකුත් බෝග | 111.5 | 121.0 | 8.5 |
| 1.2 පශු සම්පත් | 140.6 | 150.1 | 6.7 |
| 2. මත්ස්‍ය | 106.6 | 116.9 | 9.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියලුම තේ වැවිලි දිස්ත්‍රික්ක තුළ පැවැති හිතකර කාලගුණ තත්ත්වය, තේ කර්මාන්තශාලා බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම හා කලට වේලාවට තේ ගස් කප්පාදු කිරීම, නිර්දේශිත ප්‍රමාණයෙන් පොහොර භාවිතය හා කෘමිනාශක භාවිතය යනාදී යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් බලපාන ලදී. කෙසේ වෙතත්, තුන්වන කාර්තුවේදී තේ නිෂ්පාදනය සුළු වශයෙන් සියයට 1.4 කින් අඩු වූ නමුත්, හතරවන කාර්තුවේදී සියයට 19.4 කින් තරම් සැලකිය යුතු ලෙස අඩුවිය. උග්‍ර වෙමින් පැවැති ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් පහළ යන පසුබිමක් තුළ නිමි තේ සැපයුම අවම කිරීම සඳහා බලයලත් ආයතන විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් මේ සඳහා එක්තරා දුරකට බලපානු ලැබීය. මෙම ගෝලීය අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ තේ ගැණුම්කරුවන්ට, එනම්, මැද පෙරදිග රටවල් හා රුසියාව ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් (CIS) නව තොග ඇණවුම් කිරීම සඳහා තවදුරටත් තේ මිල ගණන් පහළයාමක් අපේක්ෂා කරමින් තේ මිලදී ගැණුම් කල්දැමීය. තවදුරටත්, ඉතා ඉහළ ගුණත්වයෙන් යුතු තේ දළු වලට පමණක් නෙලීම සීමාවීම, කොළඹ තේ වෙන්දේසියේ මිල පහළ යන තත්ත්වයන් තුළ තේ කප්පාදු කිරීම සඳහා පියවර ගැනීම, තේ වගාකරන දිස්ත්‍රික්ක තුළ පැවැති නියඟය හේතුවෙන් සහන මිලට ලැබූ පොහොර පවා භාවිතය අඩුවීම ආදිය මෙම වර්ධනයේ පහළයාමට හේතු විය.

**වසරේ දෙවන භාගයේදී පැවැති තේ මිල ගණන් පෙර වර්ෂයේ එම කාල පරිච්ඡේදය සමඟ සැසඳීමේදී සියයට 9.7 කින් අඩුවිය.** කෙසේ වෙතත්, කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය තේ විකුණුම් මිල ගණන් පළමු හා දෙවන කාර්තුවේදී පිළිවෙලින් සියයට 34 කින් හා සියයට 27 කින් වැඩි වූ අතර, මෙහිදී පහත් බිම් වල වගාකරන තේ වල සාමාන්‍ය විකුණුම් මිල ගණන් වැඩි ඉහළ යාමක් වාර්තා කළේය. 2008 වසරේ දී, පහත් බිම් තේ නිෂ්පාදනය සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 58 කට දායක විය. කෙසේ වෙතත්, 2008 වසරේ සැප්තැම්බර් මාසයෙන් පසු ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ, තේ සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොලැබීමේ තත්ත්වය තුළ තේ මිල ගණන් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන් පසුගිය වර්ෂයේ එම කාලපරිච්ඡේද හා සැසඳීමේදී 2008 වසරේ තුන්වන හා හතරවන කාර්තුවල පිළිවෙළින් සියයට 14 ක් හා සියයට 30 ක් ලෙස අඩු විය.

**හතරවන කාර්තුවේදී, තේ මිල ගණන් ස්ථාවර කිරීමේ හා කොළඹ තේ වෙන්දේසියේ අලෙවි නොවූ තේ ප්‍රමාණයන් අවම කරගැනීමේ උත්සාහයක් වශයෙන් රජය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා මැදිහත් වෙමින් තේ මෙට්‍රික් ටොන් 917 ක ප්‍රමාණයක් ජූලි හා දෙසැම්බර් අතර කාලපරිච්ඡේදයේ දී මිල දී ගත්තේය.** එයට අමතරව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ස්ථාවර කරගැනීම සඳහා තාවකාලිකව පෞද්ගලික විකුණුම් සීමාකරන ලද අතර තේ වෙන්දේසියට ඉදිරිපත් කරනු ලබන තේ සැපයුම සීමාකර ගැනීම සඳහා ගුණාත්මකබවින් වැඩි තේ පමණක් නිෂ්පාදනය කරන ලෙසට තේ නිෂ්පාදකයින්ට හා තේ කර්මාන්තශාලා හිමියන්ට උපදෙස් ලබාදුනි. රජය විසින් ද තේ කර්මාන්තයට ආධාර කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් 2009 වසර සඳහා වන අයවැය ලේඛනය තුළින් හා ඉන් අනතුරුව 2008 වසරේ දෙසැම්බර් මස අග දී ඉදිරිපත් කළ ආර්ථික සහන පැකේජය තුළින් හඳුන්වා දෙන ලදි. මෙම ක්‍රියාමාර්ග අතර අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 40 ක මිලක් ලැබෙන තෙක් කිලෝග්‍රෑම් 50 ක මිශ්‍ර පොහොර මල්ලක් රුපියල් 1000 ක මිලට කුඩා තේ වතු හිමියන්ට සැපයීමත්, තේ කර්මාන්තශාලා හිමියන්ට බැංකු හරහා සියයට 6 ක පොලී දිරි දීමනාවක් තේ අර්බුදය මධ්‍යයේ රජය විසින් යළි ස්ථාපිත කරන ලද තේ ස්ථායීකරණ අරමුදල හරහා සැපයීමත් ඇතුළත් විය. එසේම, තේ කර්මාන්තකරුවන් මුහුණ දෙන මූල්‍ය ගැටළු වලට පිළියමක් ලෙස තේ කර්මාන්තශාලා නවීකරණය සඳහා වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබූ ණය ආපසු අයකර ගැනීම තාවකාලිකව වසරකට අත්හිටුවීමටත් ක්‍රියා කරන ලදි. මෙයට අමතරව, ආනයනය කරනු ලබන තේ කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 4 ක සෙස් බද්දක් අයකිරීම තුළින් ආනයනය කරනු ලබන ගුණත්වයෙන් අඩු තේ සමඟ ශ්‍රී ලංකා තේ මිශ්‍ර කිරීම අධෛර්යමත් කිරීම හා තේ පැකට් හා මළු සඳහා වන අපනයන බද්ද නිදහස් කිරීමටත් ක්‍රියාමාර්ග ගනු ලැබීය. එසේම, ශ්‍රී ලංකාවේ මිත්‍ර රටවල ආනයනකරුවන්ට භාණ්ඩාගාරයේ ඇපවීම මත කෙටිකාලීන ණය පදනම මත තේ අපනයනය කිරීම හඳුන්වා දෙමින් කර්මාන්තයේ තිරසාර පැවැත්ම සහතික කිරීම සඳහා රජය ක්‍රියා කළේය.

**2.3 සංඛ්‍යා සටහන**

## ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්

| අයිතමය | ඒකකය | 2007(අ) | 2008(ආ) |
|---|---|---|---|
| **1. තේ** | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 305.2 | 317.7 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 193 | 193 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රු./කි.ග්‍රෑ. | 236.50 | 262.60 |
| 1.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය | රු./කි.ග්‍රෑ. | 279.10 | 301.63 |
| - අපනයන (නැ.වි.ස.) | රු./කි.ග්‍රෑ. | 364.28 | 430.40 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,452 | 1,389 |
| 1.7 අළුතින් වගා කිරීම (ඉ) | හෙක්ටයාර | - | - |
| 1.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඊ) | | 1.6 | 1.6 |
| **2. රබර්** | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 117.6 | 129.2 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය (උ) | හෙක්ටයාර දහස් | 120 | 122 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (උ) | හෙක්ටයාර දහස් | 94 | 96 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රු./කි.ග්‍රෑ. | 112.69 | 114.00 |
| 2.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රු./කි.ග්‍රෑ. | 234.22 | 269.51 |
| - අපනයන (නැ.වි.ස.) | රු./කි.ග්‍රෑ. | 234.48 | 278.20 |
| 2.6 නැවත වගා කිරීම (ඌ) | හෙක්ටයාර දහස් | 5,192 | 1,818 |
| 2.7 අළුතින් වගා කිරීම (ඌ) | හෙක්ටයාර දහස් | 2,034 | 2,130 |
| 2.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඊ) | | 0.7 | 0.8 |
| **3. පොල්** | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි දශ ලක්ෂ | 2,869 | 2,909 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 400 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 10.25 | 12.47 |
| 3.4 සාමාන්‍ය මිල | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 16.87 | 22.71 |
| - අපනයන (නැ.වි.ස.) (එ) | ගෙඩියක් රුපියල් | 16.50 | 21.41 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඒ) | හෙක්ටයාර | 2,528 | 1,712 |
| 3.6 අළුතින් වගා කිරීම (ඒ) | හෙක්ටයාර | 2,936 | 3,441 |
| 3.7 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඊ) | | 1.4 | 1.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) 2007 න් පසු බලයලත් ආයතන වල සහනාධාර යටතේ අළුතින් වගාකර නැත.
(ඊ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(ඌ) රබර්සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(එ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඒ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**වසර තුළදී තේ පර්යේෂණ ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය උපාය මාර්ග කිහිපයක් හා ව්‍යාප්ති සේවාවන් හඳුන්වා දෙමින් තේ අංශයේ ඵලදායීතාවය වැඩිකර ගැනීමට හා තේ නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට ක්‍රියා කළේය.** නිෂ්පාදන ක්‍රියාවලිය තුළ බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීමේ ක්‍රමයක් වශයෙන් විදුලි බල පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීම සඳහා තේ කර්මාන්ත ශාලාවල භාවිතයට ගතහැකි විදුලි බලය පිරිමසින විදුලි පංකා වැඩි දියුණු කරන ලදි. ආදායම් වැඩිකර ගැනීමේ අරමුණෙන් එකතු කළ අගය සහිත තේ නිෂ්පාදන වැඩිදියුණු කරගැනීම සඳහා චීනය හා ජපානය විසින් ඉදිරිපත් කරන හරිත තේ වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ හරිත තේ වල බහුලව අඩංගු පොලිපිනෝල් (Polyphenols) ප්‍රතිශතය පිළිබඳව වැඩි අවධානයක් යොමුකර ගනිමින් ශ්‍රී ලංකා ක්ෂණික තේ හා ක්ෂණිකව පානයට ගතහැකි හරිත තේ පානයන් නිෂ්පාදනය සඳහා දිරිගැන්වීම ද සිදු කරන ලදි. වසර තුළ දී තේ කර්මාන්තශාලා නවීකරණ වැඩ සටහන් යටතේ නිෂ්පාදිත වල එකතු කළ වටිනාකම ඉහළයාමට හේතු වන උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂ්‍ය පාලන පද්ධතිය (HACCP) පිළිබඳ සහතික පත්‍රය තේ කර්මාන්තශාලා 42 ක් විසින් ලබාගන්නා ලදී. මේ අතර, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයක් ලෙස ඉඩම් සංවර්ධන උපකාරක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ හෙක්ටයාර 1,128 ක ඉඩම් ප්‍රමාණයක් වගාව සඳහා පිළියෙළ කිරීම, හෙක්ටයාර 1,091 ක ඉඩම් ප්‍රමාණයක පස වගාවට උචිත ලෙස පුනරුත්ථාපනය කිරීම හා ඉඩම් හෙක්ටයාර 881 ක තේ නැවත වගා කිරීමට අදාළ කටයුතු සිදු කරන ලදි.

**2008 වසරේ රබර් නිෂ්පාදනය සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කරමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 129 දක්වා සියයට 10 කින් ඉහළ ගියේය.** වසරේ පළමු භාගය තුළ පැවැති අධික වර්ෂාව නිසා රබර් නිෂ්පාදනයට අඛණ්ඩව බාධා එල්ල වුවත්, ස්වාභාවික රබර් සඳහා පැවැති ඉල්ලුමේ ඉහළ යාම හේතුවෙන් රබර් නිෂ්පාදනය අඛණ්ඩව ඉහළ ගියේය. ස්වාභාවික රබර් සඳහා ඉල්ලුම ඉහළ යාමට මෙම කාලය තුළ කෘත්‍රිම රබර් මිල ගණන් ඉතා වේගයෙන් ඉහළ යාම හා ස්වාභාවික රබර් සඳහා ලැබුණු සුවිශේෂී ඉහළ මිල ගණන් හේතු විය. ඒ අනුව, 2008 ජූනි මස දී ආර්.එස්.එස්. (දුම්ගැසූ ෂීට් රබර්) කිලෝවක් සඳහා රුපියල් 350 ක මිලක් සටහන් වූ අතර, එය කොළඹ රබර් වෙන්දේසියේ දී මෙතෙක් වාර්තා වූ ඉහළම මිල ලෙස සැලකේ. කෙසේ වෙතත්, වසරේ දෙවන භාගයේදී රබර් මිල ගණන් පහත වැටීම ආරම්භ වූ අතර, ඒ සඳහා ස්වාභාවික රබර් වලට පැවැති ඉල්ලුම

අඩුවීම බලපෑවේය. ස්වාභාවික රබර් සඳහා ලෝක ඉල්ලුම අඩුවීමට ලෝක මූල්‍ය අර්බුදය මෙන්ම අඩු වෙමින් පැවැති තෙල් මිල ගණන් හේතුවෙන් කෘත්‍රිම රබර්වලට ඉල්ලුමේ සිදුවූ විතැන්වීම ද හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසරේ පළමු භාගයේදී පිළිවෙළින් සියයට 33 කින් හා 34 කින් ඉහළ ගිය ආර්.එස්.එස්. රබර් අංක 01 හා 02 හි සාමාන්‍ය මිල ගණන් කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කරමින් මෙම දෙවර්ගයේම රබර් සඳහා වන සාමාන්‍ය මිල ගණන් එම වසරේ මුල් භාගයට සාපේක්ෂව දෙවන භාගයේදී සියයට 19 කින් අඩු වූ අතර, එමගින් කර්මාන්තයේ තිරසාර පැවැත්මට කෙටි හා මැදි කාලීනව පැවතිය හැකි බලපෑමක් එල්ල විය.

**රජය විසින් 2009 වසර සඳහා වන අයවැය ලේඛනය හා ඉන් අනතුරුව 2008 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී ඉදිරිපත් කළ ආර්ථික සහන පැකේජය තුළින් රබර් කර්මාන්තයට යළි ජීවය ලබාදීම සඳහා දිරිගැන්වීම් ලබාදීමට ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙනු ලැබීය.** මේ යටතේ රබර් භාණ්ඩ නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් විසින් රබර් වගාකරුවන්ට අවම වශයෙන් කිලෝවකට රුපියල් 150 ක් ලැබෙන පරිදි රබර් කිරි මිලදී ගැනීම සහතික කිරීම සඳහා ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, ආනයනය කරනු ලබන ස්වාභාවික රබර් කිරි සහ අනෙකුත් රබර් නිෂ්පාදන කිලෝවක් සඳහා සෙස් බද්ද රුපියල් 25 දක්වා ඉහළ දැමීම, දේශීය රබර් කිරි සඳහා ඉහළ ඉල්ලුමක් ලැබෙන පරිදි ආනයනය කරනු ලබන කෘත්‍රිම රබර් සඳහා සෙස් බද්ද රුපියල් 35 දක්වා වැඩි කිරීම වැනි ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ලැබීය. තවද, දේශීය රබර් භාණ්ඩ නිෂ්පාදකයින්ගෙන් අයකරනු ලබන අපනයන සෙස් බද්ද වසරකට අත්හිටුවීම, රබර් නිෂ්පාදිත පිරිවැය අඩුකිරීම සඳහා විදුලිය සඳහා වන සියයට 15 ක අධිභාරය අත්හිටුවීම සහ දැවි තෙල් ලීටරයක මිල රුපියල් 10 කින් අඩුකිරීම සහ පිටරටින් ගෙන්වනු ලබන බස්රථ මෙන්ම අනෙකුත් වාහන සඳහා යොදාගනු ලබන ටයර් දේශීයව නිපදවීම දිරිගැන්වීම සඳහා දේශීය කර්මාන්තකරුවන්ට ඉලක්කගත මූල්‍යමය ප්‍රතිපාදන සැපයීම හඳුන්වා දුන් අනෙකුත් ක්‍රියාමාර්ග වේ.

**තත්ත්වයෙන් උසස් ස්වාභාවික රබර් ජාත්‍යන්තර වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා රබර් කර්මාන්තයේ ඵලදායීතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.** රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2008 වසර තුළදී ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩ සටහන් කිහිපයක් ක්‍රියාවට නැංවීය. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අරමුදලේ සහාය ඇතිව මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි. තවද, වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් රබර් පර්යේෂණ ආයතනයේ හා වෘත්තීය පුහුණු අධිකාරියේ සහයෝගය ඇතිව කළුතර හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල රබර් කිරි නිස්සාරකයන් 2,640 ක් පුහුණු කරන ලදී. එමෙන්ම, රබර් කර්මාන්තය තුළ පවතින රබර් පැල බද්ධ කරන්නන්ගේ හිඟය සම්පූර්ණ කිරීමේ අරමුණින් රබර් පැල බද්ධ කරන්නන් තිස්දෙනෙකු ද කළුතර දිස්ත්‍රික්කයේ පුහුණු කරන ලදි. රබර් පර්යේෂණ ආයතනය ද රබර් කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා “මුකුනා බ්‍රැක්ටීටා” (Mucuna Bracteata) නම් ආවරණ ශාක වගාවක් නිර්දේශ කළ අතර, වසර 06 ක් වන නොමේරූ රබර් පැල වගාව සඳහා අවශ්‍ය නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවයෙන් සියයට 50 ක ප්‍රමාණයක් එමගින් සපුරාලමින් රබර් ඉඩම් හෙක්ටයාරයකට අවශ්‍යවන නයිට්‍රජන් පොහොර සඳහා වැයවන පිරිවැය රුපියල් 31,300 කින් කපා හැරීමට හැකි විය. තවද, එම ආයතනය විසින්, මෙම නොමේරූ රබර් පැල වගා කාලය තුළ පිදුරු මෙට්‍රික් ටොන් 2,500 ක් රබර් හෙක්ටයාරයකට යෙදීම මගින් රබර් හෙක්ටයාරයකට අවශ්‍ය වන පොටෑසියම් පොහොර සඳහා වැයවන පිරිවැය රුපියල් 31,700 කින් කපා හැරීමට ද හැකි බව ද පෙන්වා දී ඇත.

**2008 වසරේ දී පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2,909 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් වැඩිවීමක් පෙන්නුම් කළේය.** වසරේ දෙවන භාගය තුළ නිෂ්පාදනයේ ඉහළයාම සඳහා යහපත් කාලගුණික තත්ත්වයේ බලපෑම ඉවහල් විය. කෙසේ වෙතත්, වසරේ පළමු භාගය තුළ පොල් නිෂ්පාදනය 2007 වසරේ සම කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 19.6 කින් අඩු විය. 2007 වර්ෂයේ දී වාර්තා වූ දැඩි නියගය හා දකුණු පළාතෙන් ආරම්භ වූ “වැලිගම කොළ කුණුවීමේ රෝගය” නමින් හඳුන්වන පොල් වගාවේ නව රෝගයද පළමු භාගයේ නිෂ්පාදනය පහළයාම කෙරෙහි විශාල වශයෙන් බලපෑවේය. කෙසේ වෙතත්, දෙවන භාගයේ දී නිෂ්පාදනය අඛණ්ඩව ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, පෙර වර්ෂයේ අදාළ පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.6 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

**2008 වසරේ පළමු භාගය තුළ දී පොල් තෙල් හා කපාපු පොල් ද ඇතුළත් පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන්, කොළඹ වෙන්දේසියේ දී සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගිය නමුත් වසරේ දෙවන භාගයේදී මිල ගණන් පහත වැටීමට පටන් ගැණුනි.** වසරේ පළමු භාගයේ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් ඉහළ යාම, ඉහළ ඉල්ලුමට

සරිලන පරිදි සැපයුමක් නොපැවැතීම, ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති සැපයුමේ හිඟය සහ ජීව ඉන්ධන නිෂ්පාදනය සඳහා පොල් තෙල්වලට ඉහළ ජාත්‍යන්තර ඉල්ලුමක් පැවතීම යන කරුණු වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. කෙසේ වෙතත්, ඉහළ ගිය නිෂ්පාදනය සහ ඉන්ධන මිල ගණන් අඩුවීම සමඟ ජීව ඉන්ධන සඳහා ඉල්ලුම අඩු වීම ද ආහාර පිසීමට ගන්නා ආනයනික තෙල් සඳහා වන තීරු බදු ව්‍යුහයේ ඇතිකළ වෙනස්කම් ද පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් වසර අවසානය වන විට අඩුවීම කෙරෙහි දායක විය.

**පොල් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගන්නා ලදී.** 2008 වසරේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, පාම් ඔයිල් සහ පොල් තෙල් ආනයනය සඳහා ලබා දී තිබූ සියයට 23 ක බදු සහනය සියයට 13 දක්වා අඩු කිරීම, සහ 2008 වසරේ දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, පාම් ඔයිල් සහ පොල්තෙල් ආනයනය මත පැවති තීරු බදු නිදහස් කිරීම ඉවත් කරමින් පාම් තෙල් සහ පොල්තෙල් ආනයනය මත තීරුබදු සියයට 28 ක් දක්වා වැඩි කිරීම ආදී ක්‍රියාමාර්ග මගින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම සහ වැඩි එකතු කළ අගයක් සහිත පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයනය සඳහා දිරිගැන්වීම ද සිදු විය.

**පොල් පර්යේෂණ ආයතනය ඵලදායීතාවය වැඩිදියුණු කිරීම, බෝග ආරක්ෂාව සහ නව පොල් ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වාදීම සඳහා සිය පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු කළේය.** පොල් පර්යේෂණ ආයතනය සිදු කළ අධ්‍යයනයන් තුළින් අනාවරණය වූයේ, ගෙවතු පොල් වගාවන් හා කුඩා පොල් වතුවල, ඉඩම් විශාලත්වය අක්කර 21 සිට 40 දක්වා ඉහළ යාමේදී ඵලදායීතාවය සහ වගා කළ ඉඩම් වල විශාලත්වය අතර, සැලකිය යුතු ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවයි. මෙම වසර තුළ පොල් පර්යේෂණ ආයතනය “වැලිගම කොළ කුණුවීමේ රෝගය” ව්‍යාප්තවීම පාලනය කර ගැනීම සඳහා, ගාල්ල සිට තංගල්ල මාර්ගය ඔස්සේ මෙම රෝගයේ බලපෑම නොමැති කිලෝ මීටර් 3 ක් පළල කිලෝමීටර් 240 ක් දිග සීමාවක් සලකුණු කිරීම මගින් ද රෝගය ව්‍යාප්ත වූ ප්‍රදේශවල සිට පොල් සහ වෙනත් තාල වර්ගයේ පැල සහ ඒවායේ නො වියලුණු කොටස් ප්‍රවාහනය කිරීම තහනම් කිරීම මගින් ද දායක විය. තවද, වසර තුළ දී පොල් පර්යේෂණ ආයතනය විසින්, පොල් වගා කරන්නන් සඳහා වැඩි දියුණු කරන ලද දෙමුහුන් පැල වර්ග, එනම්, *සී.ආර්.අයි.එස්.එල්* - 98 (CRISL -98) සහ *කපුරුවාන* බීජ පැල නිකුත් කරන ලදී.

**අනෙකුත් අපනයන බෝග නිෂ්පාදන, එනම්, කුරුඳු, කරාබු නැටි සහ ගම්මිරිස් ආදී වගා 2008 වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** මෙහිදී, කොකෝවා නිෂ්පාදනය සියයට 87 කින් ද, කරාබුනැටි නිෂ්පාදනය සියයට 169 කින් ද, පුවක් සියයට 14 කින් ද, කෝපි සියයට 2 කින් ද ඉහළ ගියේය. මෙම වසර තුළ බුලත් නිෂ්පාදනය සියයට 7 කින් ද, කරඳමුංගු සියයට 21 කින් ද, ගම්මිරිස් සියයට 21 කින් ද, කුරුඳු සියයට 3.5 කින් ද, කජු සියයට 57 කින් ද අඩු විය. කුරුඳු නිෂ්පාදනයේ පහළ යාම සඳහා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කුරුඳු නිෂ්පාදනයෙන් සියයට 40 ක් පමණ තනිවම මිලදී ගන්නා මෙක්සිකෝව සහ අනෙකුත් ලතින් ඇමෙරිකානු රටවල ලෝක මූල්‍ය අර්බුදය විසින් ඇති කළ දැඩි බලපෑම හේතුවෙන් ඉල්ලුමෙහි ඇති වූ පහළ යාම බලපෑවේය. ඒ අනුව, වසරේ තුන් වන කාර්තුවේ දී කිලෝ ග්‍රෑම් එකකට සියයට 30 සිට සියයට 40 දක්වා පරාසයකින් කුරුඳු මිල ගණන් පහත වැටුණි. අපනයන ඉල්ලුමේ අඩුවීමට අමතරව ගම්මිරිස් නිෂ්පාදනයේ පහළ යාම සඳහා මහනුවර සහ මාතලේ වැනි ප්‍රධාන ගම්මිරිස් වගා කරන ප්‍රදේශවල අධික සහ අඛණ්ඩ වර්ෂාපතනය හේතු විය. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන ගම්මිරිස් සඳහා ඉන්දියාව විසින් ඇතැම් සීමාවන් පැනවීම ගම්මිරිස් අපනයනය පහත යාමට දායක වූ අතර එමගින් ගම්මිරිස් නිෂ්පාදනය අඩු විය. කෙසේ වෙතත්, 2008 වසර තුළ දී කරාබු නැටි අස්වැන්න විශේෂිත නිෂ්පාදන මට්ටමක් පෙන්නුම් කිරීමට මූලික වශයෙන් හේතු වූයේ කරාබු නැටි නිෂ්පාදනය සෑම වසර 4 කට වරක් ම සිය නිෂ්පාදනයේ උපරිම අස්වැන්න ලබා දීමත් එසේ වැඩිම අස්වැන්න වාර්තා කළ අවසන් වසර 2004 වර්ෂය වීමත්ය. කුරුඳු නිෂ්පාදකයන් විසින් මුහුණ දුන් ගැටලු විසඳීම සඳහා රජය විසින් 2008 වසරේ දෙසැම්බර් මස හඳුන්වා දුන් ආර්ථික සහන පැකේජය හරහා ක්‍රියාමාර්ග කිහිපයක් ප්‍රකාශයට පත් කළ අතර, ඒ යටතේ කුරුඳු වගා කරන්නන්ට සිය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා සහන පොලී අනුපාතික යටතේ ණය සැපයීම සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ කුරුඳු අපනයනකරුවන් හට කුරුඳු වගාකරුවන්ගෙන් සහතික මිලක් යටතේ කුරුඳු මිල දී ගැනීම සඳහා විශේෂ දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම ද සිදු විය.

## දේශීය කෘෂිකර්මය

**2008 වර්ෂයේ වී නිෂ්පාදනය වාර්තා ගත මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 3.87 ක් හෙවත්, සහල් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.63 ක් දක්වා සියයට 24 කින් ඉහළ ගියේය.** 2007/2008 මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික්

ටොන් දශ ලක්ෂ 2.125 ක් දක්වා පෙර වර්ෂයේ මහ කන්නයට සාපේක්ෂව සියයට 7.8 කින් පමණක් ඉහළ ගිය ද 2008 වර්ෂයේ යල කන්නයේ වී නිෂ්පාදනය අති විශේෂ වර්ධනයක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.75 ක් දක්වා සියයට 51 කින් ඉහළ ගිය අතර, මෙය නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඕනෑම කන්නයක වාර්තා වූ දෙවෙනි ඉහලම වර්ධනය විය. මෙම වර්ධනය වඩාත් විශේෂ වීමට හේතු වූයේ එය සාමාන්‍යයෙන් සාපේක්ෂ වශයෙන් අඩු නිෂ්පාදනයක් වාර්තා වන යල කන්නය තුළ වාර්තා වීමයි. මෙම නිෂ්පාදනයේ වර්ධනය සඳහා රජය විසින් වී මිල දී ගනු ලබන අවම මිල කලින් පැවති මිලට සාපේක්ෂව සියයට 24 කින් පමණ ඉහළ යාම හේතුවෙන්, පෙර වර්ෂයේ යල කන්නයට එරෙහිව මෙම වර්ෂයේ යල කන්නයෙහි වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය සියයට 62 කින් ඉහළ යාම විශාල වශයෙන් බලපෑවේය. මෙම වර්ධනය සඳහා වෙනත් සාධක ද, එනම්, ඉතා අධික පොහොර මිල ගණන් යටතේ පවා රජය විසින් සහන මිලට පොහොර අඛණ්ඩව සැපයීම සහ රටේ සියලු පළාත්වල පාහේ වඩා හිතකර වර්ෂාපතනයක් පැවතීම ආදී කරුණු ද උපකාරී විය. යල කන්නයේ සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 23 ක් සඳහා දායක වූ අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කවල වගාවට යොදා ගනු ලැබූ ඉඩම් ප්‍රමාණය ඉහළ යාම මෙම ප්‍රවණතාවයට තව දුරටත් අනුබලයක් විය. 2008 දී, විශේෂයෙන් පළමු භාගය තුළ, තිරිඟු ද ඇතුළත් වූ ධාන්‍ය මිලෙහි පැවති ඉහළ මිල ගණන් ද සහල් නිෂ්පාදනය ඉහළ යාම සඳහා ඉවහල් විය. තව ද, රජයේ කෘෂිකාර්මික වැඩ සටහන වන *"අපි වවමු - රට නගමු"* වැඩසටහන සාර්ථකව ක්‍රියාවේ යෙදවීම ද වගාවට යොදා ගනු ලැබූ ඉඩම් ප්‍රමාණය ඉහළ යාමට හා වගා ක්‍රම වර්ධනය වීමට හේතු වූ අතර, එය නිෂ්පාදනය ඉහළ යාමට ඉවහල් විය.

**2.2 රූප සටහන** **සහල් : සැපයුම සහ ඉල්ලුම**




**2007 වසරේ ජුනි මස සිට 2008 වසරේ ජුනි මස දක්වා සියලුම වර්ගයේ සහල් මිල ගණන්වල වාර්තා වූ මිල වැඩි වීම පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි මහජන අප්‍රසාදය වර්ධනය වීමට හේතු වූ අතර, සාධාරණ මිල පාලනයක් ඇතිකිරීම සඳහා ඉක්මන් මැදිහත්වීමක් සිදුකිරීමට රජයට සිදුවිය.** මෙහි ප්‍රතිඵලයක් ලෙස, රජය සහල් ආනයනය සඳහා පැවති රේගු බදු ඉවත් කළ අතර, සහල් මිල අධික ලෙස ඉහළ යාම වැළැක්වීමේ උත්සාහයක් වශයෙන් විවිධ වර්ගයේ සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් නියම කළේය.

2008 වර්ෂයේ දී ද රජයේ වී මිල දී ගැනීමේ **යාන්ත්‍රණය නොකඩවා ක්‍රියාත්මක විය. ඒ අනුව, 2008 වසරේ යල කන්නයේ දී ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් දිගු වී ඇට (නාඩු) කිලෝ ග්‍රෑම් 1 ක් රු. 28 කට සහ කුඩා වී ඇට (සම්බා) කිලෝ ග්‍රෑම් 1 ක් රු. 30 කටත් මිල දී ගන්නා ලදී.** රජය 2008 වසරේ යල කන්නයේ මෙට්‍රික් ටොන් 5,747 ක් මිල දී ගැනීම සඳහා රුපියල් දශ ලක්ෂ 172 ක් වැය කළේය. වසර තුළ දී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය ද මෙට්‍රික් ටොන් 84,000 ක් දක්වා සියයට 4.5 ක අඩුවීමක් වාර්තා කළේය.

**වී නිෂ්පාදන අංශයේ නව තාක්ෂණය යොදා ගන්නා උසස් කෘෂිකාර්මික භාවිතයන් හරහා වී නිෂ්පාදනයේ ඵලදායීතාවය ඉහළ නැංවීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් 2008 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, 2007/2008 යල කන්නයේ දී *"යාය"* ආදර්ශ වැඩසටහන් කිහිපයක් හා *"නව සරුකෙත යාය"* වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පුරන් කුඹුරු යළි වගා කිරීම ආදිය සිදු කරන ලදී. හෙක්ටයාර 65,415 ක් ආවරණය වන පරිදි ගොවීන් 75,618 දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව *"යාය"* ආදර්ශ වැඩසටහන් 4,008 ක් සහ *"නව සරුකෙත යාය"* වැඩසටහන් 560 ක් 2008 වසරේ දී පැවැත්විණි. 2008/2009 මහ කන්නයේ දී හෙක්ටයාර් 15,177 ක පුරන් කුඹුරු යළි වගා කරන ලදී. 2007/2008 මහ කන්නයේ සහ 2008 යල කන්නයේ දී සහතික කළ බීජ වී නිෂ්පාදන වැඩසටහන යටතේ පිළිවෙළින් හෙක්ටයාර 4,513 ක් හා හෙක්ටයාර 4,156 ක් වගා කරන ලදී. 2007/2008 මහ කන්නයේ දී වී බුසල් 116,491 ක් සහ 2008 යල කන්නයේ දී වී බුසල් 57,464 ක් පමණ ස්වයං බීජ වී නිෂ්පාදන වැඩසටහන යටතේ නිෂ්පාදනය කරන ලදී.

**2.4 සංඛ්‍යා සටහන**

## වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | 2007 (අ) | | | 2008 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 525 | 291 | 816 | 582 | 471 | 1,053 |
| අස්වැන්න නෙලා ගත් දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 512 | 284 | 796 | 568 | 465 | 1,033 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 459 | 255 | 714 | 508 | 417 | 925 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 1,973 | 1,158 | 3,131 | 2,125 | 1,750 | 3,875 |
| | බුසල් දහස් | 94,546 | 55,491 | 150,038 | 101,830 | 83,860 | 185,690 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,299 | 4,543 | 4,389 | 4,175 | 4,195 | 4,184 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශ ලක්ෂ | 559 | 471 | 1,030 | 749 | 691 | 1,440 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 88 | - | - | 84 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 129 | - | - | 124 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**සහල් නිෂ්පාදනයේ පසු අස්වනු තාක්ෂණය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, එමගින් වී වගාවේ ඵලදායීතාවය ඉහළ නැංවීමට ක්‍රියා කරන ලදි.** 2008 වසරේ දී රටේ ප්‍රධාන සහල් නිෂ්පාදන ප්‍රදේශවල සහල් සැකසුම් ගම්මාන පිහිටුවන ලදි. එමගින් පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් දියුණු කළ තාක්ෂණය භාවිතයට ගෙන ඉතා ඉහළ ගුණාත්වයෙන් යුතු සහල් නිෂ්පාදනය කිරීමෙන් ග්‍රාමීය ගොවි ජනතාවගේ ආදායම් වර්ධනය කිරීම අපේක්ෂා කෙරිණි. වසර තුළ දී වැඩිම අස්වැන්නක් වාර්තා කළ දිස්ත්‍රික්කවල ආදර්ශ සහල් සැකසුම් ගම්මාන 50 ක් පිහිටුවන ලදි. පසු අස්වනු තාක්ෂණ ආයතනය සහල් මෝල් නවීකරණ වැඩසටහන් 2008 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, රටේ විවිධ පළාත්වල සහල් මෝල් හිමියන් 292 දෙනෙකු පුහුණු කිරීමට කටයුතු කෙරිණි. පසු අස්වනු තාක්ෂණ ආයතනයේ සහයෝගය ඇතිව සහල් පිටි සැකසුම් කර්මාන්තය සංවර්ධනය කිරීමේ සහ සහල් ආශ්‍රිත නිෂ්පාදන ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ 2008 වර්ෂයේ දී අලුතින් සහල් පිටි සැකසුම් ඒකක 70 ක් පිහිටුවනු ලැබූ අතර, පවත්නා යන්ත්‍රෝපකරණ 65 ක් නවීකරණය කිරීම සිදු කරන ලදි.

**2008 වර්ෂයේ දී, පැලවත්ත හා සෙවනගල කර්මාන්තශාලා දෙකම එක්ව සීනි මෙට්‍රික් ටොන් 37,988 ක් නිෂ්පාදනය කිරීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව සීනි නිෂ්පාදනය සියයට 29 ක වර්ධනයක් පෙන්නුම් කළේය.** 2007 වසරේ දී සිදුවූ නිෂ්පාදනයේ පසුබෑමට සාපේක්ෂව 2008 වසරේ දී නිෂ්පාදනයේ සිදුවූ මෙම වර්ධනය සඳහා වගාවට ඉඩම් සැකසීමේ කටයුතු පවරාගැනීම, පොහොර හා තාක්ෂණික උපදෙස් සැපයීම මගින් හෙක්ටයාරයකින් ලබාගත හැකි සාමාන්‍ය ඵලදාව වැඩි කරගැනීම සඳහා මෙම කර්මාන්තශාලා අනුගමනය කළ උපායමාර්ග බොහෝ සේ බලපෑවේය. කෙසේ වෙතත්, 2008 වසරේ නිෂ්පාදනය ප්‍රමාණවත් වූයේ රටේ සමස්ත වාර්ෂික සීනි පරිභෝජන අවශ්‍යතාවයෙන් ආසන්න වශයෙන් සියයට 7 ක් සඳහා පමණි. 2015 වසරේ දී රටේ සමස්ත සීනි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 50 ක් සපුරාලීමේ අරමුණ ඇතිව රජය විසින් පෞද්ගලික වගාකරුවන්ට කහටගස්දිගිලිය, ඌවවෙල්ලස්ස සහ බිබිල වැනි ප්‍රදේශ වල උක් වගාව සඳහා අක්කර 90,000 ක් ලබාදීමට සැලසුම් කරමින් පවතී. මේ අතර, සීනි නිෂ්පාදනයේ දී උක් දඬුවල අවශේෂය විදුලි බල උත්පාදනය සඳහා භාවිත කිරීම මෙම කර්මාන්තශාලාවල නිෂ්පාදන පිරිවැය අඩුකිරීමට උපකාරී වූ අතර, එමගින් ඉතිරි වන අපද්‍රව්‍ය ජීව පොහොර නිෂ්පාදනය සඳහා ද යොදා ගන්නා ලදි.

**සීනි පර්යේෂණ ආයතනය පරතරයක් ඇතිව බීජ උක්දඬු සිටුවීමේ තාක්ෂණයක් දියුණු කළ අතර එය දේශීය සීනි සමාගම් වලට නිර්දේශ කළේය.** මෙම නව උක්දඬු සිටුවීමේ තාක්ෂණය යොදාගැනීමෙන් උක් වගාවට අවශ්‍ය උක් දඬු ලබාගැනීමේ වියදම සියයට 70 කින් පමණ අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. වසර තුළ දී සීනි පර්යේෂණ ආයතනය ඉහල අස්වනු ලබාදෙන වාණිජ උක් ප්‍රභේද දෙකක් වැඩි දියුණු කළ අතර, ඒවා දැනට භාවිතයේ ඇති පිළිගත් වාණිජ ප්‍රභේද වලට වඩා තත්ත්වයෙන් උසස් විය.

## වන සම්පත්

2008 වසරේ වනජීවී දෙපාර්තමේන්තුව, රජයේ ද, විදේශ සංවර්ධන හවුල්කාර ආයතන සහ පෞද්ගලික අංශයේ ද සහයෝගය ඇතිව වන සම්පත් අංශය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. ඒ අනුව, අනෙකුත් ව්‍යාපෘති අතර වන ජීවී සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් වන සම්පත් අංශයේ නඩත්තුව, කළමනාකරණය සහ නැවත වන වගා කිරීමේ කටයුතු සිදු කළේය. ඒ අනුව, හෙක්ටයාර 720 ක නැවත වගා කටයුතු සිදු කළ අතර, අක්කර 2,332 ක් පුරා පැතිරී ඇති නොමේරූ වගාවන් නඩත්තු කිරීමත් ඉලක්ක කළ පරිදි කිලෝ මීටර් 11,200 ක වන ප්‍රදේශයක සීමා නිර්ණය කිරීමේ හා සමීක්ෂණ කටයුතු සාර්ථකව සම්පූර්ණ කිරීමද සිදු කරන ලදි. තවද, දෙපාර්තමේන්තුව විසින් සිංහරාජ, නකල්ස්, දෙදියගල, නාකියාදෙණිය සහ කන්නෙලිය වැනි වනාන්තරවල ගස් කැපීම නවතාලමින් ස්වභාවික වන සම්පත ආරක්ෂා කර ගැනීමේ කටයුතු ශක්තිමත් කරන ලදි. පිළිවෙළින් හෙක්ටයාර 642 ක සහ 1,200 ක කෘෂි වන වගා බිම් ඇති කරමින් සහ ගෙවතු වගා සංවර්ධනය කරමින් පරිසර ආරක්ෂණය සඳහා ප්‍රජාවගේ සහභාගිත්වයට දෙපාර්තමේන්තුව විසින් අනුබල ලබාදිනි. වසර තුළදී පෞද්ගලික අංශයට අයත් වාණිජ වන වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 524 ක් දක්වා සියයට 3 කින් වැඩි විය.

## ධීවර

**කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 319 ක් වූ මෙතෙක් වාර්තාගත ඉහළම නිෂ්පාදන මට්ටමට ළඟාවෙමින් 2008 වර්ෂයේ දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 10 කින් වර්ධනය විය.** මෙම වර්ධනයෙන් සියයට 8.7 කට පමණ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය දායක වූ අතර, අභ්‍යන්තර ජලජීවී හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 15.9 කින් දායක විය. සියයට 6.6 කින් ඉහළ ගිය අක්වෙරළ / ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදන අංශය, මුහුදු මත්ස්‍ය නිෂ්පාදන අංශයෙහි වඩාත් සැළකිය යුතු වර්ධනයක් පෙන්වීය. ගැඹුරු මුහුදේ මත්ස්‍ය සම්පත් ගැවසෙන ස්ථාන පිළිබඳ තොරතුරු සැපයීමෙන් ධීවරයින් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට පෙළඹවීමට හැකිවීම සහ නැගෙනහිර පළාතේ ධීවර කටයුතුවල ප්‍රගතිය මෙම වර්ධනයට හේතු විය. වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 10.1 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීම සඳහා යහපත් කාලගුණ තත්ත්වය මෙන්ම අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් ඉක්මණින් යළි පදිංචි කිරීමේ කටයුතු නිසා නැගෙනහිර පළාතේ ධීවර කටයුතු වල සිදු වූ වර්ධනය ඉවහල් විය. අභ්‍යන්තර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 23 කින් පමණ ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, කාලීන ජලාශ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 10.9 ක වර්ධනයක් පෙන්නුම් කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් මගින් ජලාශ නිසි ලෙස කළමනාකරණය කිරීමත් විශාල වශයෙන් මත්ස්‍ය පැටවුන් වගාව සඳහා ලබාදීමත්ය. ප්‍රධාන වශයෙන්ම ඉහළ ගිය ඉන්ධන මිල ගණන් හේතුවෙන් මාළු සැපයුමේ ඇති වූ හිඟය නිසා වසරේ පළමු භාගයේ දී ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ මාළු මිල ගණන්, නැගෙනහිර පළාතේ ධීවර කටයුතු වැඩිදියුණු වීමත් සමඟ මාළු සැපයුමේ ඇති වූ වර්ධනය හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී අඩු වීමට පටන් ගැණිනි. මේ අතර, ඉස්සන් ඇති කිරීමේ කර්මාන්තයේ නිෂ්පාදනය සියයට 38 කින් පහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් බලපෑවේ සුදු පුල්ලි රෝගයයි. ඉස්සන් වගා කිරීමේ කර්මාන්තය තුළ ජලාශ වලට රෝගකාරක විෂබීජ විනාශ කිරීම සඳහා ක්ලෝරීන් එකතු කිරීමේදී දැරීමට සිදුවූ ඉහළ නඩත්තු පිරිවැය සහ ඉහළ ඉන්ධන පිරිවැය මේ සඳහා බලපෑවේය.

**මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති කිහිපයක් 2008 වසරේ දී සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කළේය.** ඒ අනුව හම්බන්තොට, අම්බලන්ගොඩ සහ හලාවත නව ධීවර වරායන් තුනක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදි. දික්ඕවිට ධීවර වරායේ මූලික කටයුතු, එනම්, ඉඩම් අත්පත් කරගැනීම, ඉඩම් පවරා ගැනීම සහ මූල්‍ය ගිවිසුම් අත්සන් කිරීම අවසන් කරන ලදි. ඉදිකිරීම් කටයුතු අවසාන කළ පසු දික්ඕවිට ධීවර වරාය ගොඩබිම් පහසුකම්, නැංගුරම්ලෑමේ පහසුකම් හා මුහුදේ දී ලබාදිය හැකි පහසුකම් වලින් සමන්විත ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමෙහි යෙදෙන යාත්‍රා වල අවශ්‍යතා සැපිරිය හැකි ශ්‍රී ලංකාවේ විශාලතම ධීවර වරාය වනු ඇත. එමගින්, විදේශ යාත්‍රා වලට පහසුකම් සැපයීමට හැකි වීම තුළින් ගැඹුරු මුහුදේ කෙළවල්ලන් සම්බන්ධ ධීවර කර්මාන්තය වර්ධනයට අවස්ථාව සැලසෙනු ඇත. පැලියගොඩ ධීවර වෙළෙඳපොළ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වසරේ අවසානය වන

**2.5 සංඛ්‍යා සටහන — මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| උප අංශය | 2007(අ) | 2008(ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 253 | 275 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 38 | 44 |
| එකතුව | 291 | 319 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය

විට ආරම්භ විය. මෙම නව වෙළෙඳ සංකීර්ණය, තොග සහ සිල්ලර වෙළෙඳාම් කටයුතු සඳහා මෙන්ම උසස් තත්ත්වයෙන් මත්ස්‍ය බෙදාහැරීමේ කටයුතු සඳහා ද ප්‍රමාණවත් පහසුකම් සපයමින් දිනකට මත්ස්‍ය මෙට්‍රික් ටොන් 500 ක් හැසිරවීමට ඉඩකඩ සලසයි. අයිස් නිෂ්පාදනාගාර හා ශීත ගබඩා දාමයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මෙට්‍රික් ටොන් 10 ක දෛනික නිෂ්පාදන ධාරිතාවක් සහිත බහාලුම් අයිස් නිෂ්පාදනාගාර 11 ක් පිහිටුවන ලද අතර, 2008 වසරේ දී මෙම නිෂ්පාදනාගාර වල නිෂ්පාදනය ආරම්භ විය. මෙයට අමතරව, මෙට්‍රික් ටොන් 10 ක ධාරිතාවක් සහිත බහාලුම් ශීතාගාර 12 ක් පිහිටුවන ලදි. තවද, බහුදින යාත්‍රා සඳහා මසුන් බහුලව ගැවසෙන කලාප ඉලක්ක කරමින් චන්ද්‍රිකා තාක්ෂණය පදනම් කරගෙන මත්ස්‍ය සම්පත් පිළිබඳ අනාවැකි පළ කිරීමේ ක්‍රමයක් ක්‍රියාවේ යොදවනු ලැබිණ.

**2009 සඳහා වූ අයවැය ලේඛනය තුළින් කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය.** ඵලඹෙන මහ කන්නයේ නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දුන් අතර ඇතැම් ආනයන සඳහා නව සෙස් බදු හඳුන්වා දීම හා පවත්නා සෙස් බදු අනුපාත වෙනස්කිරීම ද සිදුකරන ලදි. මේ අනුව, තිරිඟු පිටි මත සියයට 5 ක සෙස් බද්දක් ද අනෙකුත් ආකාරයේ ආනයනික ධාන්‍ය මත සියයට 15 ක සෙස් බද්දක් ද ඇතුළත් විය. දේශීය සහල් සහ වෙනත් ධාන්‍ය භාවිතය රට තුළ ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු විය. දේශීය වශයෙන් බඩ ඉරිඟු වගාකරන ගොවීන් දිරිගැන්වීමේ අපේක්ෂාවෙන් ආනයනය කරන ලද බඩ ඉරිඟු මත සියයට 25 ක සෙස් බද්දක් පනවන ලදි. තිරිඟු පිටි මත අය කරන ආනයන බද්ද සියයට 10 ක් දක්වා වැඩි කිරීම මගින් සහල් සහ වෙනත් ධාන්‍ය භාවිතය දිරිගැන්වීම ඉලක්ක කළේය. අර්තාපල් මත වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 15 සිට 20 දක්වා වැඩිකළ අතර, එමගින් දේශීය අර්තාපල් ගොවීන් දිරිගැන්වීම අපේක්ෂා කරන ලදි. 2010 වසරේ දී වර්තමාන පළතුරු නිෂ්පාදන මට්ටම ටොන් දශ ලක්ෂය දක්වා වැඩි කර ගැනීම සඳහා වන රජයේ සැලැස්මට අනුකූලව දේශීය පළතුරු අවශ්‍යතාවය හා පළතුරු අපනයන ඉල්ලුම සපුරාලීමට, තෝරා ගත් ආනයනය කරන පළතුරු වර්ග සඳහා දැනට පවත්නා සෙස් බදු අනුපාතික සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ දමන ලදි.

**රටේ කෘෂිකාර්මික අංශයේ නවෝදයක් ඇතිකිරීම දිරිගැන්වීම සඳහා සහන මිලට පොහොර ලබාදීම රජය විසින් 2008 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදි.** කිලෝ ග්‍රෑම් 50 ක මල්ලක් සඳහා ජාත්‍යන්තර පොහොර මිල ගණන් රුපියල් 6,000 ක් පමණ දක්වා වැඩි වී තිබියදීත්, රජය විසින් අඩු මිලට පොහොර ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදි. මෙම දිරි දීමනා ක්‍රමය යටතේ වී වගාව සඳහා අවශ්‍ය සියලුම වර්ගයේ පොහොර කිලෝ ග්‍රෑම් 50 ක මල්ලක් රුපියල් 350 ක් වැනි මිලකට ලබාදුන් අතර අක්කර 5 කට වඩා අඩු කුඩා තේ වතු හිමියන් හා රබර් වතු හිමියන් සඳහා යූරියා පොහොර කිලෝ ග්‍රෑම් 50 ක මල්ලක් රුපියල් 1,200 ක මිලකට ලබා දෙන ලදි. 2008 දී පොහොර සහන මිලට ලබා දීම සඳහා රුපියල් බිලියන 26 ක් වැය විය. කාබනික පොහොර හා වෙනත් පිදුරු වැනි ද්‍රව්‍ය පොහොර පිණිස භාවිත කරන ගොවීන් සඳහා අක්කරයකට පොහොර කිලෝ ග්‍රෑම් 50 ක මලු 3 ක් ගොවි සමිතිවල ඇපකරයක් මත ලබාදීමට 2009 වසර සඳහා වන අයවැය ලේඛනය මගින් අරමුදල් වෙන් කරන ලදි. මෙහිදී ගොවීන් විසින් වගා කිරීම සඳහා ලබාගත් පොහොර සඳහා වූ පිරිවැය ඔවුන් විසින් නැවත රජයට ගෙවීම සහතික කිරීම සඳහා වී වලින් කොටසක් රජයට විකිණිය යුතුය. මෙම ක්‍රමවේදය, වී වගාව සඳහා පොහොර අවශ්‍යතාවය ඇති එහෙත් මුදල් දුෂ්කරතා මත පොහොර මිලදී ගැනීමට නොහැකි ගොවීන්ට බාධාවකින් තොරව සිය වගා කටයුතු කරගෙන යාමට ආධාරයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2007 වසරේ දී ක්‍රියාත්මක කළ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුගතව කෘෂිකාර්මික සංවර්ධන හා ගොවි කටයුතු අමාත්‍යාංශය විසින් 2008 වසර තුළදී, කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩිකිරීම, තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සහතික කිරීම, ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම, කෘෂිකර්මය සඳහා වැඩි දියුණු කළ තාක්ෂණයන් ප්‍රචලිත කිරීම සහ කෘෂි නිෂ්පාදන පදනම් කරගත් කර්මාන්ත වැඩි දියුණු කිරීම ආදිය අරමුණු කරගත් ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබිණ.** ඉහත අරමුණු සඳහා 2003 අංක 22 දරණ බීජ පනත යටතේ 2008 දී "ජාතික බීජ සභාවක්" පිහිටුවන ලද අතර, "ගමින් ගමට" සහ "ගෙයින් ගෙයට" මැයෙන් ගෙවතු වගා දිරිමත් කිරීම සඳහා දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී. මේ අතර, තෙත් කලාපයේ පුරන් වූ කුඹුරු වගාකිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් සහ නිෂ්පාදනය දිරි ගැන්වීම සහ කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම සඳහා ව්‍යාපෘති ද ක්‍රියාවට නංවන ලදි. තෝරා ගත් ස්ථානවල පස සංරක්ෂණය සඳහා ව්‍යාපෘතියක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලදි.

**උද්‍යාන බෝග වගා අංශයේ දෙමුහුන් ප්‍රභේද කිහිපයක් වර්ෂය තුළදී හඳුන්වා දෙන ලදි.** මෙම අරමුණ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්, ව්‍යාප්ති සේවාවන්

සහ බීජ නිෂ්පාදනය සහ තත්ත්ව වැඩිදියුණු කිරීම් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ, *"හාතියා"* සහ *"මහේෂි"* යනුවෙන් නව දෙමුහුන් තක්කාලි ප්‍රභේද දෙකක් සහ ඉහළ පරිසර උෂ්ණත්වයට ඔරොත්තු දෙන ඉහළ ඵලදාවක් සහිත *KC - 1* නම් තවත් තක්කාලි ප්‍රභේදයක් ද නිකුත් කෙරිණි. වෙනත් ක්ෂේත්‍ර වගා අංශයේ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ඉහළ ඵලදාව සහිත අමු මිරිස් සහ වියළි මිරිස් යන දෙවර්ගයම නිෂ්පාදනය කළහැකි මිරිස් ප්‍රභේදයක් හඳුන්වා දෙන ලදි. මෙමගින් හෙක්ටයාරයකට අමුමිරිස් ටොන් 12 ත් 15 ත් අතර ඵලදාවක් හා වියළි මිරිස් හෙක්ටයාරයකට ටොන් 3 ක ඵලදාවක් ලබාගතහැකි වෙතැයි අපේක්ෂා කෙරේ. කෙටිකාලීන සාමාන්‍ය වගාව සඳහා (දින 65 -70) "*අනුරාධා*" නමින් උඳු ප්‍රභේදයක් ද හඳුන්වා දෙන ලදි.

**ප්‍රධාන වශයෙන් කිරි ගව පාලනය සහ කුකුල් පාලනය යන කර්මාන්තයන්ගෙන් සමන්විත පශු සම්පත් අංශය වර්ෂය තුළදී මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** 2008 දී මුළු එළකිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 172.4 දක්වා සියයට 1.6 කින් වර්ධනය වී ඇති බව ඇස්තමේන්තුකර ඇති අතර, එහිදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදනය පෙර වර්ෂයේ නිෂ්පාදනය වූ කිරි ලීටර් දශ ලක්ෂ 1.8 ට සාපේක්ෂව මෙම වසරේ දී ලීටර් දශලක්ෂ 3.9 ක් දක්වා ඉතා ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. මෑදි කාලයේ දී ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කිරීමේ වර්තමාන ප්‍රතිපත්ති රාමුව යටතේ කිරි නිෂ්පාදනය වැඩිකිරීම සඳහා වන රජයේ උත්සාහයට අනුගතව වඩා හොඳ කළමනාකරණ භාවිතයන් හඳුන්වාදීම සහ කිරිදෙනුන් ගේ තත්ත්වය නිරතුරුව උසස්කිරීම හරහා මෙම ප්‍රගතිය අත්පත් කරගනු ලැබිණි. තවදුරටත් වසර තුළ පෞද්ගලික අංශය සමග ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපළවල් තුළ හවුල් ව්‍යාපාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපත්ති තීරණයකට එළඹි අතර, මිල්කෝ සමාගම විසින් පොළොන්නරුවේ පිහිටි ඉන්ටර්නැෂනල් ඩෙයිරි ප්‍රඩක්ට්ස් ලිමිටඩ් යන ආයතනය පවරා ගන්නා ලදි. නීත්‍යානුකූල නොවන ගව ඝාතනය සහ ප්‍රවාහනය සඳහා 2008 අයවැය ලේඛනය තුළින් හඳුන්වා දෙනු ලැබූ දඩය රුපියල් 50,000 දක්වා ඉහළ දැමුණු අතර එමගින් කිරි නිෂ්පාදනය දිරිගැන්වීමට අපේක්ෂා කෙරිණි. 2009 සඳහා වූ අයවැය ලේඛනය තුළින් ආනයනික කිරිපිටි සඳහා විශේෂ වෙළෙඳභාණ්ඩ බද්ද රුපියල් 5 සිට 15 දක්වා වැඩිකිරීමට ද යෝජනා කළ අතර, කිරි ගවයින් ඝාතනය කිරීම මුලිනුපුටා දැමීම සඳහා කැපවූ ආයතන සඳහා සහාය වීමට අරමුදල් වෙන්කරන ලදි. මෙම සියලුම ක්‍රියාමාර්ග තිබියදීත් වර්තමාන මුළු එළ කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් වනුයේ පුද්ගලයෙකුගේ වර්තමාන දිනක කිරි අවශ්‍යතාවය මිලි ලීටර් 110 ක් ලෙස ගත්විට ජාතික කිරි අවශ්‍යතාවයෙන් සියයට 26 කට පමණි. මෙම තත්ත්වය, දේශීය කිරි නිෂ්පාදනය සඳහා පවත්නා සම්පත් ප්‍රමුඛතා පදනමක් මත යොමුකිරීමේ ඇති වැදගත්කම අවධාරණය කරනු ලබයි. තවද, වසර තුළ කිරි ලීටරයක් මිලදී ගැනීම සඳහා ගෙවන ලද මිල රුපියල් 29.50 ක් ලෙස සියයට 40 කින් පමණ වැඩි කරමින් කිරි එකතු කරන මධ්‍යස්ථානවලට කිරි රැගෙන ඒමට දේශීය කිරි ගොවීන් පෙළඹවීම ද සිදු විය.

**2008 වර්ෂයේ දී සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් කිරි ගවපාලන අංශය වේගයෙන් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තියට අනුගතව විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.** පශු සම්පත් (කිරි ගවපාලන) බෝකිරීමේ ව්‍යාපෘතිය, රටේ ගවයින් සංඛ්‍යාව වැඩිකිරීම ඉලක්ක කිරීම, කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හා නඩත්තු කිරීම සහ කෘත්‍රිම සිංචන සේවා ක්‍රියාත්මක කිරීම, ස්වාභාවික බෝ කිරීමේ වැඩසටහන් සහ තණ බිම් සංවර්ධනය කිරීමේ වැඩසටහන්ද මේ යටතේ ක්‍රියාත්මක විය. වැස්සි පැටවි ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩි දියුණු කළ වැස්සි පැටවි 8,778 ක් ගොවීන් අතර බෙදා දෙනු ලැබීය. මෙයට අමතරව, පශු සම්පත් ගොවීන්ට අවශ්‍ය කරන ආයතනික සහයෝගය සහතික කිරීමේ අරමුණින්, නව පශු වෛද්‍ය විමර්ශන මධ්‍යස්ථාන හම්බන්තොට, කෑගල්ල, මාතලේ, නුවරඑළිය, අම්පාර, ත්‍රිකුණාමලය හා හෝමාගම යන ප්‍රදේශ වල පිහිටුවනු ලැබීය.

**2.6 සංඛ්‍යා සටහන**

**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| උප අංශය | 2007(අ) | 2008(ආ) |
|---|---|---|
| 1. ජාතික ගවයන් සංඛ්‍යාව (දශ ලක්ෂ) | 1.5 | 1.5 |
| එළ ගවයන් | 1.2 | 1.2 |
| මී ගවයන් | 0.3 | 0.3 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ) | 202.0 | 208.1 |
| එළ කිරි | 169.7 | 172.4 |
| මී කිරි | 32.3 | 35.7 |
| 3. කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ) | 12.1 | 13.5 |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 21.00 | 29.53 |
| 5. ජාතික බිත්තර නිෂ්පාදනය (දශ ලක්ෂ) | 915.6 | 1,039.8 |
| 6. ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 100.1 | 101.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**විශේෂ සටහන 3**

**කෘෂි බෝග සහ දියර කිරි සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ කිරි නිෂ්පාදන අංශයේ සංවර්ධනය**



ශ්‍රී ලංකාව තුළ නූතන ක්‍රමවලට අනුව කිරි නිෂ්පාදන අංශය දියුණු කිරීමෙන් ග්‍රාමීය දිළිඳු ජනතාවට එකතු කළ අගය සහිත ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය වේ. එයින් දේශීය කෘෂිකර්මාන්තය විවිධාංගිකරණයට ලක්වන අතරම පුළුල් ලෙස පැතිරුණු කෘෂිකර්මය මුල් කරගත් ගෘහ කර්මාන්ත ඇති වනු ඇත. දියුණු කළ ආරයන්ට අයත් කිරි ගවයින් යොදා ගැනීම, පෝෂ්‍යදායී ගව ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සහ කිරි නිෂ්පාදන පහසුවෙන් අලෙවි කිරීම සඳහා ශක්තිමත් වෙළෙඳපොළක් ඇති කිරීම ආදිය එවැනි දියුණු කිරි නිෂ්පාදන අංශයක් සඳහා පූර්ව අවශ්‍යතාවයන් වේ.

ආදායම් මට්ටමේ ඉහළ යාමත් සමග තිරසාර ලෙස කිරි ආශ්‍රිත නිෂ්පාදනවල පරිභෝජනය ඉහළ ගියත් ඊට සමගාමීව දේශීය කිරි නිෂ්පාදනයේ වර්ධනයක් සිදු නොවීය. සාමාන්‍ය දේශීය මුළු කිරි අවශ්‍යතාවයෙන් හතරෙන් එකකට අඩු ප්‍රමාණයක් දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබා ගනී. පැතිරුණු ශීතාගාර සේවාවන්හි හිඟකම නිසා සියලුම ආනයනික කිරි නිෂ්පාදන මූලික වශයෙන් ලබා ගැනීමට සිදු වී ඇත්තේ වියළි කිරි පිටි වශයෙනි.

රට තුළ කිරි නිෂ්පාදන අංශයේ සංවර්ධනය සඳහා පහත සඳහන් සම්බාධක පවතින බව මෑතක දී කරන ලද සමීක්ෂණයකට අනුව හඳුනාගෙන ඇත.

* කිරි එළදෙනුන්ගේ අඩු ඵලදායකත්වය.
* ඉහළ නිෂ්පාදන පිරිවැය හා සසඳන විට කිරි සඳහා අඩු මිලක් පැවතීම.
* ව්‍යාප්ති සේවාවන් මනා ලෙස සිදු නොවීම සහ සත්ව සෞඛ්‍යය පිළිබඳව ගොවීන් අතර ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම.
* ශුද්ධ ආදායමේ අඩු මට්ටම නිසා කිරි නිෂ්පාදන අංශයේ නව ආයෝජනය අඩු වීම.
* වෙළෙඳපොළ පහසුකම් නොමැති වීම සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන පහසුකම් ප්‍රමාණවත් නොවීම.
* කිරි එක්රැස් කිරීමේ ජාලයේ සංවර්ධනය සඳහා නව තාක්ෂණය යොදා ගැනීමේ අසාර්ථක බව.
* කිරි පිටි සඳහා පාරිභෝගිකයින්ට තිබෙන කැමැත්ත ස්ථායීව පැවතීම සහ දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා එවැනි කැමැත්තක් නොමැතිකම.

2007 වර්ෂයට පෙර විදේශවලින් ආනයනය කරන ලද කිරි පිටිවල මිල ගණන් සාපේක්ෂ ලෙස පහළ මට්ටමක පැවති නිසා ශ්‍රී ලංකාවේ දේශීය කිරි නිෂ්පාදන අංශයේ ආයෝජනය සඳහා විශේෂ දිරිගැන්වීමක් නොපැවතුණි. 2007 වර්ෂයේ දී ආනයනය කරන ලද කිරි පිටි මිල ඇතුළු වෙළෙඳ භාණ්ඩවල මිල උද්ධමනය හේතුවෙන් දේශීය කිරි නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාවක් ඇති විය. ඒ තුළින් කිරි නිෂ්පාදනය සඳහා හිතකර පරිසරයක් ද ගොඩනැගී ඇත. එසේ වුවත් එවැනි ආයෝජන තිරසාර වන්නේ එම අංශයේ ඵලදායීතාවය වර්ධනය වන්නේ නම් පමණි. එයට හේතුව භාණ්ඩ මිළ ඉහළ පහළ යාමේ සාමාන්‍ය උපනතිය වන්නේ එක් අවස්ථාවක ඉහළ යන මිල තවත් අවස්ථාවක පහළ යෑමට ඉඩ තිබීමයි.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත රජය විසින් 2008 අයවැය යෝජනා මගින් කිරි නිෂ්පාදන අංශය සඳහා විශේෂිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. කෘෂි බෝග සහ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (ALDL) නමින් මෙය 2008 අප්‍රේල් මාසයේ දී ක්‍රියාත්මක කරන ලදි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා ගව පාලන ව්‍යාපෘති සහ කිරි හා කෘෂි බෝග සැකසුම් කර්මාන්තය සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් රුපියල් දශ ලක්ෂ 5000 ක මුදලක් ප්‍රදානය කිරීමට නියමිතය. පොලී සහනාධාර ගෙවීමට සුදුසු අය වෙත සහන පොලී අනුපාතික යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් මෙම අරමුදල් ප්‍රදානය කරයි. ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයන් සංඛ්‍යා සටහන වි.ස. 3.1 හි සාරාංශ කර ඇත.

මෙම ණය යෝජනා ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වන්නේ මෙය ණය ලබා දීමට පමණක් සීමා නොවීමයි. කිරි නිෂ්පාදන ගොවීන්ට මෙන්ම කිරි ආශ්‍රිත සැකසුම් කරුවන්ට ණය මුදල් ප්‍රදානය කිරීම තුළින් කිරි නිෂ්පාදන කර්මාන්තයේ අගය වැඩි කිරීමත් වෙළෙඳපොළ ගැටළු සහ කිරි ආශ්‍රිත සැකසුම් පහසුකම්වල අඩුපාඩු ඉවත් කිරීමත් මේ යටතේ සිදු වේ. කිරි නිෂ්පාදන ගොවීන්ගේ කිරි සඳහා වෙළෙඳපොළ ස්ථාපිත කිරීමේ අරමුණින් කිරි ආශ්‍රිත සැකසුම් කරුවන් ණය ලබා ගැනීමේ දී කිරි නිෂ්පාදන ගොවීන් සමඟ ඉදිරි වෙළෙඳ ගිවිසුම්වලට එළඹිය යුතුය. කුඩා පරිමාණ කිරි ගොවීන් සඳහා ණය ලබා දීමේ දී සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් විසින් සෑම අයදුම්කරුවෙකුම පිළිගත් සත්වපාලන පරිචයන් අනුගමනය කරන බවට සහතික කළ යුතු බව එක් කොන්දේසියකි.

අඩු ව්‍යාප්ති සේවා සම්බන්ධ ගැටළු සඳහා ද විසඳුම් ලබා දීමේ අරමුණින් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සම්පත් දායකයින් ලෙස පශු වෛද්‍ය නිලධාරීන්ගේ සේවාව ලබා ගනිමින් කිරි නිෂ්පාදන ගොවීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහන්වලදී ගව ආහාර හා සත්ව පෝෂණය, ගව රෝග, කෘතිම සිංචනය, ගව පැටවුන්

සංඛ්‍යා සටහන වි.ස. 3.1

**කෘෂි බෝග සහ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධන කිරීමේ ණය යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණ**

| ණය ලබා දෙනු ලබන අරමුණ | උපරිම ණය ප්‍රමාණය (රු.) | ණය පොලී අනුපාතිකය | පොලී සහනධාරය | ණය ලබා දීමට සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවයන් | ණය ආපසු ගෙවීමේ උපරිම කාලය-වර්ෂ |
|---|---|---|---|---|---|
| * ගව මඩු ඉදිකිරීම<br>* ගවයින් මිලදී ගැනීම<br>* ගවයින්ට අවශ්‍ය බෙහෙත්, පශු වෛද්‍ය සේවාවන් සහ අවශ්‍ය ආහාර මිලදී ගැනීම<br>* තෘණ සහ වෙනත් ගව ආහාර වර්ග වගාව<br>* ගව ආහාර වර්ග ගොවිපල දක්වා පරිවහනය කිරීමට අවශ්‍ය අත් ට්‍රැක්ටර් මිලදී ගැනීම<br>* ජීව වායු ටැංකි ඉදිකිරීම<br>* පශු වෛද්‍ය නිලධාරීන් අනුමත කරනු ලබන වෙනත් ඕනෑම අවශ්‍යතාවයක් සඳහා | 400,000 | 12% | 8% | | 5 |
| දියර කිරි සැකසීම සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සැකසීම | රු.ද.ල. 300 | 14% | 5% | ගොවීන්ගේ කිරි මිලදී ගැනීම සඳහා ගොවීන් 1,000 සිට 10,000 දක්වා ප්‍රමාණයක් සමග ඉදිරි වෙළෙඳ ගිවිසුම්වලට එළඹිය යුතුයි. | 5 |
| කෘෂි ද්‍රව්‍ය පදනම් කරගත් සහ කෘෂි ද්‍රව්‍ය ආශ්‍රිත සැකසුම් කර්මාන්ත | රු.ද.ල. 300 | 14% | 5% | ගොවීන්ගේ කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ගොවීන් 1,000-10,000 දක්වා ප්‍රමාණයක් සමග ඉදිරි වෙළෙඳ ගිවිසුම්වලට එළඹිය යුතුයි. | 5 |
| සැකසුම් කර්මාන්තය සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් පුළුල් කිරීම | රු.ද.ල. 300 | 14% | 5% | ගොවීන්ගේ කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ගොවීන් 1,000-10,000 දක්වා ප්‍රමාණයක් සමග ඉදිරි වෙළෙඳ ගිවිසුම් වලට එළඹිය යුතුය. | 5 |

රක බලා ගැනීම, හොඳ තත්ත්වයේ කිරි නිෂ්පාදනය, ගොවිපල කළමනාකරණය සහ ජීව වායු උත්පාදනය යන මාතෘකා යටතේ ගොවීන් සමඟ සාකච්ඡා පවත්වනු ලැබේ. මේ සඳහා වැය වන සම්පත් ආයක පිරිවැය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ආපසු ලබා දෙනු ලබයි. තවද පශු වෛද්‍ය නිලධාරීන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන කරනු ලබන ගෙවීම් ද ආපසු ලබා දෙනු ලැබේ. ගවයින් ප්‍රමාණය වැඩි කිරීම සහ සතුන්ගේ නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් කරනු ලබන කෘතිම සිංචන කටයුතු සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සත්ව පාලන සංවර්ධන නිලධාරීන්ට දිරි දීමනා ගෙවීම් කරනු ලැබේ. ගව ආහාර වගාව සහ ජීව වායු ටැංකි ඉදිකිරීම සඳහා ද සත්ව පාලන සංවර්ධන නිලධාරීන් වෙත දිරි දීමනා ගෙවීම් කරනු ලැබේ.

**2008 වසර තුළදී කුකුල් මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 101,500 ක් දක්වා සියයට 1.4 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරන ලදි.** මේ සඳහා දේශීය හා විදේශීය සත්ත්ව ආහාරවල මිල ගණන් ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස, සත්ත්ව නිෂ්පාදන පිරිවැය, පසුගිය වසර තුළ පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 172-190 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 197-225 දක්වා ඉහළ යෑම ප්‍රධාන වශයෙන් බලපාන ලදි. ඉහළ නිෂ්පාදන පිරිවැයක් පැවැතියදීත් 2008 වසර තුළදී බිත්තර නිෂ්පාදනය සියයට 14 ක සැළකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදි.

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව තුළ බෝවීමට ඉහළ අවදානමක් ඇති "කුරුළු උණ" රෝගයෙන් රටට ඇති තර්ජනය මැඩ පැවැත්වීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් වසර තුළදී ගන්නා ලදි.** කුරුළු උණ රෝගයට එරෙහිව වසර තුළදී ක්‍රියාවට නැංවූ ජාතික පර්යේෂණ වැඩසටහන යටතේ එක් රැස්කළ නියැදි ශ්‍රී ලංකාව තුළ කුරුළු උණ කාරක වෛරස (උදා: H5 H7) ඇති බවට සාක්ෂි නොමැතිබව තහවුරු කරන ලදි. කුරුළු වෛරස් ආසාදන පැය 6 ක් වැනි කෙටිකාලයක් තුළ ඉක්මන් රසායනාගාර රෝග පරීක්ෂාවන් මගින් තීරණය කළහැකි රැපිඩ් රියල් ටයිම් පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (Rapid Real time PCR) වැනි වඩා දියුණු රෝග නිර්ණය කිරීමේ තාක්ෂණික ක්‍රමයක් පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් මෙම වසර තුළ ස්ථාපිත කරන ලදි. තවද, ශ්‍රී ලංකාව තුළ කුරුළු උණ රෝගය පැතිරී ගියහොත් එහි ප්‍රතිඵලයක් ලෙස කුකුළු පාලන හිමියන්ට වන හානි පූර්ණය සඳහා ගෙවීම් සිදු කිරීමට ද තීරණයක් ගන්නා ලදි.

**කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය වර්ධනය කිරීමට සහ නිමැවුම ඉහළ දැමීමට තවදුරටත් අංශ ගණනාවක් කෙරේ අවධානය යොමුකිරීම අවශ්‍ය වේ.** බිංදු ජල වැස්සුම් සහ ආරක්ෂිත ගෘහ තුළ කෘෂි වගා වැනි වැඩිදියුණු කරනලද ජල කළමනාකරණ තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සහ දෙමුහුන් බීජ සහ ජානමය වෙනස්කම් කරන ලද බීජ භාවිතය වැනි ඉහළ තාක්ෂණික ක්‍රම යොදා ගන්නා අතරතුර ශ්‍රම බලකායේ කුසලතාවයන් වැඩිදියුණු කිරීමට උනන්දු කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නංවාගත හැකි වේ. වී වගාව සහ අනෙකුත් කෘෂි ධාන්‍ය වගාවන්ට ඇති ඉහළ ශ්‍රම ආයකත්වය රට තුළ ආන්තික ශ්‍රම ඵලදායීතාව ඉහළයාමට බාධාවක්ව පවතී. එම නිසා, අතිරික්ත ශ්‍රමය අනෙකුත් අංශ කරා හුවමාරු වීමට අවස්ථාවක් සැලසීම තුළින් මානව සම්පත වඩාත් සඵල ලෙස කළමනාකරණය කිරීමට හැකිවන අතර එමගින් ආන්තික ශ්‍රම ඵලදායීතාවය ඉහළ නංවා ගත හැකිවේ. මෙම අරමුණ සඳහා, සාමූහික ගොවිතැන හා පෞද්ගලික අංශයේ ගොවිතැන දිරි ගැන්වීම හරහා යැපුම් කෘෂි කර්මාන්තයේ සිට වාණිජ කෘෂි කර්මාන්තය වෙත විතැන් වීම පූර්ව අවශ්‍යතාවයක් වේ. මේ සඳහා, ඉඩම් හිමිකම් පිළිබඳ නීතිමය තත්ත්වය ලිහිල් කිරීම, ගොවි සංවිධාන/සමිතිවල කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීම සහ යන්ත්‍ර සූත්‍ර භාවිතය වේගයෙන් ව්‍යාප්ත කිරීම යනාදිය වැදගත් වේ. එමෙන්ම, ආරක්ෂිත තොග පවත්වාගෙන යාමේ යාන්ත්‍රණයක් ඇති කිරීම වැනි ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ ඵලදායීතා වර්ධනයේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා නිවැරදි අලෙවිකරණ ක්‍රමවේදයන් පැවැතීම ද අවශ්‍ය වේ. තවද, ඒකාබද්ධ කෘෂිකර්මාන්තය (උදා: පොල් වගාවන් තුළ සතුන් ඇති කිරීම) සහ අන්තර් බෝග වගාව (උදා: අන්නාසි, කොකෝවා සහ කුරුඳු යනාදිය පොල් ඉඩම් තුළ වගාකිරීම) ජනප්‍රිය කරවීමද මේ යටතේ වැදගත් ක්‍රමෝපායයන් ලෙස සැලකිය හැකිය. රාජ්‍ය අංශයේ ගොවිපළ වල සහ වැවිලි සමාගම් වැඩිදියුණු කිරීම සඳහා දිගුකාලීන කළමනාකරණ ගිවිසුම් වලට එළඹීමට පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම තුළින් රාජ්‍ය ගොවිපළවල් හා වතුවල තත්ත්වය වැඩි දියුණු කළ හැකි අතර, ආහාර සැකසුම් කර්මාන්ත වැනි එකතු කළ වටිනාකම් ඇති කර්මාන්ත ප්‍රවර්ධනය මගින් පසු අස්වනු තාක්ෂණයන් වැඩි දියුණු කිරීම ද සිදුකළ හැකිය.

## කාර්මික අංශය

**පසුගිය වර්ෂයේ වූ සියයට 7.6 ක වර්ධනය හා සසඳන කල 2008 වර්ෂය තුළ කාර්මික අංශය මගින් එකතු කළ වටිනාකම සියයට 5.9 කින් වර්ධනය විය.** මේ යටතේ ගැනෙන උප අංශ හතරම එනම් පතල් සහ කැණීම්, නිෂ්පාදන කර්මාන්ත, විදුලි බලය, ගෑස් සහ ජලය හා ඉදිකිරීම් අංශ මෙම වර්ධනයට සක්‍රීය ලෙස දායක විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2008 වර්ෂයේ කාර්මික අංශයේ දායකත්වය ඉකුත් වර්ෂයේ වූ සියයට 28.5 මට්ටමේ සිට සියයට 28.4 දක්වා ආන්තික වශයෙන් අඩු වීමක් පෙන්නුම් කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල සැකසුම්, කර්මාන්තශාලා නිෂ්පාදන හා ගෘහ කර්මාන්තවලින් සංයුක්ත වන නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ දායකත්වය 2007 වසරේ වූ සියයට 17.7 සිට සියයට 17.5 දක්වා අඩු වීමයි. විදුලි බලය, ගෑස් සහ ජලය උප අංශයේ දායකත්වය 2007 වසරේ වූ සියයට 2.5 සිට 2008 වසර තුළ සියයට 2.4 දක්වා ආන්තික වශයෙන් අඩු විය.

**සමස්ත කාර්මික නිමැවුමෙන් සියයට 55 කට පමණ දායකත්වය සපයන කර්මාන්තශාලා නිෂ්පාදන අංශය, 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 6.7 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 5.0 කින් වර්ධනය විය.** මෙම වර්ධනය, ප්‍රධාන වශයෙන් ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත; රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත හා සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර හා ප්‍රවාහන උපකරණ යන ප්‍රධාන කාණ්ඩයන් පහේ ඇති වූ ප්‍රසාරණය මගින් සිදුවිය. 2008 වර්ෂයේ දී ප්‍රධාන අපනයන රටවල ආර්ථිකයන්හි ඇති වූ පසුබෑසීමත්, වැටුප්, බලශක්ති, ඉන්ධන සහ පොලී පිරිවැය ඇතුළු නිෂ්පාදන පිරිවැය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් තරගකාරීත්වය විශාල ලෙස අඩු වීමත්, අඛණ්ඩව දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමත් නිසා සාපේක්ෂ වශයෙන් දේශීය ඉල්ලුම අඩුවීම හේතුකොට ගෙන කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරීත්වය මන්දගාමී විය.

**2008 වර්ෂයේ දී කර්මාන්තශාලා නිමැවුම ළඟා කර ගැනීමට දේශීය මෙන්ම අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත ඉහළ දායකත්වයක් ලබා දුනි.** ආයෝජන මණ්ඩලයට අයත් සහ ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තශාලා සමස්ත නිමැවුමෙන් සියයට 97 කට දායකත්වය සැපයූ අතර, ඉතිරි ප්‍රමාණයට රාජ්‍ය අංශයේ කර්මාන්ත විසින් දායකත්වය සපයන ලදි.

**විශේෂයෙන් 2008 වසරේ අග භාගය වන විට අහිතකර ගෝලීය ආර්ථික සහ වෙළෙඳපොළ තත්ත්වයන් මෙන්ම චීනය, ඉන්දියාව, බංගලාදේශය, වියට්නාමය සහ කාම්බෝජය වැනි අඩු පිරිවැයක් යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරන රටවලින් ඇති වූ ඉහළ තරගකාරීත්වය ප්‍රධාන වශයෙන් බලපෑම නිසා අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත දුර්වල ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.** කෙසේ වෙතත්, අපනයන නැඹුරුකරගත් කර්මාන්තවලට නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTAs) යටතේ සහ වෙළෙඳ වරණයන් පිළිබඳව වූ පොදු ක්‍රමය (GSP +) යටතේ ලැබුණු ප්‍රතිලාභ අඛණ්ඩව ලැබීම නිසා අපනයන මත වූ අහිතකර බලපෑම අඩු කර ගැනීමට හැකිවිය. අපනයන වෙළෙඳපොළෙහි තරගකාරිත්වය පවත්වා ගැනීම සඳහා ඉහළ ගුණත්වයක් පවත්වා ගනිමින් ආකර්ෂණීය මෝස්තර අනුව නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම, නිෂ්පාදිත කලට වේලාවට වෙළෙඳපොළට සැපයීම, විවිධ වෙළෙඳපොළවල් ඉලක්ක කිරීම, ඵලදායිතාවය වර්ධනය කිරීම සහ පිරිවැය අඩුකිරීමේ ක්‍රමෝපායයන් අනුගමනය කිරීම වැනි ප්‍රධාන උපාය මාර්ගයන් කර්මාන්තකරුවන් විසින් ගනු ලැබීය. එමෙන්ම, රජය සහ අදාළ ආයතන විසින් අපනයන වෙළෙඳපොළ නැඹුරුකරගත් කර්මාන්ත දියුණු කිරීමට සහයෝගය දක්වන ලදි.

**අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත අතුරෙන්, රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදිත අංශය 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 7.3 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 3.1 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.**

**2.7 සංඛ්‍යා සටහන**

**කර්මාන්තයන්හි එකතු කළ අගය (2002 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රු. දශ ලක්ෂ | | ප්‍රතිශත වෙනස(%) | |
|---|---|---|---|---|
| | 2007 | 2008(අ) | 2007 | 2008(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 166,101 | 174,794 | 6.6 | 5.2 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 84,603 | 87,215 | 7.3 | 3.1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,061 | 1,085 | 3.4 | 2.3 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 1,503 | 1,565 | 8.5 | 4.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 55,140 | 58,650 | 6.6 | 6.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 14,547 | 15,306 | 6.3 | 5.2 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 930 | 958 | 2.6 | 3.0 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 30,011 | 31,702 | 5.8 | 5.6 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 1,715 | 1,940 | 9.7 | 13.1 |
| **එකතුව** | **355,611** | **373,215** | **6.7** | **5.0** |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මූලික වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයේ රටවල ඇති වූ ආර්ථික පසුබැසීම් හේතුවෙන් අපනයන වෙළෙඳපොළ තුළ ඉල්ලුම ශීඝ්‍ර ලෙස අඩුවීම, දේශීය වශයෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම මධ්‍යයේ පිරිවැය අඩු භාණ්ඩ නිෂ්පාදනය කරන රටවලින් ඇති වූ තරගකාරීත්වය ද මෙම මන්දගාමී වර්ධනයට හේතුවිය. ගෝලීය මූල්‍ය අර්බුදය තීව්‍ර වීමත් සමගම මිල අඩුකිරීම් අපේක්ෂා කළ අතර, ප්‍රධාන ගැනුම්කරුවන් විසින් ඉදිරි ඇණවුම් ස්ථිර කිරීමේ දී වැඩි අවධානයක් යොමුකරන ලදී. මෙවැනි පරිසරයක් තුළ, ඇඟළුම් කර්මාන්තයේ ප්‍රමුඛයන් පවා සිය තරකාරිත්වය පවත්වා ගැනීම සඳහා තම මෙහෙයුම් කටයුතු ඒකාබද්ධ කිරීමටත්, අතිකාල හා වැටුප් පිරිවැය අඩුකිරීමටත් යොමුවිය. කෙසේ වුවද, 2009 වසරේ සිට ඉදිරි වසර 3 ක් සඳහා වෙළෙඳ වරණයන් පිළිබඳ වූ පොදු ක්‍රමය (GSP+) හරහා සැපයෙන තීරු බදු සහනය රඳවා ගැනීමට හැකිවීම තුළින් යුරෝපා සංගමයේ වෙළෙඳපොළ තුළ ඇතිවන අවිනිශ්චිතතාවය යම්තාක් දුරකට අඩු විය.

ඇඟළුම් නිෂ්පාදකයන් විසින් අනාගත අභියෝගයන්ට මුහුණදීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඇඟළුම් කර්මාන්තයෙහි ප්‍රමුඛයන් විසින් ප්‍රචලිත ගෝලීය වෙළෙඳපොළ වර්ධනයන්ට ප්‍රතිචාර දැක්වීමට හරිත හා පරිසර හිතකාමී නිෂ්පාදන යාන්ත්‍රණයන් වෙළෙඳපොළට හඳුන්වා දෙනු ලැබීය. මෙම පරිසර හිතකාමී නිෂ්පාදන යාන්ත්‍රණ සඳහා බලශක්තිය අඩුවෙන් පරිභෝජනය කිරීම, ජල සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ අඩුවෙන් කාබන් විමෝචනය සිදු කිරීම යනාදී අන්තර්ජාතිකව පිළිගත් ප්‍රමිතීන් අයත් වේ. වසර තුළ දී, ග්‍රාමීය තාරුණ්‍යය ඉලක්ක කොටගෙන තොරතුරු තාක්ෂණය, රෙදිපිළි සැකසුම්කරණය හා මහන මැෂින් ක්‍රියාකරවීම වැනි රැකියා පිළිබඳ පුහුණුවක් ලබාදීමේ අරමුණින් MAS තුල්හිරිය රෙදිපිළි කලාපයේ MAS කළමනාකරණ තාක්ෂණික ආයතනය විවෘත කරන ලදි. ඇඟළුම් කර්මාන්තයෙහි පුරෝගාමීන් විසින් ඔවුන්ගේ කම්හල් අසල්වැසි රටවලට ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, 2008 වර්ෂයේ දී ඇඟළුම් නිෂ්පාදිත කර්මාන්ත ශාලාවක් ඉන්දියාවේ ස්ථාපනය කරන ලදි. තවද, 2008 වර්ෂය තුළදී ඇඟළුම් කර්මාන්තයෙහි ප්‍රමුඛ නිෂ්පාදකයෙකුට බලශක්ති සහ පාරිසරික මෝස්තරකරණය පිළිබඳ නායකත්වය දරන හරිත නිෂ්පාදිත ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය යටතේ, ඇමරිකා එක්සත් ජනපදයේ හරිත මණ්ඩලය මගින් පිරිනැමෙන "ප්ලැටිනම් ශ්‍රේණිගත කිරීම" ලැබුණි. "පිළිගත් ප්‍රමිතීන් යටතේ නිමැ වූ ඇඟළුම්" නම් වූ ගෝලීය සන්නම් නාම ප්‍රවර්ධන වැඩසටහන, "ආසියා අලෙවිකරණ කාර්යක්ෂමතා ගෞරව සම්මානය" දිනාගත් අතර, මෙම සන්නම් නාම ප්‍රවර්ධන වැඩසටහන යටතේ, ඇඟළුම් නිෂ්පාදකයන් විසින් ශ්‍රී ලාංකීය ඇඟළුම් නිෂ්පාදිත පිළිගත් ආචාරධර්ම වලට අනුකූලව නිෂ්පාදනය කර තිබීම තුලින් අන්තර්ජාතික වෙළෙඳපොළේදී අනෙකුත් ඇඟළුම් නිෂ්පාදිත වලින් වෙන්කර දැක්වීමට හැකි විය.




**ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයේ වර්ධනය 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 5.2 දක්වා අඩු වූ අතර, එය සියලුම ප්‍රධාන උප-කාණ්ඩවල ක්‍රියාකාරිත්වයෙන් පිළිබිඹු විය.** මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ අන්තර්ජාතික ආහාර අර්බුදය සහ දේශීය ඉල්ලුම පහළ බැසීම තුළින් මෙහෙය වූ ආනයනික අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළයාම මෙන්ම බලශක්ති සහ ඉන්ධන පිරිවැය ඇතුළුව නිෂ්පාදන පිරිවැය ඉහළ යාමයි. මෙම කාණ්ඩයේ උප-කාණ්ඩයන් වන සැකසූ ආහාර, බේකරි නිෂ්පාදිත, විස්කෝතු, පලතුරු සහ එළවළු, ටින් කළ නිෂ්පාදිත, පාන වර්ග, මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් මෙම දුර්වල ක්‍රියාකාරිත්වයට හේතුවිය. කෙසේ වෙතත් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා 2008 වර්ෂයේ දී රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, විශේෂයෙන් තෘණ වර්ග වගාකිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම, තාක්ෂණික දැනුම ලබාදීම, කිරි ගවයන් ආනයනය කිරීම, මූල්‍යමය ආධාර ලබාදීම සහ ආනයනය කරන කිරිපිටිවල මිල පාලනය කිරීම මෙන්ම කිරිපට්ටි කර්මාන්තය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි කිරීම තුළින් කිරි ආශ්‍රිත නිෂ්පාදිතවල වර්ධනය ශක්තිමත් විය. මේ අතර, අන්තර්ජාතික වෙළෙඳපොළට ප්‍රවේශ වීම සඳහා සැකසූ ආහාර නිෂ්පාදන අංශයෙහි ප්‍රමුඛයකු

විසින්, ඉන්දියාවේ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබීය. 2008 වර්ෂය තුළදී මෙම කාණ්ඩයට අයත් කර්මාන්ත පාරිභෝගිකයන්ගේ රුචිය සහ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව සලකා බලා නව නිෂ්පාදිත සහ සන්නම් වෙළෙඳපොළට හඳුන්වාදීම, සියලුම වෙළෙඳපොළ අංශ සඳහා එකතු කළ වටිනාකමකින් යුත් නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම, බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම මෙන්ම අලෙවි ප්‍රදර්ශනාගාර ව්‍යාප්ත කිරීම වැනි ප්‍රධාන පියවරයන් අනුගමනය කළේය.

**රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩය 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 6.4 කින් වර්ධනය විය.** මෙම කාණ්ඩයට අයත් ප්‍රධාන කර්මාන්ත වන ටයර් සහ අත්වැසුම් කර්මාන්තයන් හි නිෂ්පාදකයන් විසින් අන්තර්ජාතික මෙන්ම දේශීය වෙළෙඳපොළ වෙත ඉහළ ගුණාත්වයෙන් යුත් නිෂ්පාදිත රාශියක් සපයන ලදි. විදේශීය ඉල්ලුම අඩු වීම හේතුවෙන් ප්‍රධාන කාර්මික රටවල මෝටර් රථ කර්මාන්තයේ ඇති වූ දුර්වල ක්‍රියාකාරීත්වය ටයර් කර්මාන්තයට අහිතකර ලෙස බලපෑවේය. කෙසේවෙතත්, ටයර් කර්මාන්තයේ නිෂ්පාදකයන් විසින් නව නිෂ්පාදන තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් යොදා ගනිමින් ගුණාත්මක නිෂ්පාදන සැපයීම සහ පාරිභෝගිකයන්ට අලෙවියෙන් පසු සේවාවන් සපයන ලදි. මේ අතර, පාවහන් නිෂ්පාදකයින් විසින් තරුණ සහ ළමා පරපුර ඉලක්කකොට ගෙන විවිධ මෝස්තරයන්ගෙන් සමන්විත නව නිෂ්පාදන රාශියක් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදි. ප්ලාස්ටික් සහ තීන්ත කර්මාන්ත ද පාරිභෝගික රුචිය සපුරාලීම සඳහා සහ අපනයන වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා නව නිෂ්පාදන රාශියක් හඳුන්වා දුන්නේය.

**ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත වල වර්ධනය 2007 වර්ෂයේ දී පැවති සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 5.2 දක්වා අඩු විය.** මෙම කාණ්ඩයේ ප්‍රධාන කර්මාන්තයක් ලෙස සැලකෙන සිමෙන්ති කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයට ඉහළ අමුද්‍රව්‍ය පිරිවැය සහ පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතුවල පහත බැසීම බලපෑවේය. බලශක්ති උත්පාදනය, වරාය, ගුවන් තොටුපොළ, මහාමාර්ග මෙන්ම අධිවේගී මාර්ග වැනි යටිතල පහසුකම්වල අපේක්ෂිත වර්ධනය සහ උතුරු නැගෙනහිර පළාත්වල පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු නිසා සිමෙන්ති සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තයේ නිෂ්පාදනය වැඩිවේ යැයි අපේක්ෂා කෙරේ. අළුතින් පිහිටුවන ලද ත්‍රිකුණාමලය සිමෙන්ති කම්හල සහ නැවත ආරම්භ කරන කන්කසන්තුරේ සිමෙන්ති කම්හල් වල නිෂ්පාදන මගින් උතුරු නැගෙනහිර පළාත් වලින් සිමෙන්ති සඳහා ඇතිවිය හැකි ඉල්ලුම සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ. පිඟන් කර්මාන්තයේ නිමැවුම පහළ යාම සඳහා ප්‍රධාන වශයෙන්ම, ඉහළ ගිය අමුද්‍රව්‍ය සහ බලශක්ති පිරිවැය තුළින් ඇති වූ ඉහළ නිෂ්පාදන පිරිවැය, බිත්ති ගඩොල් සඳහා ඉදිකිරීමේ අංශයෙන් වූ අඩු ඉල්ලුම සහ ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයේ රටවලින් කෑම මේස උපකරණ සඳහා වූ ඉල්ලුම පහළ වැටීම බලපෑවේය. කෑම මේස උපකරණ කර්මාන්තයෙහි ප්‍රමුඛයන් විසින් ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමයේ වෙළෙඳපොළ ඇණවුම් අඩුවීම තුළින් මතුවිය හැකි අලාභය හිලව්කර ගැනීම සඳහා ඉන්දියානු වෙළෙඳපොළේ විශේෂයෙන්ම හෝටල් සහ නවාතැන්හල් කෙරෙහි අවධානය යොමු කරන ලදි. ඉන්ධන පිරිවැය අඩුකර ගැනීමට "දැව ඉන්ධන ව්‍යාපෘතිය" නම් වූ බලශක්ති පිරිමැසුම් ක්‍රමයක් බිත්ති ගඩොල් කර්මාන්තය විසින් හඳුන්වාදෙන ලදි. 2008 වර්ෂයේ දී, දියමන්ති සැකසුම් කර්මාන්ත අංශය ක්‍රියාත්මක කළ සාර්ථක අලෙවිකරණ වැඩසටහන් නිසා ගෝලීය ආර්ථික පසුබැසීම හමුවේ පවා එම අංශය ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. කෙසේවෙතත්, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළෙඳපොළවලින් පැවැති ඉල්ලුම අඩුවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අහිතකර ලෙස බලපෑවේය. මේ හේතුවෙන් එම කර්මාන්තය චීනය, ඉන්දියාව, රුසියාව, තුර්කිය සහ මැදපෙරදිග වැනි අනෙකුත් වෙළෙඳපොළවල් වෙත පිවිසීම සඳහා අවධානය යොමු කළේය.

**සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කාණ්ඩය, 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 5.6 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙම කාණ්ඩයේ වර්ධනයට ප්‍රධාන වශයෙන්ම නැව් නිෂ්පාදනය කිරීම හා අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, කේබල් සහ වයර්, මෝටර් රථ අමතර කොටස් සහ එකලස් කිරීමේ කර්මාන්ත, ස්විච සහ විදුලි බුබුළු නිෂ්පාදන සහ ඇළුමිනියම් කර්මාන්තය දායක විය. නැව් සහ බෝට්ටු නිෂ්පාදන සහ අලුත්වැඩියා කිරීමේ කර්මාන්ත මෙම අංශයේ නිමැවුමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර, විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ නෞකා සහ බෝට්ටු දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළෙඳපොළට සපයමින් 2008 වර්ෂයේ දී විශිෂ්ට ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය ද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ (PPP) සහභාගීත්වය හරහා බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය ශක්තිමත් කිරීමට අවශ්‍ය විවිධ පියවර ගනු ලැබීය.

**2.8 සංඛ්‍යා සටහන** — **ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභ අනුපාතික(අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු. දශ ලක්ෂ) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 2007(ආ) | 2008(ඇ) | 2007(ආ) | 2008(ඇ) | 2007(ආ) | 2008(ඇ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 107,318 | 118,901 | 126,035 | 139,330 | 14.9 | 14.7 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 28,005 | 30,995 | 32,209 | 35,484 | 13.1 | 12.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,103 | 2,372 | 2,392 | 2,695 | 12.1 | 12.0 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 6,917 | 7,682 | 7,906 | 8,775 | 12.5 | 12.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 52,232 | 60,573 | 61,850 | 71,640 | 15.6 | 15.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 31,515 | 36,904 | 37,012 | 43,212 | 14.9 | 14.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 3,453 | 3,854 | 4,013 | 4,485 | 14.0 | 14.1 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 19,974 | 23,107 | 23,240 | 26,941 | 14.1 | 14.2 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,209 | 4,732 | 4,788 | 5,378 | 12.1 | 12.0 |
| **එකතුව** | **255,726** | **289,119** | **299,445** | **337,940** | **14.6** | **14.4** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රාජ්‍ය අංශයේ කර්මාන්තවල වර්ධනය මනිනු ලබන රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදන ධාරිතා දර්ශකය 2008 වර්ෂය තුළදී සියයට 1.4 කින් පහත වැටුණි.** රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 90 කට වඩා වැඩි දායකත්වයක් සපයන ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නිමැවුම, 2008 පෙබරවාරි මාසය තුළ ඛනිජ තෙල් පිරිපහදුව කලින් සැලසුම් කළ නඩත්තු කටයුතු සඳහා වසා තැබීම හේතුකොටගෙන සියයට 1.3 කින් පහළ ගියේය.

**ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අපනයන මෙන්ම දේශීය වෙළෙඳපොළ ඉල්ලුම ශීඝ්‍ර ලෙස පහළ යාම ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තවල සාමාන්‍ය ලාභ අනුපාතය කෙරෙහි බලපෑවේය.** කර්මාන්තවල ලාභ අනුපාතය 2007 වර්ෂයේ දී වාර්තා කළ සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව 2008 වර්ෂයේ දී සියයට 1.1 කින් පහළ ගියේය. මෙම පහළ බැසීම පිළිබිඹු වූයේ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත හා රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත යන ප්‍රධාන කාණ්ඩවල වූ අතර එයට බලශක්ති සහ ඉන්ධන පිරිවැය ඉහළ යාම හේතුවෙන් වැඩි වූ නිෂ්පාදන පිරිවැය සහ අමුද්‍රව්‍ය හා පොළී පිරිවැය වැඩිවීම යන ප්‍රධාන කරුණු බලපෑවේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත 510 ක් සම්බන්ධකරගෙන පවත්වනු ලැබූ සමීක්ෂණයට අනුව නිෂ්පාදිත කර්මාන්තශාලාවෙන් පිටවන අවස්ථාවේදී මුළු නිෂ්පාදන පිරිවැය ඉක්මවා පවතින නිෂ්පාදන වටිනාකම පදනම් කරගෙන කාර්මික අංශයේ ලාභ අනුපාත ඇස්තමේන්තු කෙරේ.

**කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ වැටුප් පිරිවැය මුළු නිෂ්පාදන පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස, 2007 දී වාර්තා කළ වර්ධනයට සමානව 2008 වර්ෂයේ දී ද සියයට 1.6 කින් වර්ධනය විය.** 2008 වර්ෂයේ දී කර්මාන්ත බොහොමයක් විසින් තම සේවකයන්ගේ වැටුප් සහ වේතන ස්ථාවර ප්‍රමාණයකින් හෝ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (CCPI) වැඩිවීම් වලට අනුව ඉහළ දමන ලදි. වැටුප් මගින් ඇති කරන පීඩනය අවම කර ගැනීම සඳහා ආයතන විසින් ශ්‍රම ඵලදායීතාවය වර්ධනය කිරීම, නව තාක්ෂණයන් හඳුන්වා දීම, සහයක සේවාවන් බාහිර ආයතන වලින් ලබා ගැනීම, කාර්ය සාධනය මත පදනම් වූ ගෙවීම් පද්ධතියක් පවත්වා ගැනීම මෙන්ම වර්තමාන සේවක සංඛ්‍යාව ප්‍රතිනියුක්තිකරණය කිරීම වැනි විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කරනු ලැබීය. 2008 වර්ෂයේදී මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස බලශක්ති, ඉන්ධන සහ අමුද්‍රව්‍ය පිරිවැය පිළිවෙළින් සියයට 7.5 කින් සහ සියයට 1.2 කින් වර්ධනය විය.

**රජය විසින් තම රේඛීය අමාත්‍යාංශ හා අදාළ ආයතන හරහා විශේෂයෙන්ම, ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත දිරිමත් කිරීමට නිර්මාණය කරන ලද විවිධ විශේෂ වැඩසටහන් වලින් කාර්මික අංශය ප්‍රතිලාභ ලබා ඇත.** රජය විසින් ප්‍රාදේශීය කාර්මීකකරණය වැඩි දියුණු කිරීම සඳහා *"නිපැයුම් ශ්‍රී ලංකා"*, *"ගමට කර්මාන්ත"* හා *"නැගෙනහිර නවෝදය"* වැනි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ආයෝජන මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන *"නිපැයුම් ශ්‍රී ලංකා"* වැඩසටහන යටතේ නව කර්මාන්ත 57 ක් පිහිටුවීමත්, අඩපණව තිබූ කර්මාන්ත 17 ක් නැවත පණ ගැන්වීමත්, කර්මාන්ත

**2.9 සංඛ්‍යා සටහන** **ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය(අ) (මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2007 | 2008 | 2007 | 2008 | 2007 | 2008 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 3.7 | 4.1 | 10.3 | 10.5 | 39.8 | 40.1 | 1.5 | 1.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 4.9 | 5.4 | 15.3 | 15.4 | 13.2 | 13.6 | 2.6 | 3.0 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 9.5 | 10.0 | 16.2 | 16.5 | 33.0 | 33.3 | 4.4 | 4.8 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 4.4 | 4.8 | 13.1 | 13.2 | 19.6 | 19.8 | 3.6 | 3.9 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 6.9 | 7.5 | 13.5 | 13.8 | 30.7 | 31.2 | 3.8 | 4.2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 20.7 | 21.6 | 15.0 | 15.4 | 29.4 | 29.8 | 3.6 | 4.1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 10.2 | 10.6 | 11.2 | 11.3 | 36.0 | 36.5 | 2.6 | 2.8 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5.4 | 5.9 | 12.4 | 12.8 | 27.0 | 27.4 | 4.3 | 4.7 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5.5 | 5.9 | 12.1 | 12.3 | 34.5 | 34.8 | 1.6 | 1.9 |
| **එකතුව** | **6.7** | **7.2** | **12.5** | **12.7** | **32.8** | **33.2** | **2.6** | **3.0** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4 ක ක්‍රියාකාරකම් පුළුල් කිරීමත් සිදුකර ඇති අතර කර්මාන්ත 4 ක් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක වලින් බැහැරව ප්‍රතිස්ථානගත කිරීමට අනුමැතිය ලබා දී ඇත.

**2009 අයවැය මගින්, දේශීය කර්මාන්ත වලට පහසුකම් සැලසීමට හා දේශීය කර්මාන්ත දිරිගැන්වීමට රජය විසින් ආනයන කිහිපයක් මත සෙස් බදු පැනවීම හෝ වැඩි කිරීම සිදුකර ඇත.** රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තවල දේශීය අමු රබර් භාවිතය දිරිමත් කිරීම සඳහා, ආනයනය කරන ලේටෙක්ස් රබර් කිරි මත කිලෝ ග්‍රෑමයකට රු.25/- ක සෙස් බද්දක් පනවන ලදි. රජය විසින් දේශීය බඩ ඉරිඟු නිෂ්පාදකයින් දිරිගැන්වීමට, ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායකයින් ද ඇතුළුව සියලු ආනයනකරුවන් කෙරෙහි බලපැවැත්වෙන ආකාරයට බඩ ඉරිඟු හා සත්ත්ව ආහාර ආනයන මත සියයට 25 ක සෙස් බද්දක් පනවන ලදි. තවද, දේශීය කඩදාසි නිෂ්පාදකයින් දිරිමත් කිරීමට, නවීකරණය කරන ලද ඇඹිලිපිටියේ හා වාලච්චේනෙයි පිහිටි කඩදාසි කර්මාන්තවල නිෂ්පාදිත වාණිජමය වශයෙන් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ආනයනය කරන කඩදාසි මත සියයට 5 ක සෙස් බද්දක් පනවන ලදි. දේශීය කර්මාන්තවලට පහසුකම් සැලසීම සඳහා ආනයනය කරන ගෘහ භාණ්ඩ මත සියයට 15 ක සෙස් බද්දක් හා සම් භාණ්ඩ මත කිලෝ ග්‍රෑමයකට රු.200/- සෙස් බද්දක් පනවන ලදි. තවදුරටත්, පිඟන් භාණ්ඩ කර්මාන්තය, රස කැවිලි කර්මාන්තය හා ශීතකරණ හා විදුලි පංකා වැනි දේශීය විද්‍යුත් උපකරණ නිෂ්පාදන කර්මාන්තවල, නිෂ්පාදකයින්ට පහසුකම් සැලසීමට එවැනි ආනයන මත පැනවූ සෙස් බදු සියයට 50 කින් වැඩි කරන ලදි. ඒ අතර රස කැවිලි නිෂ්පාදිතවල මෙලමයින් අඩංගු නොවන බව තහවුරු කිරීමට අවශ්‍ය මූලික නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. දේශීය ලූණු කර්මාන්තය ස්වයං පෝෂිත මට්ටමකට ගෙන ඒම දිරිගැන්වීම සඳහා ආනයනය කරන ලූණු මත කිලෝ ග්‍රෑමයකට රු. 10/- ක සෙස් බද්දක් පනවා ඇත.

**2009 අයවැය මගින් දේශීය කර්මාන්ත, විශේෂයෙන් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත දිරිගැන්වීමට තවදුරටත් සහන සලසා ඇත.** කිරි ගවපාලන කර්මාන්තය දිරි ගැන්වීමට, කිරි පිටි ආනයන මත පනවන ලද විශේෂ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 5/- සිට රු. 15/- දක්වා වැඩි කරන ලදි. තවදුරටත්, දේශීය සීනි කර්මාන්තය හා උක්සීනි වගාව දිරිගැන්වීමට, ආනයනික සීනි මත පැන වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රු. 14/- සිට රු. 16/- දක්වා වැඩි කරන ලදි. තවදුරටත්, දේශීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ අරමුණින් තඹ හා රිදී වැනි ආනයනික අමුද්‍රව්‍ය,

**2.10 සංඛ්‍යා සටහන** **ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතා දර්ශකය(අ)**

1995=100

| කාණ්ඩය | 2007 | 2008 | වෙනස (%) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 139.2 | 142.4 | 2.3 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 121.9 | 125.7 | 3.1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 108.3 | 111.0 | 2.5 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 108.9 | 111.4 | 2.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 150.2 | 155.4 | 3.5 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 120.2 | 122.7 | 2.1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 107.5 | 109.6 | 2.0 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 131.7 | 135.8 | 3.1 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 117.0 | 120.3 | 2.8 |
| **එකතුව** | **127.9** | **132.1** | **3.3** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 510 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැට් බද්දෙන් හා තීරු බදුවලින් නිදහස් කරන ලදි. ඒ අතර ප්‍රාදේශීය කාර්මීකකරණය අරමුණු කරගනිමින් "එක් ගමකට-එක් වගාවක්" හා ප්‍රාදේශීය මට්ටමින් "කෘෂි අපනයන කලාප" යන සංකල්ප දිරිගැන්වීමට පියවර ගන්නා ලදි.

**රජයේ කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන මූලික ආයතනය වන කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් කර්මාන්ත සංවර්ධනයෙහි ලා විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදි.** "*ගමට කර්මාන්ත*" වැඩසටහන යටතේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 2008 වර්ෂය අවසාන වනවිට දැනටමත් කර්මාන්ත 119 කට අනුමැතිය ලබා දී ඇති අතර එයින්, කර්මාන්ත 35 ක් දැනට වාණිජ කටයුතු අරඹා ඇත. කර්මාන්ත 17 ක් ඉදිකිරීම් කටයුතු ඇරඹීමත්, කර්මාන්ත 14 ක් යන්ත්‍රෝපකරණ සවිකිරීම ඇරඹීමත් සිදුකර ඇති අතර, කර්මාන්ත 17 ක් ඔවුන්ගේ මූලික වැඩ කටයුතු ආරම්භ කර ඇත. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හා ආයෝජන මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති "*නැගෙනහිර නවෝදය*" නැමැති නැගෙනහිර පළාත් සංවර්ධන වැඩ සටහන යටතේ, ව්‍යාපෘති 35 කට අනුමැතිය ලබාදීමත්, ව්‍යාපෘති 11 ක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමත්, ව්‍යාපෘති 4 ක් තම මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමත් සිදුකර ඇත. කාර්මික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන තවත් වැදගත් ව්‍යාපෘතියක් වන ප්‍රාදේශීය කාර්මීකකරණ සංවර්ධන වැඩසටහන යටතේ රට පුරා කාර්මික ජනපද 23 ක් සංවර්ධනය කර ඇති අතර එය පළාත් අතර පවතින යටිතල පහසුකම් විෂමතාව අඩු කිරීමට උපකාරී වී ඇත. තවදුරටත්, 2008 වර්ෂයේ දී පුත්තලම කාර්මික ජනපදයේ සංවර්ධන ක්‍රියාකාරකම් අවසන් කරන ලද අතර බුත්තල, කප්පල්තුරේ, ඇඹිලිපිටිය, ගලිගමුව, පල්ලේගොඩවත්ත, මාදම්පේ, උලපනේ (II අදියර) හා හොරණ කාර්මික ජනපද කර්මාන්ත අංශයේ වැඩි දියුණුවට දායක විය. මේ අතර කහටගස්දිගිලිය හා ඉපලෝගම යන ප්‍රදේශවල කාර්මික සංවර්ධන ජනපද පිහිටුවීම සඳහා සුදුසු බිම් ප්‍රදේශ හඳුනාගෙන ඇත. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය විසින් පෞද්ගලික අංශයේ සහභාගීත්වය ද ඇතිව කර්මාන්ත අංශයට පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය පිහිටුවන ලදි. මෙම ව්‍යාපෘතිය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා පළමු නැනෝ තාක්ෂණික උද්‍යානය හෝමාගම පිහිටුවීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

**ආයෝජන හා අපනයන ප්‍රවර්ධනයට පහසුකම් සලසන ආයතන වන ආයෝජන මණ්ඩලය හා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දේශීය හා විදේශීය යන දෙඅංශයෙන්ම ආයෝජන ආකර්ෂණය කර ගැනීමටත්, අපනයන ඉලක්ක කර ගත් වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමටත් සහයෝගය ලබා දී ඇත.** රජයේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්තිය හා අනුකූල වන පරිදි ආයෝජන මණ්ඩලය විසින් නව ආයෝජන ප්‍රවර්ධන කලාප වශයෙන් සංවර්ධනය කළ හැකි භූමි ප්‍රදේශ 4 ක් ත්‍රිකුණාමලය, පුත්තලම, හම්බන්තොට හා අම්පාර යන දිස්ත්‍රික්ක වලින් හඳුනාගෙන ඇත. එයින් ත්‍රිකුණාමලය හා පුත්තලම නව කලාපවල මූලික වැඩකටයුතු දැනටමත් අරඹා ඇත. මීට අමතරව, ආයෝජන මණ්ඩලය විසින් ආයෝජකයින් ඇදගැනීමට, රාජ්‍ය-පෞද්ගලික හවුල් ක්‍රියාකාරිත්ව පදනම මත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා මීපේ ආයෝජන කලාපයක් පිහිටුවීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. තවද, හේනේගම දැනුම පුරවරයක් පිහිටුවීමට ද මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට යාබදව තොරතුරු තාක්ෂණ උද්‍යානයක් පිහිටුවීමට ද අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. එමෙන්ම රජය විසින් ආයෝජන මණ්ඩලය හරහා විශේෂ ආර්ථික කලාප 12 ක් හා ඇඟළුම් නිෂ්පාදන කලාපයක් පිහිටුවීමට මූලික පියවර ගෙන ඇති අතර, ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණින් නාගරීකකරණ සංවර්ධන වැඩසටහනක් සංවිධානය කර ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වෙළෙඳ පහසුකම් සපයමින් හා විශේෂ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කරමින් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා විශේෂ වැඩසටහන් පවත්වන ලදි. තවදුරටත්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කුසලතා හා ව්‍යවසායකත්ව සංවර්ධනය, නිෂ්පාදන හා නිෂ්පාදන තත්ත්ව දියුණු කිරීම, දේශීය හා විදේශීය වෙළෙඳපොළවල් කරා පිවිසීම ඉහළ නැංවීම, උපදේශන සේවා පැවැත්වීම, වෙළෙඳ තොරතුරු හා විද්‍යුත් වාණිජ සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය අපනයන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

**ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය (JAAF) හා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) 2008 වර්ෂය තුළදී කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වයට පහසුකම් සැපයීමට දායක විය.** ඇඟළුම් අංශයේ ප්‍රධානතම සංගමය වන ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය විසින් "පිළිගත් ප්‍රමිතීන්ට අනුව නිමැවූ ඇඟළුම්" යන තේමාව යටතේ අන්තර්ජාතික

වෙළෙඳපොළේ සන්නම් ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරන ලදි. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ අයිතියක් ඇති ඇඟළුම් නිෂ්පාදන සමාගම් "පිළිගත් ප්‍රමිතීන්ට අනුව නිමැවූ ඇඟළුම්" යන තේමාව යටතට ගෙන ඒම පිණිස ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය මඟින්, ආයෝජන මණ්ඩලය හා නිදහස් වෙළෙඳ කලාප හරහා මෙම ගෝලීය අලෙවි ප්‍රවර්ධන ව්‍යාපාරයේ III අදියර ක්‍රියාත්මක කරන ලදි. ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය විසින් ඇඟළුම් ක්ෂේත්‍රයේ ස්ථාවර ශ්‍රම බලකායක් ගොඩනැංවීම සඳහා රැකියා නියුක්ත ස්ත්‍රීන් ඉලක්ක කර ගත් ප්‍රතිරූප ගොඩනැංවීමේ වැඩසටහන් දේශීය වශයෙන් ක්‍රියාත්මක කරන ලදි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමයේ සහභාගිත්වය ඇතිව මැණික් පරීක්ෂාව සඳහා රසායනාගාරයක් පිහිටුවීමට කටයුතු කරන ලදි.

**ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තවලට වෙළෙඳපොළට පිවිසීමේ පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (SLCSI) විසින් චෙන්නායි හි දී වෙළෙඳ මධ්‍යස්ථානයක් පිහිටුවන ලදි.** ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ජාතික ව්‍යවසායකත්ව අධිකාරිය හා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ලෙස මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලෙන සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. මේ අතර රජය විසින් සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත සංවර්ධනය සඳහා සංවිධානාත්මක මූල්‍යනය, අවශ්‍ය උපකරණ සැපයීම, ව්‍යාපාරික හා වෙළෙඳපොළ තොරතුරු සැපයීම, මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව වැනි අංශ පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර ඇත. රට තුළ සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ප්‍රවර්ධනය ඉලක්ක කර ගනිමින් ව්‍යාපාර සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් "සුළු හා ක්ෂුද්‍ර කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය III" සහ "පරිසර මිතුරෝ සහන ණය ක්‍රමය II" හඳුන්වා දෙන ලදි.

**2008 වසරේ කර්මාන්ත අංශයේ වර්ධන වේගය අඩු වීම කෙරෙහි ගෝලීය මූල්‍ය අර්බුදය, වේගයෙන් ඉහළ ගිය ඉන්ධන මිල ගණන් හා ඉහළ නිෂ්පාදන පිරිවැය යනාදී ප්‍රධාන ආර්ථික බාධාවන් හේතු විය.** ඉහළ ඉන්ධන මිල ගණන්, කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය කෙරෙහි සෘජුවම බලපෑ අතර, නව ආයෝජන කෙරෙහි මෙන්ම ප්‍රසාරණය සඳහා වූ සැලසුම් කල් දැමීමට හේතු වන පරිදි ලාභ ආන්තිකය අඩු වීමට ද මෙය පාදක විය. මේ නිසා, ගෝලීය ආර්ථික පසුබෑම අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වන ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදන, දියමන්ති සැකසුම් හා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තවල ඉල්ලුම අඩුවීම කෙරෙහි බලපෑවේය. තවදුරටත්, විශේෂයෙන්ම වෙළෙඳපොළේ දැඩි තරගකාරීත්වයන්ට මුහුණපාන අපනයන ඉලක්ක කරගත් ඇඟළුම් කර්මාන්තය, ඉහළ ඉන්ධන මිල ගණන් සහ වැටුප් වැඩිවීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළයාම නිසා පීඩාවට පත් විය. මෙම බාධාවන් අවම කිරීමට, ඇඟළුම් කර්මාන්තයේ නියැලෙන නිෂ්පාදන ආයතන සිය නිමැවුම ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියෙහි යම් යම් වෙනස්කම් කිරීමට හැකිවන ලෙස කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනයට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම, සේවක සංඛ්‍යාව ස්ථාවරව පවත්වා ගැනීම තුළින් පිරිවැය අඩුකිරීම හා පිළිගත් ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනය කළ හා හරිත නිෂ්පාදන, ගැනුම්කරුවන් හා වෙළෙඳුන් අතර ප්‍රචලිත කිරීම සිදු කළේය. අන්තර්ජාතික වෙළෙඳපොළේ ඉල්ලුම අඩුවී ඇතත් උද්ධමනකාරී පීඩනය අඩු වීම, ඉන්ධන මිල ගණන් පහළ බැසීම මෙන්ම අඛණ්ඩව ඉහළ ඵලදායීතාවයක් පවත්වාගෙන යාමට උත්සාහ කිරීම යනාදිය 2009 වසරේ දී කර්මාන්ත අංශයට සිය වර්ධන ප්‍රවණතාවය පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

**වතු වැවිලි භෝග මත පදනම් වූ සැකසුම් උප අංශය පසුගිය වසරේ පෙන්නුම් කළ සියයට 2.4 ක වර්ධනය හා සසඳන කල 2008 වර්ෂය තුළ සියයට 5.3 කින් වර්ධනය වූ අතර මේ සඳහා තේ, රබර් සහ පොල් නිෂ්පාදනයේ වූ වාර්ෂික වැඩි වීම සක්‍රීය සාධකයක් විය.** 2008 වර්ෂයේ දෙවන කාර්තුව තුළ පෙන්නුම් කළ රබර් නිෂ්පාදනයේ ආන්තික සංකෝචනයත්, වර්ෂයේ පසු භාගයේ දී පෙන්නුම් කළ තේ නිෂ්පාදනයේ අඩු වීමත් සැකසුම් උප අංශයේ සීමිත ප්‍රසාරණයට හේතු විය.

**2007 වසරේ දී පෙන්නුම් කළ සියයට 5.6 ක වර්ධනයට එරෙහිව ගෘහ කර්මාන්ත උප අංශයෙහි 2008 වර්ෂය තුළ දී වර්ධනය සියයට 4.5 ක් විය.** ඉදිකිරීම් කටයුතුවල මන්දගාමිත්වය සුළු පරිමාණ ගොඩනැගිලි ඉදිකිරීම් පහළ යාමට හේතු විය. නිමි ඇඳුම් නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම පහළ යාමත් සමඟ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය හා ඇඳුම් මැසීම ආශ්‍රිත කටයුතුවල ද අඩු වීමක් 2008 වර්ෂය තුළ පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, වැඩි වූ වී නිෂ්පාදනයත් සමඟ වී ආශ්‍රිත ඇඹරුම් කටයුතුවල වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඒ හේතු කොට ගෙන 2008 වර්ෂය තුළ ගෘහ කර්මාන්ත උප අංශයේ සක්‍රීය බවක් පෙනෙන්නට තිබිණි.

**උප අංශ තුනෙහිම පහළ යාමක් පෙන්නුම් කරමින් විදුලිබල, ගෑස් සහ ජල අංශය 2007 වර්ෂයේ වූ සියයට 4.6 ක වර්ධනය සමග සසඳන කල 2008 වර්ෂය තුළ දී සියයට 2.7 කින් වර්ධනය විය.** විශාලතම උප අංශය වන විදුලිබල අංශයෙහි පසුගිය වර්ෂයේ වූ සියයට 4.6 ක වර්ධනය හා සසඳන කල 2008 තුළ වර්ධනය වූයේ සියයට 3.9 කිනි. විදුලිබල උත්පාදනය 2007 දී සියයට 4.5 කින් වර්ධනය වුවද 2008 තුළ දී එය සියයට 0.9 දක්වා අඩු විය. මුළු විදුලිබල ජනනයෙන් සියයට 42 ප්‍රමාණයකට වගකියන එමෙන්ම ඉහළ එකතු කළ වටිනාකමක් එක් කරන ජල විදුලිබල උත්පාදනය සියයට 4.6 කින් වැඩි වුව ද තාපබල උත්පාදනය, වර්ෂය තුළදී සියයට 1.7 කින් සංකෝචනය විය. විදුලිබල උත්පාදනයේ පසුබෑම ගෘහස්ථ හා කාර්මික අංශවලින් විදුලිබලය සඳහා වූ ඉල්ලුමේ අඩු වීමෙන් පිළිබිඹු වේ. වසර අගදී කෙරවලපිටිය බලාගාරයේ විදුලි ජනන කටයුතු ආරම්භයත් සමග විදුලිබල ජනන ධාරිතාවයේ ඉහළ යාම මෙම අංශයේ අනාගත වර්ධන අපේක්ෂාවන් වැඩි වීමට හේතු වේ. 2007 වසරේ වූ සියයට 2.9ක වර්ධනයට සාපේක්ෂව ගෑස් උප අංශයෙන් එකතු කළ වටිනාකම 2008 වසරේ දී සියයට 10.2 කින් සංකෝචනය විය. මෙය 2008 නොවැම්බර් දක්වා පැවති මිල පීඩනය නිසා ගෘහස්ථ, කාර්මික හා මෝටර් රථ ගෑස් අංශයෙන් වූ ඉල්ලුමේ අඩු වීම හේතු කොට ගෙන සමස්ත ගෑස් අලෙවිය සියයට 12 කින් සංකෝචනය වීම නිසා සිදු වූවකි. නව ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත්, පුළුල් පාරිභෝගික ජාලයකට නල ජලය සැපයෙන පවත්නා ව්‍යාපෘති වැඩි දියුණු කිරීමත් හේතු කොට ගෙන ජල උප අංශය 2007 වසරේ පෙන්නුම් කළ සියයට 7.1 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසරේ දී සියයට 3.6 කින් වර්ධනය විය.

**2007 වර්ෂය තුළ දී සියයට 19.2 ක වර්ධනයක් වාර්තා කළ පතල් හා කැනීම් අංශය 2008 වසරේ දී සියයට 12.8 කින් වර්ධනය විය.** පසුගිය වසරේ පිළිවෙලින් සියයට 13.0 කින් හා සියයට 21.9 කින් වර්ධනය වූ මැණික් කැනීම් හා අනෙකුත් කැනීම් අංශවල වර්ධනය 2008 වසර තුළ පිළිවෙලින් සියයට 8.7 ක් හා සියයට 14.5 ක් දක්වා පහළ වැටුණි. ප්‍රමාණාත්මක වශයෙන් ගත් කල මැණික් අපනයනය 2007 වාර්තා වූ සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසර තුළ ආන්තික වශයෙන් සියයට 1.6 කින් සංකෝචනය වී ඇත. 2008 වසර තුළ අනෙකුත් ඛණිජ වර්ග අපනයනය සියයට 5.9 කින් වැඩි වූ අතර ඉදිකිරීම් අංශයෙන් ඇති වූ ඉල්ලුම හේතු කොට ගෙන අනෙකුත් කැණීම් කටයුතුවල ප්‍රසාරණයක් විය.

**2008 පළමු භාගය තුළ ඉදිකිරීම් අංශයෙන් එකතු කළ වටිනාකම සියයට 9.2 කින් ප්‍රසාරණය වූ නමුදු වසරේ දෙවන භාගය තුළ එහි වර්ධන ගාමකත්වය සියයට 6.6 දක්වා අඩු විය.** ඒ අනුව, ඉදිකිරීම් අංශය 2007 වසර තුළ පෙන්නුම් කළ සියයට 9.0 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසර තුළ දී සියයට 7.8 කින් වර්ධනය විය. මෙම අංශයේ වූ වර්ධන වේගයේ පහළ යාම වසර තුළ දේශීය ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය සියයට 5.5 කින් අඩු වීමෙන් ද ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වර්ධනය සියයට 0.1 තරම් ආන්තික වර්ධනයක් පෙන්නුම් කිරීමෙන් ද පිළිබිඹු වේ. තවද, 2008 වසර තුළ ඉදිකිරීම් කටයුතු සඳහා ලබා ගත හැකිව තිබූ සිමෙන්ති ප්‍රමාණය ද සියයට 4.8 කින් අඩු විය. ආර්ථික වර්ධනයට රාජ්‍ය අංශයේ ආයෝජන කටයුතු බෙහෙවින්ම දායක වූයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති එනම්, ගුවන් පාලම් ඉදිකිරීම් ආශ්‍රිත මාර්ග සංවර්ධන කටයුතු තුළිනි. කෙසේ වුවද, ඉදිකිරීම් කටයුතු සම්බන්ධ යෙදවුම් මිල ගණන්වල ඉහළ යාම හේතු කොට ගෙන මෙම උප අංශයේ වර්ධනය සඳහා පුද්ගලික අංශයෙන් වන දායකත්වය පහළ මට්ටමක පැවතිණි. නිවාස ඉදිකිරීම් සඳහා ලබා දෙන බැංකු ණය මට්ටම 2007 වසරේ සියයට 24.7 කින් වර්ධනය වීම හා සසඳන කල 2008 වර්ෂයේ දී එය සියයට 1.4 කින් සංකෝචනය වූ බව පෙනේ. ඉදිකිරීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු පිළිබඳ ආයතනය (ICTAD) මගින් ප්‍රකාශිත මිල දර්ශකවලට අනුව 2008 වසර තුළ සමස්ත ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල මට්ටම සියයට 13.8 කින් ඉහළ ගොස් ඇත.

### සේවා අංශය

**දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 59.5 කට දායකවන සේවා අංශය 2007 වර්ෂයේ අත්කර ගත් සියයට 7.1 ක් වූ වර්ධන වේගය හා සසඳන කල 2008 වර්ෂය තුළ දී වර්ධනය වූයේ සියයට 5.6 ක් තරම් වූ අඩු වේගයකිනි.** තවද, සේවා අංශය දේශීය නිෂ්පාදනයේ සමස්ත වර්ධනයට දක්වන දායකත්වය ද සියයට 56.6 ක් දක්වා ප්‍රතිශත අංක හයකින් පහළ වැටුණි. මෙය ආර්ථිකයේ අනෙකුත් අංශ සමඟ සංසන්දනය කරන කල වැඩිවන වේගයකින් සේවා අංශයේ දායකත්වය පහළ යාමකි. මෙම පසුබෑම විශේෂයෙන්ම ලෝක ආර්ථික පසුබෑම මත වසරේ දෙවන භාගය තුළ අපනයන වෙළෙඳාම, ප්‍රවාහනය හා මූල්‍ය සේවා කටයුතුවල වර්ධනයේ අඩු වීම නිසා තවදුරටත් තීව්‍ර විය.

**ඉකුත් වසරේ දී පෙන්නුම් කළ සියයට 6.1 ක ප්‍රසාරණයට සාපේක්ෂව තොග හා සිල්ලර වෙළෙඳ අංශය 2008 වසරේ දී වර්ධනය වූයේ සියයට 4.7 කිනි.** 2007 වසරේ දී වූ ප්‍රසාරණ වේගයට වඩා අඩු වේගයකින් අපනයන හා දේශීය වෙළෙඳ උප අංශ ප්‍රසාරණය වූ

නමුත් ආනයන, අපනයන හා දේශීය වෙළෙඳාම් යන උප අංශ තුනම තොග හා සිල්ලර වෙළෙඳාම් අංශයේ වර්ධනයට ධනාත්මක දායකත්වයක් එක් කර ඇත.

**ආනයනික වෙළෙඳ උප අංශය තුළ ආයෝජන භාණ්ඩවල පරිමාවේ වර්ධනය සියයට 3.3 කින් සංකෝචනය වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර හා උපකරණ කාණ්ඩයට සහ අනෙකුත් ආයෝජන භාණ්ඩවලට අයත් ආනයන වර්ධනයේ ඇති වූ අඩු වීමයි.** අතරමැදි භාණ්ඩ ආනයනය ප්‍රමාණාත්මක වශයෙන් ගත් කල සියයට 4.6 කින් වර්ධනය විය. පොහොර ආනයනය මෙම වර්ධනයට සියයට 35.7 ක් වූ සැලකිය යුතු තරමේ දායකත්වයක් දැක්වීය. අනෙකුත් පෙට්‍රෝලියම් ආනයන පරිමාව සියයට 7.9 කින් වැඩි වූ අතර, බොර තෙල් ආනයනය සියයට 4.2 ක සංකෝචනයක් වාර්තා කර ඇත. ප්‍රවාහන කටයුතුවල වූ අඩු වීමත්, තාප බල උත්පාදනයේ පහළ යාමත් සාපේක්ෂ වශයෙන් ඉන්ධන මිල ගණන් ඉහළ මට්ටමක පැවතීමත් මෙම අඩු වීමට හේතු වූ සමහර කරුණු විය. මේ අතර, මුළු ආනයනවලින් සියයට 15.5 කට දායකවන පාරිභෝගික ආනයන භාණ්ඩ පරිමාව සියයට 16.8 කින් වර්ධනය විය. මේ තුළ ආහාර හා බීම කාණ්ඩයට අයත් ආනයනවල පරිමාවේ වර්ධනය සියයට 34.6 ක් විය.

**2007 වසරේ වූ සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව අපනයන වෙළෙඳ උප අංශය 2008 වර්ෂය තුළ දී සියයට 0.9 ක ආන්තික වර්ධන වේගයක් වාර්තා කර ඇත.** රෙදිපිළි හා නිමි ඇඳුම් අපනයනවල සියයට 2.5 ක වර්ධනයක් හා අනිකුත් කාර්මික නිෂ්පාදන අපනයනවල සියයට 5.4 ක සංකෝචනයක් පෙන්නුම් කරමින් කාර්මික නිෂ්පාදන අපනයන ප්‍රමාණාත්මක වශයෙන් සියයට 0.4 කින් සංකෝචනය විය. 2007 වසරේ රෙදිපිළි හා නිමි ඇඳුම් අපනයනය හා අනෙකුත් කාර්මික නිෂ්පාදනවල දක්නට ලැබුණු පිළිවෙලින් සියයට 6.8 ක් හා සියයට 11.8 ක් වූ වර්ධන අගයන් සමඟ සසඳා බලන කල 2008 වසර තුළ එම නිෂ්පාදනවල මෙම වර්ධන වේගයන් කැපී පෙනෙන අඩු වීමක් පෙන්වයි. වසරේ පළමු මාස 8 තුළ දක්නට ලැබුණු හිතකර තත්ත්වය මත කෘෂිකාර්මික අපනයන සියයට 3.5 කින් වර්ධනය විය. 2008 සැප්තැම්බර් මස සිට තේ කර්මාන්තය වෙළෙඳපොළ පසුබෑමකට ලක් වුවද ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.3 ක් වටිනා විදේශ ආදායමක් උපයා ගනිමින් තේ අපනයන පරිමාව කිලෝ ග්‍රෑම් මිලියන 319.7 ක් විය. විශේෂයෙන්ම මැණික් අපනයනය අඩු වීම නිසා ඛනිජ අපනයන සියයට 0.6 කින් සංකෝචනය විය. ලෝක ආර්ථික පසුබෑම නිසා සිදු වූ ලෝක ඉල්ලුම අඩු වීම හේතු කොට ගෙන රබර් අපනයන ප්‍රමාණය ද සැලකිය යුතු ලෙස අඩු විය.

**2007 වසරේ සියයට 7.6 ක් වූ වර්ධනය හා සසඳන කල දේශීය වෙළෙඳ උප අංශය 2008 වර්ෂය තුළ දී සියයට 6.4 කින් වර්ධනය විය.** කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල සිදු වූ ඉහළ යාම මෙම වර්ධනයට හේතු විය. වී නිෂ්පාදනයේ සිදු වූ සැලකිය යුතු වැඩි වීම සහ ධීවර නිෂ්පාදනයේ වැඩි වීමත් උස්බිම් භෝග, එළවළු සහ පළතුරු නිෂ්පාදනවල වූ වැඩි වීමත් මෙම වර්ධනයට දායක විය. වර්ෂය තුළ සියයට 4 කට වඩා වැඩි අගයකින් ප්‍රසාරණය වූ දේශීය වෙළෙඳාම මූලික කරගත් කර්මාන්ත එනම්, ආහාර, බීම සහ ගෘහස්ත කර්මාන්ත සම්බන්ධ වෙළෙඳ කටයුතු ද මෙම වර්ධනයට දායක වූ බව පෙනේ.

**2007 වසරේ සියයට 2.3 කින් පහළ ගිය හෝටල් සහ ආපනශාලා අංශය 2008 වසර තුළ දී සියයට 5.0 කින් සංකෝචනය විය.** මෙම සංකෝචනය සංචාරක පැමිණීම්හි දක්නට ලැබුණු සියයට 11.2 ක පහළ යාමෙහි සෘජු ප්‍රතිඵලයකි. රට තුළ පැවති ආරක්ෂක තත්ත්වය හා 2008 සැප්තැම්බර් සිට වූ ලෝක ආර්ථික පසුබෑම මත සංචාරක හා විනෝද කටයුතු සම්බන්ධයෙන් ලෝකයේ සෑම රටකම පාහේ දක්නට ලැබුණු පසුබෑම මීට හේතු විය. සමස්තයක් ලෙස ගත් කල, බටහිර යුරෝපයෙන් හා ආසියානු කලාපයෙන් පැමිණෙන සියයට 78 ක් පමණ වූ සංචාරක ප්‍රතිශතය සියයට 14.0 කින් පහළ වැටුණි. 2008 වසර තුළ දේශීය සංචාරක කටයුතු ද පහළ වැටිණි.

**ඉකුත් වසරේ දී වූ සියයට 10.5 ක වර්ධන අගය හා සසඳන කල 2008 වසර තුළ ප්‍රවාහන සහ සන්නිවේදන අංශය සියයට 8.1 ක වර්ධනයක් වාර්තා කරන ලදි.** ඉකුත් වසරේ දී මෙන්ම මෙම උප අංශය සේවා අංශය තුළ වැඩිම වර්ධන වේගය අත්කර ගත් අතර අනෙකුත් උප අංශ තුනම එනම්, ප්‍රවාහන, වරාය-නැව් බඩු මෙහෙය වීම, සිවිල් ගුවන් සේවා සහ තැපැල් හා විදුලි සංදේශ කටයුතු සේවා අංශයේ වර්ධනයට දායක විය.

**ඉකුත් වසරේ පෙන්නුම් කළ සියයට 9.3 ක අගයට සාපේක්ෂව ප්‍රවාහන උප අංශයේ වර්ධනය 2008 වසර තුළ සියයට 6.3 ක් විය.** 2007 වසරේ වූ සියයට 5.8 ක් හා සියයට 9.4 ක් වූ වර්ධන අගයන්ට සාපේක්ෂව දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් අත්කර ගත් පිළිවෙලින් සියයට 4.7 ක් හා සියයට 6.4 ක් වූ පහළ ගිය ආන්තික වර්ධන අගයන්ගෙන් ද එම අඩු වීම පිළිබිඹු කෙරේ. ප්‍රවාහන අංශයේ පසුබෑම පසුගිය වර්ෂයේ සාපේක්ෂව පැවති ඉහළ ඉන්ධන මිල ගණන් මත අඩු වූ ඉන්ධන පරිභෝජනය මගින් හා පුද්ගලික භාවිතය සඳහා ගැනෙන මෝටර් කාර් සහ ද්විත්වකාර්ය වාහන කාණ්ඩයට අදාළව මෝටර් රථ ලියාපදිංචියේ වූ

සංකෝචනයෙන් මනාව පෙනේ. මේ අතර පොකුරු බස් සමාගම් මගින් ධාවනය වූ මගී කිලෝ මීටර් ගණන සියයට 2.3 කින් වැඩි වුවද, ආරක්ෂක තත්ත්වය මත වවුනියාව දක්වා සපයන ලද සේවා නතර කිරීම හේතු කොට ගෙන ශ්‍රී ලංකා දුම්රිය මගින් ධාවනය කරන ලද මගී කිලෝ මීටර් ගණන සියයට 2.1 කින් අඩු විය. දුම්රිය ප්‍රවාහනයට අළුතින් එකතු කරගත් ඩීසල් බලවේග කට්ටල 15 සමඟ 2008 තුළ දී දුම්රිය ප්‍රවාහන කටයුතුවල ප්‍රසාරණයක් පෙන්නුම් කරන ලදි. තවද, "ශ්‍රී ලංකන් එයාලයින්" හි පියාසර කළ මගී කිලෝ මීටර් ප්‍රමාණය සියයට 6.8 කින් අඩු වීමත් සමඟ ගුවන් සේවා උප අංශය සංකෝචනය විය.

**වරාය නැව් බඩු මෙහෙයවීම හා සිවිල් ගුවන් සේවා කටයුතු උප අංශයේ වර්ධනය 2007 දී අත්කරගත් සියයට 8.8 ක වර්ධන වේගයට සාපේක්ෂව සියයට 8.0 ක් විය.** මෙම මන්දගාමී වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතුවල ඇති වූ සංකෝචනයයි. "සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්" ද ඇතුලත්ව කොළඹ වරාය මගින් හසුරුවනු ලැබූ භාණ්ඩ තොගය අඩි විස්සේ සමාන බහාලුම් ඒකක දශ ලක්ෂ 3.69 ප්‍රමාණයක් වූ අතර, එය සියයට 9.1 ක වර්ධනයක් වාර්තා කලේය. ඉකුත් වසරේ දී වූ සියයට 10.6 ක් වූ වර්ධන වේගයට සාපේක්ෂව ප්‍රතිනැව්ගත කළ භාණ්ඩ පරිමාව 2008 තුළ දී සියයට 11.5 කින් වර්ධනය විය. විශේෂයෙන්ම වසරේ අග කාලයේ සිට දක්නට ලැබුණු ලෝක ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳ කටයුතුවල සමස්ත පසුබෑමක් සිදු වුවද වරාය පර්යන්තයන්හි වූ කාර්යක්ෂමතාවයේ ඉහළ යාම අදාළ උප අංශයේ වර්ධනයට හේතු කාරක විය. වර්ෂය තුළ දී ගුවන් මගින් මෙහෙයවන ලද භාණ්ඩ පරිමාව සියයට 10.6 කින් සංකෝචනය විය.

**මෑත කාලීන වර්ධන ගාමකත්වය එලෙසම පවත්වා ගනිමින් තැපැල් හා විදුලි සංදේශ අංශය මගින් එකතු කරන ලද වටිනාකම සියයට 22.3 කින් ප්‍රසාරණය විය.** තවද, මෙම ප්‍රසාරණයත් සමඟ එම අංශය අඛණ්ඩව සියයට 20 කට වඩා වැඩි වර්ධනයක් වාර්තා කළ හය වැනි වර්ෂය ලෙස 2008 වර්ෂය වාර්තාගත වේ. සංකේත විහෙදුම් බහුවිධ ප්‍රවේශ තාක්ෂණ සබඳතා ද ඇතුලත්ව ස්ථාවර දුරකථන ග්‍රාහක පදනම සබඳතා දශ ලක්ෂ 3.4 දක්වා සියයට 25.7 කින් වැඩි විය. ස්ථාවර දුරකථන සබඳතා හා සසඳන කල ජංගම දුරකථන ග්‍රාහක පදනම් වඩා වැඩි වේගයකින් වර්ධනය වූ අතර, ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන්ගේ මිල තරඟයේ වාසි පාරිභෝගිකයාට අත්කර ගත හැකි පරිසරයක් යටතේ ජංගම දුරකථන සබඳතා ලබාගත් ග්‍රාහක සංඛ්‍යාව දශ ලක්ෂ 11.1 ක් විය. එහෙත්, නව ජංගම දුරකථන සබඳතා ප්‍රමාණය සම්බන්ධයෙන් 2007 වර්ෂයේ සියයට 47.5 ක් වූ වර්ධන අගය හා සසඳන කල 2008 වර්ෂයේ දී එහි වර්ධනය සියයට 38.8 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස දුරකථන ඝණත්වය එනම්, පුද්ගලයින් සියයකට අදාළව ගැනෙන දුරකථන සබඳතා සංඛ්‍යාව 2008 දී 71.9 ක් ලෙස ඇස්තමේන්තු විය. මේ අතර, සියයට 15.6 ක වර්ධනයක් පෙන්නුම් කරමින් අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් භාවිත ග්‍රාහක පදනම 234,000 දක්වා වැඩි විය.

**බැංකු කටයුතු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් උප අංශය 2007 අත්කර ගත් සියයට 8.7 ක වර්ධන වේගයට සාපේක්ෂව 2008 වසරේ දී සියයට 6.6 කින් පුළුල් වීමක් දක්නට ලැබුණි.** ලෝකය පුරා විශාල මූල්‍ය ආයතන සංඛ්‍යාවක් සිය කටයුතුවලින් අලාභ වාර්තා කළ 2008 වසර ගෝලීය වශයෙන් මූල්‍ය අංශයට වඩාත් අභියෝගාත්මක වසරක් විය. බැංකු අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වය මගින් පිළිබිඹු වන පරිදි දේශීය මූල්‍ය අංශයේ අඩු වර්ධන වේගයක් වාර්තා විය. ණය අත්තිකාරම් මගින් හා සුරකුම් මත වූ ආයෝජනවලින් ලත් ආදායම් වර්ධනය අඩු වීමත් සමඟ මෙම අංශයෙන් ලත් පොලී ආදායම් වර්ධනය ද පහළ වැටිණි. ආන්තික වශයෙන් වුවද පොලී නොවන ආදායම් ද අඩු විය. තවද, රක්ෂණ හා කල්බදු කටයුතුවල අඩු වීමත් සමඟ අනෙකුත් මූල්‍ය සේවාවන්ගේ ද පසුබෑමක් පෙනෙන්නට තිබිණි. මේ අතර, ගත වූ වර්ෂය තුළ දේපළ වෙළෙඳ අංශයේ කටයුතු සම්බන්ධයෙන් ද අඩු වීමක් වාර්තා විය.

**2007 වසරේ වූ සියයට 6.0 ක වර්ධන අගය හා සසඳන කල රාජ්‍ය සේවා උප අංශය වර්ධනය වූයේ සියයට 5.7 කිනි.** සන්නද්ධ හමුදාවලට කළ බඳවා ගැනීම් රාජ්‍ය අංශයේ සේවා වර්ධනයට දායක විය.

**2007 වසරේ සියයට 7.8 ක් වූ වර්ධන වේගයට සාපේක්ෂව පුද්ගලික සේවා උප අංශය 2008 වසරේ දී සියයට 6.5 ක වර්ධන වේගයක් වාර්තා කරන ලදි.** පුද්ගලික සෞඛ්‍යය, අධ්‍යාපන සේවා සහ අනෙකුත් පුද්ගලික සේවාවන්හි වූ දායකත්වය මත මෙම අංශයේ වර්ධනයක් පැවතිණි. එහෙත්, වසරේ දෙවන භාගය තුළ මෙම අංශයේ වර්ධන ගාමකත්වයෙහි පහළ යාමක් පෙන්නුම් කරන ලදි.

## 2.3 වියදම

**ආර්ථිකයේ දළ දේශීය වියදම (ද.දේ.වි.) හෙවත් සමස්ත දේශීය ඉල්ලුම පුද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ පරිභෝජනය හා ආයෝජනය මගින් මනිනු ලැබේ.** 2008 වසර තුළ දළ දේශීය වියදම පවත්නා මිල අනුව රුපියල් බිලියන 5,002 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 2007 වසරේ පෙන් වූ සියයට 21.1 ක

**විශේෂ සටහන 4**

## ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය - තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් උදෙසා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2008 සැප්තැම්බර් 08 වෙනි දින ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය (ශ්‍රී.ලං.සෞ.ද.) හඳුන්වා දෙන ලදී. මෙම දර්ශකය ගොඩ නැගීමේ පරමාර්ථය වූයේ පළාත්බදව ලබා ඇති සෞභාග්‍යය මට්ටම් සංසන්දනාත්මකව මැන ගැනීමයි. එබැවින් මෙය සාපේක්ෂ මිනුමකි.

'රටක සෞභාග්‍යය' යන්නෙන් ඇඟවෙන්නේ; *තිරසාර ලෙස රටේ ධනවත් බව වැඩි කොට සංවර්ධනයෙන් ලැබෙන ප්‍රතිලාභ මුළු මහත් සමාජයට ම භුක්ති විඳීමට ඉඩ සැලසීම මගින් ගුණාත්මක බවින් පිරිපුන් ජන ජීවිතයක පැවැත්මයි.* මේ අනුව, සියළු ජාතික ප්‍රතිපත්තීන්වල පරම පරමාර්ථය විය යුත්තේ ජනතාවගේ ජීවන තත්ත්වය සාරගර්භ කොට මුළු මහත් ජාතියේම සෞභාග්‍යය වැඩි කිරීමයි.

13 වන ව්‍යවස්ථා සංශෝධනයේ අවශ්‍යතාවයන්ට අනුකූලව තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම සඳහා රජයේ වාර්ෂික අයවැයෙන් පළාත් සභාවලට අරමුදල් ලබා දීමේ දී හෝ වෙන් කිරීමේ දී, ඒ සම්බන්ධයෙන් ජනාධිපතිට නිර්දේශයන් ලබා දීම සඳහා ශ්‍රී ලංකාව මුදල් කොමිසම පිහිටු විය. එලෙස අරමුදල් වෙන් කිරීමේ දී, මුදල් කොමිසම, සෑම පළාතක ම ජනගහනය, ඒකපුද්ගල ආදායම, පළාත්බදව ඇති සමාජ හා ආර්ථික විෂමතාවයන් සහ ඒකපුද්ගල ආදායම්වල වෙනස්කම් සැලකිල්ලට භාජනය කළ යුතු වේ.

ඉහත කාර්යයන් උදෙසා මුදල් කොමිසමට පළාත්බද සමාජ-ආර්ථික ප්‍රගතිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමත්, පළාත්වල පවතින සමාජ-ආර්ථික තත්ත්වයන්ට අනුව පළාත් ශ්‍රේණිගත කිරීමත් කළ හැකි විය යුතුය. ඒ සඳහා පළාත්වල සාපේක්ෂ සෞභාග්‍යය මැනීමට මිනුමක් අවශ්‍ය විය.

පුළුල් වශයෙන්, ජනතාවගේ යහ පැවැත්ම සහ ජනතාවට ඇති සමාජ ආර්ථික යටිතල පහසුකම්, පළාතක හෝ එහි ජනතාවගේ සෞභාග්‍යය මැනීමේ ප්‍රධාන අංගයන් වේ. සෞභාග්‍යය පෙන්නුම් කරන පුළුල් පරාමිතීන්ට අනුව පළාත් සංසන්දනාත්මකව ශ්‍රේණිගත කිරීමේ අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් කොමිසම හා එක්ව ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය නිර්මාණය කරන ලදී.

**සංඛ්‍යා සටහන වි. ස. 4.1**

**ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ ව්‍යුහය**

| උප දර්ශක සහ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයට ඒවායේ දායකත්වය | | විචල්‍යයන් |
|---|---|---|
| ආර්ථිකය හා ව්‍යාපාරික පරිසරය 30% | ආර්ථිකය 20% | 1. ඒකපුද්ගල ආදායම<br>2. සේවා නියුක්තිය<br>3. අවිධිමත් ක්ෂේත්‍රයේ වැටුප්<br>4. දුගී බවින් තොර වීම |
| | ව්‍යාපාරික පරිසරය 10% | 5. ඒකපුද්ගල පිරිවැටුම් බදු ආදායම<br>6. කර්මාන්ත ඝනත්වය |
| ජන ජීවිතයේ යහ පැවැත්ම 45% | සෞඛ්‍යය 20% | 7. ආරෝග්‍යශාලා ඇඳන් පුද්ගලයන් '000 කට<br>8. වෛද්‍යවරු පුද්ගලයන් '00,000<br>9. ළදරු ජීවිතාරක්ෂිතතාව '000 කට<br>10. මාතෘ ජීවිතාරක්ෂිතතාවය '00,000 කට |
| | අධ්‍යාපනය 20% | 11. පාසල් ඝනත්වය ව. කි. මී. 1 කට<br>12. සිසු/ගුරු අනුපාතය<br>13. ද්විතීයික අධ්‍යාපනයේ නියැලීම<br>14. සා. පෙළ සහ/ හෝ උ. පෙළ සමත් අනුපාතය |
| | ධනය 5% | 15. වාහන හිමිකම |
| සමාජ ආර්ථික යටිතල පහසුකම් 25% | | 16. ඒකපුද්ගල විදුලිබල පාරිභෝජනය<br>17. දුරකථන හිමිකම<br>18. බැංකු පහසුකම්<br>19. මාර්ග පහසුකම්<br>20. නීතිය හා සාමය |

විද්වත් උපදෙස් ලබා ගැනීම සඳහා පැවැති සාකච්ඡා වාර කිහිපයකින් පසුව, මෙවැනි දර්ශකයක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කැරෙන ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් ද සැලකිල්ලට ගෙන ශ්‍රී.ලං.සෞ.ද. නිර්මාණය කැරිණි. ඊට යොදාගත් විචල්‍යයන් ගණන 20 කි. විචල්‍යයන් තෝරා ගැනීමේ දී, ඒ විචල්‍යයන් මගින් ජන ජීවිතයේ විවිධ පැතිකඩ නියෝජනය වන්නේ ද යන බවත්, එම විචල්‍යයන්ට අදාළ දත්ත කාලීනව හා නොකඩවා ලබා ගැනීමට ඇති හැකියාවත් සලකා බලන ලදි.

මෙම දර්ශකයට භාවිතා කොට ඇති විචල්‍යයන් ප්‍රධාන වශයෙන් උප දර්ශක තුනකට බෙදිය හැකියි. මෙම උප දර්ශක, ඒවායේ දායකත්වය සහ ඊට අන්තර්ගත වන විචල්‍යයන් වි. ස. 4.1 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ මගින් හඳුන්වා දී ඇති මානව සංවර්ධන දර්ශකය වැනි මේ හා සමාන දර්ශක ගණනය කිරීමේ ක්‍රමවේදයන්ට අනුව යමින් ශ්‍රී.ලං.සෞ. දර්ශකයේ අඩංගු සියළු විචල්‍යයන් ද සම භරිතව ගෙන ඇත.

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයෙන් ලබා ගත් පළාත්බද ශ්‍රේණිගත කිරීම්, පුළුල් සංදර්භයක් තුළ පළාත්බදව පසුගාමීව පවතින ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අවකාශ සලසන බැවින් එකී සුවිශේෂී ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්හට සම්පත් වැඩි ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වෙන් කිරීමට අවකාශ සලසයි. එමෙන්ම, සම්පත් අනිසි ආකාරයෙන් බෙදී යාමත්, සම්පත් වෙන් කිරීම් නිසි පරිදි සිදු නොවීමත් මෙමගින් වලකාලිය හැකි වේ.

පළාත් අතර සංසන්දනයන් තුළින්, බලධාරීන් විසින් සපුරා ගත යුතු පළාත්බද ඉලක්ක පිහිටුවා ගැනීම සඳහා ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයෙන් ලත් පළාත්බද ශ්‍රේණිගත කිරීම් භාවිතා කළ හැකිය.

එමෙන්ම, සෞභාග්‍යය වැඩි දියුණු කිරීම සඳහා සමාජ-ආර්ථික ප්‍රතිපත්තීන් කෙතරම් ඵලදායී වූයේ ද යන්න මැනීමටත් ශ්‍රී.ලං.සෞ.ද. උපයෝගී කර ගත හැකිය.

2000-2007 කාලසීමාව සඳහා පළාත් අනුව ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයෙහි පෙන්වන අගයයන් 2 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**සංඛ්‍යා සටහන වි. ස. 4.2**

**පළාත් අනුව ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය 2000 - 2007**

| පළාත | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 |
|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 55.3 | 55.5 | 56.8 | 57.5 | 58.3 | 60.3 | 63.2 | 66.1 |
| මධ්‍යම | 42.4 | 44.2 | 46.2 | 46.5 | 47.0 | 47.8 | 50.5 | 52.9 |
| දකුණ | 41.7 | 42.9 | 45.1 | 45.2 | 44.4 | 47.5 | 48.8 | 51.5 |
| උතුර | 35.4 | 37.5 | 38.1 | 39.1 | 39.8 | 41.8 | 43.3 | 43.6 |
| නැගෙනහිර | 35.1 | 36.5 | 37.1 | 37.6 | 39.3 | 40.5 | 41.9 | 44.2 |
| වයඹ | 39.8 | 41.2 | 42.7 | 43.6 | 43.9 | 45.7 | 47.5 | 49.4 |
| උතුරු මැද | 38.5 | 39.5 | 41.2 | 42.2 | 42.0 | 44.1 | 45.6 | 48.4 |
| ඌව | 38.0 | 40.3 | 41.4 | 41.4 | 42.9 | 42.3 | 45.3 | 47.8 |
| සබරගමුව | 39.1 | 40.7 | 41.3 | 41.7 | 42.4 | 43.9 | 46.1 | 48.2 |
| **ශ්‍රී ලංකාව** | **42.4** | **43.9** | **45.3** | **45.9** | **46.4** | **48.1** | **50.3** | **52.7** |

**වි. ස. 4.1 රූප සටහන**

**ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකයේ වෙනස්වීම 2000 සහ 2007**




2007 වර්ෂයේ සෞභාග්‍ය දර්ශකයේ අගයන්ට අනුව පළාත් දෙකක් පමණක් ජාතික සාමාන්‍යයට වඩා වැඩි සෞභාග්‍ය මට්ටමකට ළඟා වී ඇති බව පෙනී යයි. ප්‍රධාන වශයෙන් ආර්ථිකය සහ ව්‍යාපාරික පරිසරය යන උප දර්ශකයෙන් පෙන් වූ පසුබෑමෙහි ප්‍රතිඵලයක් ලෙස උතුර හා නැගෙනහිර පළාත්, දර්ශකයේ 2007 වසරේ වූ අඩුම අගයන් ලබා ඇත. විශේෂයෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා රජය විසින් පුළුල් ලෙස ක්‍රියාත්මක කළ සුභසාධන ක්‍රියාමාර්ග හේතුවෙන් ජන ජීවිතයේ යහ පැවැත්ම දැක්වෙන උප දර්ශකය මගින් පෙන්වනු ලබන පළාත් අතර විෂමතාවය අඩුය. කලාපයේ අනෙකුත් රටවල් සමග සසඳා බලන කළ මෙම අංශවලින් ශ්‍රී ලංකාව ජයග්‍රහණ අත්කර ගෙන ඇති බව ප්‍රකට කරුණකි. වඩාත් වැදගත් වනුයේ, යම් පළාතක් හෝ ඒ ඒ පළාත්, උප දර්ශකවලින් සහ සංයුක්ත දර්ශකය තුළින් ලබා ගෙන ඇති ප්‍රතිඵල, පළාත්බදව සහ යම් කාල පරාසයක් තුළ එනම්, දර්ශකයන් තුළින් ලැබූ අගයයන් තිරස් සහ සිරස් ලෙස, පුළුල් විශ්ලේෂණයකට ලක් කිරීම මගින් පළාත්වල සෞභාග්‍යය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත් වීම්, ප්‍රමුඛතා සහ ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග හඳුනා ගැනීමට මෙම දර්ශකවල අගයන් භාවිතා කිරීමයි.

2

ජාතික නිෂ්පාදිතය හා වියදම

**2.11 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම**

රුපියල් දශ ලක්ෂ

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව | | | 2002 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007(අ) | 2008(ආ) | 2006 | 2007(අ) | 2008(ආ) |
| 1. **දේශීය ඉල්ලුම** | | | | | | |
| පරිභෝජනය | 2,439,816 | 2,949,712 | 3,787,438 | 1,704,633 | 1,781,906 | 1,924,807 |
| (% වෙනස) | 21.2 | 20.9 | 28.4 | 7.1 | 4.5 | 8.0 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 822,240 | 1,000,320 | 1,214,808 | 583,986 | 630,882 | 659,850 |
| (% වෙනස) | 25.0 | 21.7 | 21.4 | 13.4 | 8.0 | 4.6 |
| **මුළු දේශීය ඉල්ලුම** | 3,262,056 | 3,950,032 | 5,002,246 | 2,288,619 | 2,412,788 | 2,584,657 |
| **(% වෙනස)** | 22.1 | 21.1 | 26.6 | 8.6 | 5.4 | 7.1 |
| 2. **විදේශීය ඉල්ලුම** | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 885,381 | 1,041,935 | 1,098,376 | 704,408 | 756,022 | 758,972 |
| (% වෙනස) | 11.6 | 17.7 | 5.4 | 3.8 | 7.3 | 0.4 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 1,208,757 | 1,413,278 | 1,690,056 | 902,463 | 936,154 | 978,129 |
| (% වෙනස) | 19.4 | 16.9 | 19.6 | 6.9 | 3.7 | 4.5 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | **-323,376** | **-371,344** | **-591,680** | **-198,055** | **-180,132** | **-219,157** |
| 3. **මුළු ඉල්ලුම** | **2,938,680** | **3,578,688** | **4,410,567** | **2,090,564** | **2,232,656** | **2,365,500** |
| **(% වෙනස)** | 19.8 | 21.8 | 23.2 | 7.7 | 6.8 | 6.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රසාරණාත්මක අගයට සාපේක්ෂව සියයට 26.6 ක ඉහළ නාමික වර්ධන අගයකින් වැඩි වී ඇත. දළ දේශීය වියදමෙහි ඉහළ ගිය මෙම වර්ධන ගාමකත්වයට 2007 වසරේ මිල මට්ටමේ හා මූර්ත දළ දේශීය වියදමේ වූ පිළිවෙළින් සියයට 14.9 ක හා සියයට 5.4 ක වර්ධන වේගයන්ට සාපේක්ෂව 2008 වසරේ එම අගයන් පිළිවෙළින් සියයට 18.2 කින් හා සියයට 7.1 කින් වැඩි වීම හේතු විය. පරිභෝජන හා ආයෝජන වියදම් ද මෙම වර්ධනයට දායක වූ අතර, පරිභෝජන වියදම් වැඩි වීම ආයෝජන වියදම් වර්ධනයට වඩා වැඩි වේගයක් පෙන්නුම් කරන ලදි. දළ දේශීය නිෂ්පාදනය එනම්, දළ දේශීය වියදම සහ භාණ්ඩ හා සේවාවන්හි ශුද්ධ අපනයන වටිනාකමෙහි එකතුව පවත්නා මිල ගණන් අනුව රුපියල් බිලියන 4,411 ක් දක්වා සියයට 23.2 කින් වැඩි විය.

## පරිභෝජනය

**2008 වසරේ මුළු පරිභෝජන වියදම එනම්, පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම පරිභෝජන වියදමේ එකතුව වෙළෙඳපොළ මිල අනුව රුපියල් බිලියන 3,787 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ඉකුත් වසරේ වූ සියයට 20.9 ක ප්‍රසාරණාත්මක අගය හා සසඳන කල 2008 වසර තුළ සියයට 28.4 කින් වැඩි විය.** පුද්ගලික පරිභෝජනය සියයට 27.9 කින් වර්ධනය වූ අතර, රාජ්‍ය අංශයේ පරිභෝජනය සියයට 30.6 ක තරම් ඉහළ අනුපාතයකින් වැඩි විය. සමස්ත පරිභෝජනයේ වූ මෙම ඉහළ වර්ධනය මූර්ත පරිභෝජනයෙහි වූ සියයට 8.0 ක ප්‍රසාරණයෙහි හා මිල මට්ටම්වල වූ සියයට 18.9 ක ඉහළ යාමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. පසුගිය වර්ෂ 4 තුළ පුද්ගලික පරිභෝජන වියදමෙහි පෙනෙන්නට තිබූ අඩුවන උපනතිය ආපසු හරවමින් දළ ජාතික නිෂ්පාදිතයට එහි දායකත්වය 2007 වූ සියයට 67.2 මට්ටමේ සිට 2008 වසර තුළ සියයට 69.7 ක් දක්වා වැඩි වූ බව පෙනෙන්නට තිබේ. රාජ්‍ය අංශයේ පරිභෝජන දායකත්වය ද ඉකුත් වසරේ වාර්තා වූ සියයට 15.3 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසර තුළ සියයට 16.2 දක්වා වැඩි වී ඇත.

**ආහාර, බීම වර්ග හා දුම්කොළ මත වූ පුද්ගලික පරිභෝජන වියදම්හි දායකත්වය 2007 තුළ දී පැවති සියයට 41.0 මට්ටමේ සිට 2008 වසර තුළ දී සියයට 37.8 දක්වා අඩු විය.** 2007 වසරේ වූ සියයට 20.0 ක් වූ වර්ධන අනුපාතය හා සසඳන කල 2008 වසර තුළ එය වර්ධනය වූයේ සියයට 18.0 ක් තරම් වූ පහළ අනුපාතයකිනි. මෙම පහළ යාමට වසරේ දෙවන භාගය තුළ පෙනෙන්නට තිබූ උද්ධමන පීඩනයේ පහළ යාම හේතු වන්නට ඇත. 2007 වර්ෂයේ වූ සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව රෙදිපිළි හා පාවහන් මත වූ වියදම නාමික වශයෙන් සියයට 13.7 කින් වැඩි විය. කෙසේ වුවද, 2007 වසරේ සියයට 6.4 ක් වූ මෙම අංශයේ දායකත්වය 2008 වසරේ සියයට 5.7 දක්වා තවදුරටත් අඩු වීමක් දක්නට විය.

**2.12 සංඛ්‍යා සටහන** — **පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2006 | 2007(අ) | 2008(ආ) | 07/06 | 08/07 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 41.3 | 41.0 | 37.8 | 20.0 | 18.0 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 7.6 | 6.4 | 5.7 | 2.0 | 13.7 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 10.2 | 11.1 | 12.7 | 30.7 | 46.8 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 6.6 | 6.2 | 5.8 | 12.9 | 19.5 |
| 5. සෞඛ්‍යය | 1.5 | 1.7 | 1.8 | 32.4 | 40.3 |
| 6. ප්‍රවාහනය | 18.9 | 19.2 | 21.8 | 22.6 | 45.3 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 3.0 | 3.6 | 3.6 | 43.6 | 28.9 |
| 8. අධ්‍යාපනය | 0.1 | 0.1 | 0.1 | 12.4 | 13.7 |
| 9. හෝටල් සහ ආපන ශාලා | 1.8 | 1.6 | 1.5 | 7.9 | 17.4 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 3.8 | 4.2 | 4.9 | 33.5 | 48.2 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 9.2 | 8.9 | 7.7 | 17.2 | 10.5 |
| 12. අඩු කළා : විදෙශිකයින් මෙතෙරදී කරන වියදම් | 4.0 | 3.8 | 3.3 | 14.9 | 9.9 |
| මුළු පෞද්ගලික පරිභෝජන වියදම | **100.0** | **100.0** | **100.0** | **20.9** | **27.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**නිවාස, ජලය, විදුලිබලය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන සඳහා දරන ලද වියදම සියයට 46.8 ක් තරම් ඉහළ අනුපාතයකින් වර්ධනය විය.** වසර අගදී ඉන්ධන මිල මට්ටම්වල පහළ යාමක් පෙන්නුම් කළ ද පළමු මාස නවය තුළ පෙනෙන්නට තිබූ බොර තෙල් මිලෙහි සීඝ්‍ර ඉහළ යාම හා එහි ප්‍රතිඵලයක් ලෙස මිල වැඩිවන ලෙස විදුලිය මත බදු සංශෝධනයන් කිරීම මෙම වියදම් ඉහළ යාමට හේතු විය. මෙම අංශයේ දායකත්වය ද 2007 වසරේ වූ සියයට 11.1 මට්ටමෙහි සිට 2008 වසර තුළ සියයට 12.7 දක්වා තවදුරටත් වර්ධනය විය.

**ප්‍රධාන වශයෙන් සමස්ත ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගණන්වල ඉහළ යාම පිළිබිඹු කරමින් ගෘහස්ථ භාණ්ඩ හා උපකරණ සහ මූලික නිවාස නඩත්තු වියදම්හි නාමික වැඩි වීම ඉකුත් වසරේ දී වූ සියයට 12.9 ට සාපේක්ෂව 2008 වසර තුළ දී සියයට 19.5 ක් විය.** කෙසේ වුවද, පුද්ගලික පරිභෝජන වියදම් තුළ මෙම අංශයෙහි දායකත්වය 2007 වසරේ දී පැවති සියයට 6.2 මට්ටමෙහි සිට සියයට 5.8 දක්වා තවදුරටත් පහළ යාමක් පෙනෙන්නට විය.

**පුද්ගලික පරිභෝජන වියදම තුළ අධ්‍යාපන වියදම්හි දායකත්වය ඉකුත් වසරේ දී මෙන් සියයට 0.1 මට්ටමක නොවෙනස්ව පැවති අතර, 2008 වසර තුළ පරිභෝජන වියදම් තුළ සෞඛ්‍යය සේවා මත වූ වියදම්හි දායකත්වය සියයට 40.3 ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් එහි දායකත්වය සියයට 1.8 ක මට්ටමෙහි පැවතිණි.** පොදු ජනතාව වෙත රජය විසින් සපයනු ලබන නිදහස් සෞඛ්‍ය සේවා හා අධ්‍යාපන පහසුකම්වල බලපෑම පිළිබිඹු කරමින් මුළු පෞද්ගලික පරිභෝජන වියදම් තුළ මෙම අංශ දෙකෙහි දායකත්වයන් තවමත් පහළ මට්ටමක පවතී.

**වසරේ මුල් භාගය තුළ බස් ගාස්තු හා දුම්රිය ගාස්තු ඉහළ යාමට හේතු වූ ඩීසල් සහ පෙට්‍රල් මිල ගණන්වල සංශෝධිත ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රවාහනය මත වූ වියදම් සියයට 45.3 දක්වා ඉහළ අනුපාතයකින් වර්ධනය විය.** කෙසේ වුවද, වසරේ අවසාන කාර්තුව තුළ හඳුන්වා දුන් බස් ගාස්තු හා ඉන්ධන ගාස්තු අඩු වන පරිදි වූ මිල සංශෝධන මෙම අංශයෙහි වියදම අඩු කිරීමෙහිලා සැලකිය යුතු බලපෑමක් නොදක්වන ලදි.

**2007 වසරේ පෙන්නුම් කළ සියයට 17.2 ක් වූ වර්ධන අනුපාතය හා සසඳන කළ 2008 දී සියයට 10.5 ක් තරම් අඩු වර්ධන වේගයක් පෙන්නුම් කළ අනේවාසික වියදම්හි දායකත්වය 2007 වසරේ වූ සියයට 8.9 ක සිට 2008 දී සියයට 7.7 දක්වා අඩු විය.**

**2007 වසරේ වර්ධනය වූ සියයට 21.1 ට සාපේක්ෂව රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම් 2008 වසර තුළ දී සියයට 30.6 තරම් ඉහළ වේගයකින් වැඩි විය.** රජයේ වැටුප් මත වූ වියදම් මද වේගයකින් වැඩි වීම සලකන කල රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම්හි ඉහළ යාමේ වේගය තීව්‍ර කිරීමට හේතු වූයේ රාජ්‍ය අංශය තුළ භාණ්ඩ හා සේවා මත වූ අනෙකුත් වර්තන වියදම්හි ඉහළ යාමයි.

## ආයෝජනය

**දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය හෙවත් ආයෝජන කටයුතු මත වියදම ඉකුත් වසරේ දී වූ සියයට 21.7 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසර තුළ දී නාමික වශයෙන් සියයට 21.4 කින් ප්‍රසාරණය වූ බව පෙනේ.** ආයෝජන වියදම 2007 දී වූ රුපියල් බිලියන 1,000 සිට 2008 දී රුපියල් බිලියන 1,215 දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. තවද, ආයෝජන කටයුතුවල මූර්ත වර්ධනය ඉකුත් වසරේ වූ සියයට 8.0 ක වැඩි වීමට සාපේක්ෂව 2008 වසරේ සියයට 4.6 කින් ප්‍රසාරණය වීමක් සිදු විය. 2008 වසර තුළ ආනයනය කළ ආයෝජන භාණ්ඩ වටිනාකම රුපියල් බිලියන 323 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදනයට අනුපාතයක් ලෙස ගත් කල ආයෝජන අනුපාතය 2007 දී වූ සියයට 28.0 සිට 2008 දී සියයට 27.5 දක්වා ආන්තික ලෙස අඩු වී ඇත.

**පුද්ගලික අංශයේ ආයෝජන වියදම්හි නාමික අගය රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ආයෝජන කටයුතු ද ඇතුලත්ව 2008 වසර තුළ දී සියයට 15.0 කින් වර්ධනය විය.** 2007 වසරේ දී වූ සියයට 14.8 ක වර්ධනයට සාපේක්ෂව ගත් කල ආයෝජන කටයුතුවල 2008 වසරේ ඇති වූ ආන්තික වශයෙන් ඉහළ ගිය වර්ධනයට වසරේ ආනයනය කළ ආයෝජන භාණ්ඩවල මිල මට්ටම් වැඩි වීම හා ඒ ආශ්‍රිත වැටුප් අනුපාතිකවල සිදු වූ වැඩි වීම බලපාන ලදි. මේ අතර, පුද්ගලික අංශයේ ආයෝජන දායකත්වය මුළු ආයෝජන වියදමෙන් සියයට 76.5 ක් ලෙස ගණනය කර ඇත.

**2.4 රූප සටහන** | **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන**

**ව්‍යාපෘති සංඛ්‍යාව**




**ආයෝජන වටිනාකම**




(අ) පුළුල් කරන ලද ව්‍යාපෘතීන් ඇතුලුව
(ආ) මිහින් ලංකා පෞද්ගලික සමාගම සඳහා කරන ලද දේශීය ආයෝජන හැර

**විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2007 වර්ෂයේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 734.3 සමග සැසඳීමේදී 2008 වර්ෂයේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 888.9 ක් දක්වා සියයට 21 කින් ඉහළ ගියේය.** 2008 වසරේ දී ආයෝජන මණ්ඩලය විසින් විදේශීය සෘජු ආයෝජන රට තුළට ආකර්ෂණය කර ගැනීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ලදි. මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් වලින් සියයට 62 කට විදුලි සංදේශ අංශය දායක වූ අතර, නිෂ්පාදන හා බලශක්ති උත්පාදන යන අංශ පිළිවෙළින් සියයට 21 කින් හා සියයට 10 කින් දායක විය.

**ආයෝජන මණ්ඩල පනතේ 17 හා 16 වන වගන්ති යටතේ, රුපියල් බිලියන 489.6 ක වටිනාකමකින් යුතු ව්‍යාපෘති 604 ක් 2007 වසරේදී අනුමත කර ඇති අතර, ඒ හා සැසඳීමේ දී 2008 වසරේදී රුපියල් බිලියන 460.5 ක ආයෝජන වටිනාකමකින් යුතු ව්‍යාපෘති 462 ක් අනුමත කර ඇත.** මෙයින් නව ව්‍යාපෘති 126 ක පූර්ණ අයිතිය විදේශීය ආයෝජකයන් සතු විය. ව්‍යාපෘති 99 ක අයිතිය හවුල් ව්‍යාපාර සතු වූ අතර, ඉතිරිය ශ්‍රී ලාංකීය ආයෝජකයන් සතු විය. මෙම අනුමත කරනු ලැබූ ආයෝජන වලින් වැඩි ප්‍රමාණයක් සේවා අංශයෙහි වූ අතර, 2008 වර්ෂයේ දී සේවා අංශය අනුමත කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව 308 ක් ද ඒ සඳහා වූ ආයෝජන වටිනාකම රුපියල් බිලියන 413.7 ක් ද විය. සේවා අංශය යටතේ, නිවාස හා දේපොළ සංවර්ධනය, හෝටල්, ආපනශාලා හා විනෝද සේවා, අධ්‍යාපන හා පුහුණු කටයුතු ආයතන, බලශක්ති උත්පාදන බලාගාර, වාණිජ කාර්යාල, පරිගණක මෘදුකාංග සංවර්ධනය, දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන හා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා උපකාරී වන බාහිර පාර්ශ්ව ආයතන යනාදිය අනුමත කළ ආයෝජනවල ප්‍රධාන දායකයන් විය. මේ අතර, 2008 වර්ෂයේදී කර්මාන්තශාලා නිෂ්පාදන අංශය විසින් වටිනාකම රුපියල් බිලියන 46.7 කින් යුත් අනුමත කරන ලද නව ව්‍යාපෘතීන් 154 ක් වාර්තා කළ අතර, ඉන් රුපියල් බිලියන 12.5 ක් වූ වැඩිම ආයෝජනය ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩයෙන් විය. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2007 වසරේ අනුමත වූ ව්‍යාපෘති 73ට සාපේක්ෂව 2008 වසරේ දී අනුමත වූ ව්‍යාපෘති සංඛ්‍යාව 34 ක් විය. 2008 වසර තුළ ආයෝජන මණ්ඩලය යටතේ දැනටමත් සිදුකර ඇති ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 100.7 ක් වූ අතර 2008 වසර අග වන විට එහි සමුච්චිත ආයෝජන වටිනාකම රුපියල් බිලියන 701.8 විය.

**2.13 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. දශ ලක්ෂ) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(ආ) | 2007(අ) | | | 2008(ආ) | | | 2007(අ) | 2008(ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 677 | 496 | 285,440 | 300,712 | 586,152 | 346,516 | 144,873 | 491,389 | 123,131 | 60,644 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 637 | 448 | 282,986 | 300,000 | 582,986 | 342,835 | 143,858 | 486,693 | 120,519 | 57,328 |
| 16 වන වගන්තිය යටතේ | 40 | 48 | 2,454 | 712 | 3,166 | 3,681 | 1,015 | 4,696 | 2,612 | 3,316 |
| 17 වන වගන්තිය යටතේ ගිවිස ගත් ව්‍යාපෘති (ඇ) | 298 | 238 | 122,590 | 111,387 | 233,977 | 73,938 | 108,226 | 182,164 | 60,843 | 29,119 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඇ) | 1,977 | 1,989 | 364,244 | 236,849 | 601,093 | 440,408 | 261,416 | 701,824 | 451,934 | 458,165 |
| වාණිජ කටයුතුවල නිරත වූ (ඇ) | 2,612 | 2,595 | 198,679 | 207,284 | 405,963 | 197,766 | 213,522 | 411,288 | 385,491 | 378,272 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) (ඈ) | 1,823 | 1,805 | 180,995 | 197,245 | 378,240 | 180,057 | 203,483 | 383,540 | 350,870 | 343,607 |
| 16 වන වගන්තිය යටතේ (ඇ) | 789 | 790 | 17,684 | 10,039 | 27,723 | 17,709 | 10,039 | 27,748 | 34,621 | 34,665 |
| **කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** | | | | | | | | | | |
| ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඇ) | 1,667 | 1,751 | ලැ.නො. | ලැ.නො. | 121,456 | ලැ.නො. | ලැ.නො. | 130,357 | 275,883 | 282,706 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඈ) පුළුල් කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

**2008 වසරේ දී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ, රුපියල් බිලියන 120.1 ක ආයෝජන වටිනාකමකින් යුත් නව ව්‍යාපෘති 213 ක් සඳහා ගිවිසුම් වලට එළඹි අතර, ඊට සාපේක්ෂව 2007 වසරේ දී රුපියල් බිලියන 181.1 ක ආයෝජන වටිනාකමකින් යුත් නව ව්‍යාපෘති 254 ක් සඳහා ගිවිසුම් ඇති කරගන්නා ලදී.** මෙම ගිවිසුම් වලට එළඹි ව්‍යාපෘතීන් අතුරින්, ව්‍යාපෘතීන් 131 ක් සේවා අංශය තුළ වූ අතර එය මුළු ආයෝජන වටිනාකමින් සියයට 82 ක් විය. ඉතිරිය කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ ව්‍යාපෘති වලින් සමන්විත විය. 2008 වර්ෂයේ දී, සේවා අංශයෙහි ගිවිසගත් ආයෝජන ප්‍රධාන වශයෙන් සමන්විත වූයේ නිවාස හා දේපොළ සංවර්ධනය, පරිගණක මෘදුකාංග සංවර්ධනය හා දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාවලීන්, හෝටල්, ආපනශාලා හා විනෝද සේවා, අධ්‍යාපන හා පුහුණු කටයුතු ආයතන, පර්යේෂණ ආයතන, වාණිජ කාර්යාල, දුරකථන ඇමතුම් මධ්‍යස්ථාන, ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා උපකාරී වන බාහිර පාර්ශව ආයතන බලශක්ති උත්පාදනය, කලාපීය මෙහෙයුම් මධ්‍යස්ථාන සහ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සේවා යන අංශයන්ය. මේ අතර 2008 වසරේ දී ආයෝජන මණ්ඩලය විසින් රුපියල් බිලියන 62 ක ආයෝජන වටිනාකමකින් යුත් නව ව්‍යාපෘතීන් 25 ක් ප්‍රසාරණය සඳහා ගිවිසුම් ඇති කර ගන්නා ලදි.

**2007 වසරේ දී ආයෝජන මණ්ඩල පනතේ 17 හා 16 වන වගන්ති යටතේ වාණිජ කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතීන් සංඛ්‍යාව 2,502 ක් වූ අතර එය 2008 වර්ෂයේ දී 2,485 ක් විය.** මෙම ව්‍යාපෘතීන් සඳහා විදේශ ආයෝජනයෙහි දායකත්වය මුළු ආයෝජන වටිනාකමින් සියයට 49.1 ක් විය. ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවලින් සේවා අංශය යටතේ ව්‍යාපෘති 1,240 ක් ද, කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ ප්‍රධාන කාණ්ඩයන් වන රෙදිපිළි, ඇඟළුම් හා සම් භාණ්ඩ නිෂ්පාදිත කාණ්ඩය යටතේ ව්‍යාපෘති 475 ක් ද, ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය යටතේ ව්‍යාපෘති 180 ක් ද, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩය මගින් ව්‍යාපෘති 155 ක් ද, සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර හා ප්‍රවාහන උපකරණ කාණ්ඩය යටතේ ව්‍යාපෘති 99 ක් ද ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩය යටතේ ව්‍යාපෘති 88 ක් ද විය.

**2008 වසර අවසානයේ දී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙහි ලියාපදිංචි මුළු ආයතන සංඛ්‍යාව 1,751 ක් වන අතර, එහි ආයෝජන වටිනාකම රුපියල් බිලියන 130.4 ක් විය.** ලියාපදිංචි ආයතන වලින් සියයට 82 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් වාර්තා වූ අතර එය මුළු ආයෝජන වටිනාකමින් සියයට 93 ක් විය. මෙයින් ආයතන 421 ක් රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත කාණ්ඩයට අයත් වන අතර ඉතිරි ආයතන රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත, සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර හා ප්‍රවාහන උපකරණ, ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදිත හා ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩ වලට අයත් විය. එමෙන්ම, 2008 වසර තුළදී කර්මාන්ත සංවර්ධන මණ්ඩලය නව ව්‍යවසායයන් 331 ක් ආරම්භ කිරීමට සහයෝගය දුන් අතර, දැනට පවතින ව්‍යවසායයන් 600 කට පහසුකම් සැලසීම හා ප්‍රාදේශීය මට්ටමේ ස්වයං රැකියා ඒකක 1,087 ක් දිරිමත් කිරීමට සහයෝගය දීම ද සිදුවිය.

රාජ්‍ය අංශයේ ආයෝජන කටයුතුවල වර්ධනය **2007 වර්ෂයේ දී වූ සියයට 61.9 ක් වූ ඉහළ නාමික වර්ධනයක සිට සියයට 48.3 දක්වා අඩු විය.** රට තුළ මාර්ග පද්ධති සංවර්ධනය, ජලය බෙදාහැරීම, ධාරිතා ප්‍රසාරණය සහ විදුලිබල ප්‍රවේශය වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල නියැලෙමින් රජය තවදුරටත් ආයෝජන කටයුතුවල නියුතු වීමක් දක්නට ලැබිණි. මේ තුළ ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතිය, කෙරවලපිටිය ද්විත්ව චක්‍රීය බලාගාර ව්‍යාපෘතිය සහ දක්ෂිණ අධිවේගී මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතීන් ඇතුලත්ය. සිවිල් ගැටුම් ආශ්‍රිත ප්‍රදේශවල සංවර්ධනය සඳහා විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ව්‍යාපෘතිවල නියුතු වීම ද අඛණ්ඩව සිදු විය.

## පවත්නා සම්පත් සහ උපයෝජනය

**දළ දේශීය නිෂ්පාදනය හා ආනයනික භාණ්ඩ හා සේවාවලින් සමන්විත ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය 2007 වසරේ වූ රුපියල් බිලියන 4,992 සිට 2008 වසර තුළ දී රුපියල් බිලියන 6,101 දක්වා සියයට 22.2 කින් වැඩි විය.** ඒ අනුව, 2008 වසරේ භාවිතා කළ හැකි වූ සම්පත් ප්‍රමාණය 2007 වසරේ දී පෙන්නුම් කළ සියයට 20.4 ට සාපේක්ෂව වඩා වැඩි වේගයකින් වර්ධනය විය. 2008 වසර තුළ දේශීය සම්පත් ප්‍රමාණය සියයට 23.2 ක වේගයකින් වැඩි වූ අතර වසර තුළ විදේශීය සම්පත් ප්‍රමාණය වර්ධනය වූයේ සියයට 19.6 ක තරම් අඩු මට්ටමකිනි. භාවිතා කළ හැකි වූ සමස්ත සම්පත් ප්‍රමාණයෙන් සියයට 72 ක් දේශීය සම්පත් වූ අතර ඉතිරි සියයට 28 විදේශීය සම්පත් ලෙස ගණනය වී ඇත. 2008 වර්ෂය තුළ භාවිතා කළ සම්පත් ප්‍රමාණයේ මූර්ත වැඩි වීම 2007 දී අත්කර ගත් සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 5.5 ක් විය.

**2008 වසර තුළ සමස්ත සම්පත් උපයෝජන ප්‍රමාණය සමන්විත වූයේ පරිභෝජනය රුපියල් බිලියන 3,787 ක්, ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 1,215 ක් හා භාණ්ඩ හා සේවා අපනයන රුපියල් බිලියන 1,098 ක් වශයෙනි.** පරිභෝජන දායකත්වය 2007 වසරෙහි සියයට 59 ක මට්ටමේ සිට සියයට 62 දක්වා තවදුරටත් වැඩි වෙමින් සියයට 28.4 ක වැඩිම වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදන දායකත්වය ඉකුත් වසරේ සියයට 17.7 සිට 2008 වසර තුළ සියයට 18.3 දක්වා ආන්තික වැඩි වීමක් වාර්තා කළේය. මේ අතර, 2007 වසරේ වූ සියයට 17.7 ක වර්ධනයට සාපේක්ෂව 2008 වසරේ දී අපනයන වර්ධනය සියයට 5.4 දක්වා අඩු වී ඇත. එබැවින්, සම්පත් උපයෝජනය තුළ අපනයන භාණ්ඩ හා සේවා දායකත්වය ඉකුත් වසරේ වූ සියයට 20.9 මට්ටමේ සිට සියයට 18.0 දක්වා පිරිහීමක් දක්වයි.

**2.14 සංඛ්‍යා සටහන** — **සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2007 (අ) | 2008(ආ) | 2007(අ) | 2008(ආ) |
| 1. **සම්පත්** | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 71.7 | 72.3 | 21.8 | 23.2 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 28.3 | 27.7 | 16.9 | 19.6 |
| **එකතුව** | **100.0** | **100.0** | **20.4** | **22.2** |
| 2. **උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 59.1 | 62.1 | 20.9 | 28.4 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 17.7 | 18.3 | 21.0 | 26.1 |
| පෞද්ගලික | 14.3 | 14.0 | 14.3 | 19.4 |
| රජය | 3.4 | 4.3 | 61.0 | 53.9 |
| තොග වෙනස්වීම | 2.3 | 1.6 | 26.6 | -14.0 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 20.9 | 18.0 | 17.7 | 5.4 |
| **එකතුව** | **100.0** | **100.0** | **20.4** | **22.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.5 රූප සටහන** — **2008 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

**භාණ්ඩ සහ සේවා සැපයුම**
**(රුපියල් බිලියන 6,101)**




**භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම**
**(රුපියල් බිලියන 6,101)**



**2008 වසර තුළ දේශීය සම්පත් සැපයුම විදේශීය සම්පත් සැපයුමට වඩා ඉහළ වේගයකින් වැඩි විය.** එහෙත්, 2007 වසර හා සසඳන කල දේශීය හා විදේශීය සම්පත් දායකත්වය බොහෝ දුරට පිළිවෙලින් සියයට 72 හා සියයට 28 මට්ටමින් නොවෙනස්ව පැවතිණි. සියයට 72 ක් වූ දේශීය භාණ්ඩ හා සේවා දායකත්වය තුළ කෘෂිකාර්මික භාණ්ඩ හා කාර්මික භාණ්ඩවල දායකත්වය පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 21 ක් වූ අතර දේශීය සේවාවන්හි දායකත්වය සියයට 41 ක් විය. 2007 වසරට අදාළව දේශීය භාණ්ඩ හා සේවා තුළ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල දායකත්වයන් පිළිවෙලින් සියයට 8 ක්, සියයට 21 ක් හා සියයට 42 ක් විය. සම්පත් උපයෝජනය තුළ ආනයනය කළ භාණ්ඩ හා සේවාවල දායකත්වය ඉකුත් වසරේ වූ සියයට 25 ක් හා සියයට 3 ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

**2007 වසරේ පැවති සමස්ත ඉල්ලුම් ව්‍යුහයට සාපේක්ෂව 2008 වසරේ සමස්ත ඉල්ලුම නාමික වශයෙන් සියයට 23.2 කින් වැඩි වූ අතර පරිභෝජනය, ආයෝජනය සහ අපනයනයන්ගේ සංයුතිය පරිභෝජනයට හිතකර වන අන්දමින් වෙනස් විය.** 2007 වර්ෂයේ දී පැවති සියයට 48 මට්ටමේ සිට සියයට 50 දක්වා ඉහළ ගිය පුද්ගලික අංශයේ පරිභෝජන දායකත්වය 2008 වසර තුළ වැඩි වූ සමස්ත පරිභෝජන දායකත්වයට හේතු විය. පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ආයෝජන දායකත්වය 2008 වසර තුළ දී පිළිවෙලින් සියයට 15 හා සියයට 5 විය. භාණ්ඩ හා සේවා අපනයනවල සැලකිය යුතු අඩු වීමක් 2008 වසරේ පෙනෙන්නට තිබිණි. 2007 වසරට සාපේක්ෂව මේ තුළ භාණ්ඩ අපනයන දායකත්වය සියයට 17 සිට සියයට 14 දක්වා අඩු වූ අතර, සේවා අපනයන දායකත්වය සියයට 4 ක් ලෙස නොවෙනස් මට්ටමක පැවතිණි.

### ඉතුරුම්

**විශේෂයෙන්ම, වසරේ පළමු මාස 9 තුළ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ආහාර හා තෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම නිසා 2008 වසරේ දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම්හි සංකෝචනයක් විය.** මෙය, දේශීය ඉතුරුම් හා ආයෝජනය අතර වෙනස එනම්, සම්පත් පරතරය ඉහළ යාමට හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතයක් ලෙස ගත් කල සම්පත් පරතරය 2007 වසරේ සියයට 10.4 සිට 2008 වර්ෂය තුළ දී සියයට 13.4 දක්වා ඉහළ ගියේය.

**2007 වසරේ සියයට 26.1 කින් වර්ධනය වූ දේශීය ඉතුරුම් මෙම වර්ෂය තුළ සියයට 0.9 කින් පහළ වැටිණි.** ආනයන වර්ධනයේ ඉහළ යාමත් අපනයන ඉපැයීම්වල පසුබෑමත් සමඟ වූ ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි පහළ යාම 2008 වසරේ වූ දේශීය ඉතුරුම් අඩු වීමට බලපෑ හේතු ලෙස සඳහන් කළ හැක. 2008 වසරේ ඇස්තමේන්තු කළ දේශීය ඉතුරුම් අගය රුපියල් බිලියන 623 ක් වූ අතර දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල එය 2007 වසරේ වූ සියයට 17.6 ට සාපේක්ෂව සියයට 14.1 දක්වා අඩු වීමක් පෙන්නුම් කෙරේ. සමස්ත දේශීය ඉතුරුම් තුළ රාජ්‍ය නිර්-ඉතුරුම් රුපියල් බිලියන

**2.15 සංඛ්‍යා සටහන** — **පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් දශ ලක්ෂ | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2007(අ) | 2008(ආ) | 2007(අ) | 2008(ආ) | 2007(අ) | 2008(ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 3,578,688 | 4,410,567 | 21.8 | 23.2 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 2,949,712 | 3,787,438 | 20.9 | 28.4 | 82.4 | 85.9 |
| පෞද්ගලික | 2,403,167 | 3,073,651 | 20.9 | 27.9 | 67.2 | 69.7 |
| රජය | 546,545 | 713,788 | 21.1 | 30.6 | 15.3 | 16.2 |
| 3. ආයෝජන | 1,000,320 | 1,214,808 | 21.7 | 21.4 | 28.0 | 27.5 |
| පෞද්ගලික | 807,417 | 928,779 | 14.8 | 15.0 | 22.6 | 21.1 |
| රජය | 192,903 | 286,029 | 61.9 | 48.3 | 5.4 | 6.5 |
| 4. දේශීය ඉතුරුම් | 628,976 | 623,128 | 26.1 | -0.9 | 17.6 | 14.1 |
| පෞද්ගලික | 686,683 | 711,579 | 20.7 | 3.6 | 19.2 | 16.1 |
| රජය | -57,707 | -88,451 | 17.7 | -53.3 | -1.6 | -2.0 |
| 5. දේශීය ඉතිරුම්-ආයෝජන පරතරය | -371,344 | -591,680 | -14.8 | -59.3 | -10.4 | -13.4 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -39,054 | -99,040 | 3.4 | -153.6 | -1.1 | -2.2 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 245,006 | 277,712 | 23.8 | 13.3 | 6.8 | 6.3 |
| 8. ජාතික ඉතුරුම් | 834,928 | 801,800 | 27.2 | -4.0 | 23.3 | 18.2 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

88 කින් පහත වැටුණු අතර පුද්ගලික අංශයේ ඉතුරුම් 2008 වසර තුළ රුපියල් බිලියන 712 දක්වා සියයට 3.6 කින් වර්ධනය විය.

**දේශීය ඉතුරුම්, විදේශීය ශුද්ධ සාධක ආදායම් සහ ශුද්ධ පෞද්ගලික සංක්‍රාමවල එකතුව ලෙස දැක්විය හැකි ජාතික ඉතුරුම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 4.0 කින් පහළ ගිය අතර, රුපියල් බිලියන 802 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** 2007 වසරේ සියයට 23.8 කින් වර්ධනය වූ ශුද්ධ පුද්ගලික සංක්‍රාම 2008 වසර තුළ සියයට 13.3 තරම් අඩු වර්ධන වේගයක් පෙන්නුම් කරමින් රු. බිලියන 278 මට්ටමක පැවතිණි. කෙසේ වුවද, විදේශීය අංශයේ පැවති අයහපත් ප්‍රවණතා මත 2008 විදේශීය ශුද්ධ සාධක ආදායම තවදුරටත් පිරිහෙමින් පැවතිණි. මෙම ප්‍රවණතාවල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතුරුම් දළ ජාතික නිෂ්පාදිතයට ප්‍රතිශතයක් ලෙස දක්වන අනුපාතය ඉකුත් වසරේ දී වූ සියයට 23.3 මට්ටමේ සිට 2008 වසරට අදාළව සියයට 18.2 දක්වා පහළ ගියේය.